
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ බිනර පුර පසළොස්වක පෝ ද 2021 සැප්තැම්බර් 20 සඳුදා BUDUSARANA MONDAY SEPTEMBER 20, 2021

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 56 වන කාණ්ඩය, 13 වන පත්‍රය, පිටු 26 ආරම්භය 1965 - 06 - 13



# මෙහෙණී සමාජයට දොරටු විවර වූ බිනර පෝදා



**ඇසළ මහේ සිට වප් මහ දක්වා වූ කාලය වස් සමය යි. මෙම කාලය තුළ භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ගේ නියමය පරිදි වස් සමාදන් ව විහාරස්ථානයන් හි නිබඳ ව වැඩ වෙසෙමින් ස්වකීය ශාසන පරමාර්ථයන් සපුරා ගනිති. එසේ ම ගිහි සැදැහැවතුන්ට ද අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කරමින් ඔවුන ගේ ද ශාසනික කටයුතු සපුරාලමින් ඔවුනුදු ආර්ය මාර්ගයට යොමු කරවති. මෙම වස් සමයේ අතරමැදි පොහොය සහ මධ්‍ය කාලය බිනර මහට අයත් ය.**

## ගෝතමී දේවිය ගේ ආයාචනය

සම්බුද්ධ ශාසනය තුළ භික්ෂුණී සමාජය ආරම්භවීම සිදු වූදිනය වන බැවින් බිනර මහේ උදාවන බිනර පොහොයට ශාසන ඉතිහාසය තුළ වඩාත් වැදගත් තැනක් හිමි වෙයි. බිනර පොහෝදා මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ගේ පැවිදිවීම සිදු වූ අතර එයම භික්ෂුණී සමාජයේ ආරම්භය විය. එසමයෙහි බුදුරදුන් වැඩ සිටියේ කිඹුල්වත් පුර නුවර නිග්‍රෝධාරාමයේ ය. එහි දී මහා ප්‍රජාපතී ගෝතමී දේවිය උන් වහන්සේ කරා එළඹ වැඳ එකත්පසෙක සිට කාන්තාවන්ට බුදු සසුන තුළ පැවිද්ද හා උපසම්පදාව ලබා දෙන ලෙසට තෙරවක් ම ආයාචනය කළා ය. එහි දී බුදුරදුන් දේශනා කළේ

"අලං ගෝතමී මා තෙ රුච්චා මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්ම විනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජිති"

යනුවෙනි.

"ගෞතමියනි, තථාගතයන් දැන හෙළි පෙහෙළි කළ සස්නෙහි ගිහි ගෙයින් නික්ම මාගමක්හු පැවිදි වනු ඔබට රිසි නො වේවා"

යනු එහි අර්ථය යි.

පැවිදිවීම පිළිබඳ කළ ඉල්ලීම සිදු කළ සැණින් ම බුදුරදුන් ඒ සඳහා අවසරය ලබා දුන්නේ නම් එම කාර්යයෙහි කිසිදු බැරෑරුම් බවක් පැවිදිවන කාන්තාවෝ නො දකිති. දුක සේ, අපහසුවෙන් එය ලබාගත් කල ශාසනික බ්‍රහ්ම චරියාව හොඳින් වටහාගෙන ඒ අනුව ජීවත්වීමට ඔවුහු වඩාත් උනන්දු වෙති. මේ ගැන සලකා භික්ෂුණී සමාජය පිහිටුවන ලෙස පළමුවර කළ ඉල්ලීම පිළිනොගැනීම බුදුරදුන් යෙදූ සම්‍යක් උපායක් බව පෙනේ.

## මනා සංවිධානයක්

විශාලා මහනුවර මහ වනයෙහි කූටාගාර ශාලා විහාරයෙහි බුදුරජාණන් වහන්සේ ඊළඟ වස් සමය වැඩ සිටිය හ. එහි දී ද මහා ප්‍රජාපතී ගෝතමී දේවිය කලින් රෝහිණී නදී තීරයේ දී බුදුරදුන් සමීපයේ පැවිදි වූ ශාක්‍ය – කෝලිය දෙරට කුමාරවරුන් පන්සියයක ගේ

> **පැවිදිවීම පිළිබඳ කළ ඉල්ලීම සිදු කළ සැණින් ම බුදුරදුන් ඒ සඳහා අවසරය ලබා දුන්නේ නම් එම කාර්යයෙහි කිසිදු බැරෑරුම් බවක් පැවිදිවන කාන්තාවෝ නො දකිති.**

භාර්යාවන් ද කැටුව කෙස් වැටි කපා හැර, කහ වස්ත්‍ර පොරවා, මැටි පාත්‍ර ගෙන දූක සේ සැතපුම් ගණනාවක් පයින් ම විශාලා මහනුවර වෙතපැමිණියහ. මෙම කාන්තා පිරිස පනස් එක් යොදුනක් ම පා ගමනින් පැමිණි බැවින් කූටාගාර ශාලා විහාරයට ළඟා වන විට ශරීරය දහදියෙන් තෙත් ව දූවිල්ලෙන් ගැවසී, දෙපා ඉදිමී දුර්වර්ණ වී පැවතිණි.

එබැවින් විහාරගෙය තුළට ඇතුලුවීමට තරම් හැකියාවක් නොමැති කාන්තා පිරිස කූටාගාර ශාලාවේ දොරටුව අබියස ශෝකීබර ව සිටියහ. මෙසේ දෙවැනි වරට පැවිදි වෙස් ගෙන මනා සංවිධානයක් ද ගොඩනගා ගෙන බුදුරදුන් වෙත පැමිණියේ ඔවුන් ගේ අරමුණ තවත් කල් නො ගෙන ඉටු කරවා ගැනීමේ පරමාර්ථයෙන් බව පහැදිලි ය.

## අෂ්ට ගරු ධර්ම

ඉක්බිතිව මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ආනන්ද හිමියන්ට කරුණු පවසා උන් වහන්සේ ගේ මාර්ගයෙන් කාන්තාවන්ට බුදු සසුන තුළ පැවිද්ද ලබා දෙන ලෙස ඉල්ලා සිටියා ය. ආනන්ද හිමියෝ බුදුරදුන් වෙත ගොස් සියලු තොරතුරු සැල කළහ. එහි දී ද බුදුරදුන් එම ඉල්ලීම තෙවරක් ම ප්‍රතික්ෂේප කළේ "ආනන්දයෙනි, කාන්තාවන් ගිහි ගෙයින් නික්ම තථාගත ශාසනයෙහි පැවිදිවීම නුඹට රිසි නො වේවා"යි වදාරමිනි. එහෙත් ආනන්ද හිමියන් ගේ බලවත් උනන්දුව මත මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ප්‍රමුඛ කාන්තා පිරිසට බුදුසසුනේ පැවිදිවීමට භාග්‍යය උදා වුණි. එහි දී බුදුරදුන් වදාළේ "අනඳයෙනි, මහා ප්‍රජාපතී ගෝතමී ගරු දහම් අටක් පිළිගන්නී නම් එය ම ඇය ගේ උපසම්පත්තිය වේවා" යන්න ය. මෙහි දී බුදුරදුන් වදාළ අෂ්ට ගරු ධර්ම මෙසේ ය.

1. උපසම්පදාවෙන් වසර සියයක් ගත වූ මෙහෙණියක විසින් වුව ද එදින උපසම්පදා වූ භික්ෂුවට වැඳීම, දැක හුනස්සෙන් නැගිටීම, දෙහොත් මුදුන් තබා නැමදීම ආදී ගරු බුහුමන්දිවි හිමියෙන් කළ යුතු ය.

2. භික්ෂුණීය භික්ෂූන් නොමැති ගමක වූ ආවාසයෙක වස් නො විසිය යුතු ය.

3. අඩ මසක් පාසා භික්ෂුණීය විසින් භික්ෂූන් වහන්සේගෙන් පොහොය විචාළ යුතු ය. අවවාද දීමට භික්ෂුවක ගේ පැමිණීම ද බලාපොරොත්තු විය යුතු ය.

4. වස් වසූ භික්ෂුණීය වස් අවසානයේ දී භික්ෂු, භික්ෂුණී යන දෙසඟ පිරිස් හි ම දුටු දෙයින්, ඇසූ දෙයින්, සැක කළ දෙයින් යන තුන් දෙයින් (දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා) පවාරණය කළ යුතු ය.

5. බර ඇවතකට පත් භික්ෂුණීය, භික්ෂු භික්ෂුණී උභතෝ සංඝයා ඉදිරියෙහි මානත් පිරිය යුතු ය.

6. දෙ අවුරුද්දක් ම උභතෝ සංඝයා වෙත හික්මෙන්නියක සිට උපසම්පදාව අපේක්ෂා කළ යුතු ය.

7. භික්ෂුණීය විසින් කවර කරුණක් නිසා හෝ භික්ෂුවකට ආක්‍රෝෂ පරිභව නො කළ යුතු ය.

8. භික්ෂුණීය විසින් භික්ෂුවකට මෙසේ සිතන්න, මේ දෙය කරන්න ආදී ලෙස අණ දෙන ආකාරයෙන් කතා බහ නො කළ යුතු අතර භික්ෂූන් ගේ අවවාද පිළිගත යුතු ය.


මෙසේ මෙම ගරු ධර්ම අට ආනන් ද හිමියන්ට විස්තර කර දුන් බුදුරජාණන් වහන්සේ "අනඳයෙනි, මහා ප්‍රජාපතී ගෝතමී මේ ගරු දහම් අට පිළිගනී නම්, එය ම ඇය ගේ උපසම්පදාව වන්නේ යැයි වදාළ හ. ආනන්ද හිමියෝ මහා ප්‍රජාපතී ගෝතමී දේවිය වෙත පැමිණ මෙය විස්තර කර දුන්හ. එය ඇසූ මහාප්‍රජාපතී ගෝතමී දේවිය අෂ්ට ගරු ධර්ම ජීවිතාන්තය දක්වා ම කඩ නො කොට ආරක්ෂා කරන බවට පොරොන්දු වූවා ය. ඉක්බිති ආනන්ද හිමියෝ බුදුරදුන් වෙත ගොස් මහා ප්‍රජාපතී ගෝතමී දේවිය අෂ්ටගරු ධර්ම පිළිගැනීමෙන් පැවිදි උපසම්පදාව ලැබූ බව ප්‍රකාශ කළහ.

## කල් තබා බැඳි නියර

පසුව බුදුරදුන් වදාළේ 'අනඳයෙනි, කාන්තාවන් ගිහි ගෙයින් නික්ම තථාගත ශාසනෙහි පැවිද්ද නො ලද නම්, මේ සසුන් බඹසර චිරස්ථිතික වන්නේ ය. මේ ශාසන සද්ධර්මය අවුරුදු දහසක් පිහිටියේ ය. යම් හෙයකින් කාන්තාවෝ ගිහි ගෙයින් නික්ම තථාගත ශාසනයෙහි පැවිදි වූවහු ද එබැවින් දැන් මේ සසුන චිරස්ථිතික නො වන්නේ ය. දැන් මේ සසුන චිරස්ථිතික නො වන්නේ ය. දැන් මෙතැන් සිට පන්සිය වසරක් ශාසන සද්ධර්මය පිහිටියේ ය. යන්න යි. බුදු සසුනෙහි කාන්තාවන් පැවිදිවීම සසුන චිරස්ථිතිකවීමට හේතු නො වන බව බුදුරදුන් ඉතා සරල උපමා දෙකක් මඟින් පැහැදිලි කළ ආකාරය ද චුල්ලවග්ග පාලියෙහි දැක්වෙයි.

සම්පූර්ණ වූ හැල් කෙතක වී බොල් වන රෝග විශේෂයක් හට ගැනීමටකට පළමුව එය උපමා කොට ඇති අතර උක් වත්තක ගස් තුළ කඳ රත් පැහැ ගන්වන රෝග විශේෂයක් හට ගැනීමකට දෙවනු එය උපමා කොට තිබේ. අෂ්ට ගරු ධර්ම පැනවීම පිළිබඳ බුදුරදුන් ගේ උපමාව වූයේ, මහ වැවක ජලය එයින් නික්ම පිටත ගැලීම වලක්වනු පිණිස කල්තබා ම නියරක් බඳනේ ද එසේ ම මා විසින් දිවිහිමියෙන් කඩ නොකළ යුතු ගරු ධර්ම අටක් කල්තබා ම භික්ෂුණීන්ට පනවන ලද බව යි.

භික්ෂුණී සමාජය ආරම්භ කරමින් බිනර පුර පසළොස්වක පොහොය දිනෙක මහාප්‍රජාපතී ගෝතමී දේවිය පැවිදි උපසම්පදාව ලැබුවේ මේ ආකාරයෙනි. පසුව අනෙක් කාන්තා පිරිස ද එතුමිය අනුව යමින් පැවිදි උපසම්පදාව ලැබූහ.



ඌරුගමුවේ
අස්සජි හිමි



# බුදු සිරිත කියවා බොදු සිරිත දැන ගනිමු

බිනර පුර පසළොස්වක පෝය

## දම් දෙසුම

**බුද්ධො සො භගවා බොධාය ධම්මං දෙසෙති. දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති. සන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති. තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති. පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙතී ති.**

පින්වත්නි,

අද බිනර පුර පසළොස්වක පොහෝ දිනය යි. මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු කුල කාන්තාවන් හට අෂ්ට ගරු ධර්ම පනවමින් සම්බුදු සසුනේ පැවිදි වීම අනුදැන වදාරන ලද්දේ අද වන් දිනක දී යි. බ්‍රාහ්මණ ඉගැන්වීම් හමුවේ අසරණ ව, පීඩාවට පත් කාන්තාවන්ට සමාජයේ නිසි තැන පිරිනැමුණේ මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු පිරිස ගේ පැවිද්දත් සමග භික්ෂුණී සමාජය ආරම්භ වීමත් සමග යි.

ධර්ම දේශනාවට මා මාතෘකා කළේ මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයේ මහා යමක වග්ගයේ එන චූල සච්චක සූත්‍රයේ අන්තර්ගත වන බුදුරජාණන් වහන්සේ ගේ බුද්ධ කෘත්‍යය සැකෙවින් වදාළ දහම් පාඨයක්. සතළිස් පස් වසරක බුදුරජාණන් වහන්සේ ගේ බුද්ධ කෘත්‍යය එම පාඨය තුළ මැනවින් සාරාංශ ගත කොට තිබෙනවා.

භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ චතුරාර්ය සත්‍යය අවබෝධ කොට අනුන් හට අවබෝධ කරවනු සඳහා දහම් දේශනා කොට වදාළා. තමන් වහන්සේ ඉන්ද්‍රිය දමනය කොට අනුන් ගේ ඉන්ද්‍රිය දමනය සඳහා මඟ පෙන්වීමට දහම් දේශනා කොට වදාළා. තමන් වහන්සේ කෙලෙසුන් සංසිඳුවා, අනුන් ගේ කෙලෙසුන් සන්සිඳවනු සඳහා දහම් දෙසුවා. තමන් වහන්සේ සසරින් එතෙර වී අනුන් සසර සයුරින් එතෙර කරවීමට මඟ පෙන්වූ වා. භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් සංසිඳුවා ගෙන අනුන් ගේ කෙලෙස් ගිනි නිවනු සඳහා දහම් දෙසුවා. මේ බුදුරජාණන් වහන්සේ ගේ පන්සාළිස් වසරක බුද්ධ කෘත්‍යය සැකෙවින් දක්වා ඇති ආකාරය යි.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් ව පරාර්ථ චර්යාවට යොමු වූ වා. පළමු ව තම ඒකායන අරමුණ වූ බුද්ධත්වය සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරමින් ස්ථිර අධිෂ්ඨානයෙන් යුතු ව කටයුතු කිරීම සුවිශේෂී යි. 'වායමේතෙව පුරිසො යාව අත්ථස්ස නිප්පදා' යනුවෙන් කියන පරිදි නිසි ප්‍රතිඵල ලැබෙන තුරු උත්සාහය අත් නොහළ යුතු යි. ඇස් ඉස් මස් ලේ නහර වියළී ගියත් බුදු වී මිස නොනැඟිටිමි යි යන චතුරංග සමන්නාගත වීර්යයෙන් යුතු ව බුදුරජාණන් වහන්සේ ජය ශ්‍රී මහ බෝධි මූලයේ දී බුද්ධත්වය සාක්ෂාත් කළා. උන්වහන්සේට පැමිණි කරදර, බාධක අපමණ යි. අභියෝග අපමණ යි. ඒ ත් උන්වහන්සේ තම අරමුණ කරා ගමන් කළා. ඒ, ආදර්ශය අපට කියන්නේ ජීවිතයේ කවර අභියෝග පැමිණියත් අරමුණු ඉටු වන තුරු පසු නොබා කටයුතු කරන්නට යි.

> සමහර දරුවන්ට අම්මා, තාත්තා නෑ. ඉගෙන ගන්න මිල මුදල් නෑ. හොඳ පොත පත නෑ. එහෙමයි කියලා සියල්ල අත් හැර දමනවා නම්, අනාගතය ජය ගන්නේ කොහොම ද? දුක ජය ගත්තේ නැති නම් අනාගතයත් දුකක් තමයි.

ඉගෙන ගන්නා දරුවෙක් වුවත් මේ බුදු සිරිත කියවනවා නම් සිතට මොන කරදර ආවත් පසු නොබා ඉදිරියට යන්නට පෙළ ඹවීමක් ඇති වෙනවා. සමහර දරුවන්ට අම්මා, තාත්තා නැ. ඉගෙන ගන්න මිල මුදල් නැ. හොඳ පොත පත නැ. එහෙමයි කියලා සියල්ල අත් හැර දමනවා නම්, අනාගතය ජය ගන්නේ කොහොම ද? දුක ජය ගත්තේ නැති නම් අනාගතයත් දුකක් තමයි. ඒ නිසා උත්සාහවත් වන්න ඕනැ.

බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලැබ තුන් ලෝ වාසීන් සසරින් එතෙර කරවීම පිණිස ඇප කැප වුණා. ගම් නියම්ගම් සිසාරා ධර්ම චාරිකාවේ යෙදෙමින් තම ශ්‍රාවකයන් වහන්සේලා ද ධර්ම චාරිකාවෙහි යොදවමින් අන්‍යයන් ගේ යහපත හා අභිවෘද්ධිය වෙනුවෙන් ඇප කැප වුණා.

දවසේ කාලය කොටස් පහකට බෙදා ගෙන නියමිත කාලසටහනකට අනුව ක්‍රියා කිරීමත් බුදුරදුන් ගේ සුවිශේෂී ගුණාංගයක්. පෙරබත් කාලය, පසුබත් කාලය, පෙරයම් කාලය, මැදියම් කාලය සහ පැසුළුයම් කාලය වශයෙන් දවසේ එක් එක් කොටස් බෙදා වෙන් කොට ගනිමින් එක් එක් පිරිස් වෙනුවෙන් ධර්ම දේශනා කිරීම සඳහා කාලය බෙදා දක්වා තිබුණා.

රාජ රාජ මහාමාත්‍යවරු, බමුණන්, සිටුවරු, ගෘහපතීන් මෙන්ම සුළු සේවකාදීන් ද බුදුරජාණන් වහන්සේ ගේ පිළිසරණ ලැබුවා. දිනපතා මහා කරුණාවෙන් ලෝකය බලා එම දිනයේ පිහිට විය යුතු පුද්ගලයන් හඳුනා ගෙන ඒ අය වෙත වැඩම කිරීම බුදුරජාණන් වහන්සේ ගේ ස්වභාවය යි. මිනිසුන් පමණක් නොව දිව්‍ය බ්‍රාහ්මණාදීන්ට, යක්ෂ සහ තිරිසන් සතුන්ට ද බුදුරදුන් කාරුණික වූ වා. මේ ආදර්ශය මොනතරම් වටිනවා ද?


බුදු රජාණන් වහන්සේ සරණ ගිය අප ඒ ආදර්ශය මොන තරම් දුරට සිතට ගෙන තිබෙනවා ද? මිනිසුන් වෙනුවෙන් අප, අපේ යුතුකම් කරනවා ද?

බුද්ධත්වයෙන් නව වැනි මස දුරුතු පුර පසළොස්වක් පොහෝ දින බුදුරජාණන් වහන්සේ ස්වකීය ප්‍රථම විදේශ ධර්මදූත මෙහෙවර ලෙස මහියංගනයට වැඩම කොට වදාළේ ද, යක්ෂ ගෝත්‍රිකයන් දෙපිරිසක් අතර වූ ආරවුලක් සංසිඳුවා ලීම පිණිස යි. සුමන සමන් දෙවි රජු සත් රියන් උසැති මියුගුණු දාගැබ් වහන්සේ ඉදි කළේ බුදුරජාණන් වහන්සේ පිරිනැමූ කේශධාතූන් වහන්සේ නිධන් කිරීමෙනුයි.

බුදුරජාණන් වහන්සේ ගිලන් ව අසරණ වූවන් වෙත ගොස් උපස්ථාන කොට සිත් පහදවනු පිණිස ධර්ම දේශනා කොට වදාළා. ගිලනුන්ට උපස්ථාන කිරීමේ ආනිශංස බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ තමන් වහන්සේ ද ගිලානෝපස්ථානයෙහි යෙදෙමින්. බුදුරදුන් යහපත් ලෙස පෙන්වා දුන් ගිලානෝපස්ථානයෙහි යෙදීම බුදුරජාණන් වහන්සේ ගේ අවවාද මැනවින් පිළිගැනීමක් වනවා.

තම ශ්‍රාවක සංඝයා වහන්සේ ගේ මනා වූ පැවැත්ම වෙනුවෙන් විනය නීති පැනවීම තුළින් බුදුරජාණන් වහන්සේ අපේක්ෂා කළේ ද සංඝ සමාජයේ මනා පැවැත්ම යි. හික්මීම සඳහා අනුබල ලබා දීම යි. තම ශ්‍රාවකයන් ගේ දක්ෂතා අගය කරමින් අගසව් තනතුරු සහ එක් එක් හිමියන් ගේ දක්ෂතා සහ පුණ්‍ය මහිමය සලකමින් අග තනතුරු පිරිනැමීම, සුදුස්සන්ට සුදුසු තැන දීමයි. දක්ෂතා ඇති අය අගය කිරීමයි . බුදු මඟ යන පිරිස් ලෙස අප කළ යුතු මෙම උතුම් ගුණාංග අපේ දිවියට ගළපා ගැනීම යි.

'තුම්හේහි කිච්චං ආතප්පං – අක්ඛාතාරෝ තථාගතා' යන බුදු වදනට අනුව බුදුවරයෝ අක්ඛාතාරයෝ ය. එනම් මඟ පෙන්වන්නෝ යි. නිසි මඟ හඳුනාගෙන ගමන් කිරීම ශ්‍රාවකයා ගේ කාර්යය යි. බුද්ධෝත්පාද කාලයක, මිනිසත් බවක් ලබා උපත ලද සැවොම ඉන් නිසි පල ලබන්නට නම්, සාමකාමී මාවතකට එළඹිය යුතු යි. බුදු සිරිතෙන් ලබා ගත හැකි ආදර්ශ තම ජීවිතයටත් උකහා ගැනීමට උත්සාහ කරමින් නිසි මඟට එළඹ තම දිවි මඟ සඵල කොට ගැනීමට මේ උතුම් පෝ දා අදිටන් කර ගනිමු.



ඓතිහාසික මහියංගන රාජ මහා විහාරාධිපති,
අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝසභික,
උපාධ්‍යාය ධුරන්ධර, පණ්ඩිත,
**උරුලෑවත්තේ ධම්මසිද්ධි ශ්‍රී අත්ථදස්සි ධම්මරක්ඛිත නාහිමි**

# නිහඬ බව පරිසර හිතකාමී බොදු පිළිවෙතක්



අස්ගිරිමහාවිහාරයෙහි උපාධ්‍යාය,
කාරක සංඝසභික
වයඹ පළාතේ ප්‍රධාන සංඝ නායක
මහාචාර්ය

**තුඹුල්ලේ සීලක්ඛන්ධ නා හිමි**

අද දවසේ අපට දකින්නට අහන්නට ලැබෙන සුලභ වචනයක් තමා "දූෂණ" කියන එක. ඒ දූෂණ බොහොමයක් මුදල්, දේපළ වැනි කරුණුවලට අදාළ වන දූෂණ යි. ඒ අතර තවත් වර්ගයක දූෂණ රැසක් තිබෙනවා. ඒ අනුව අප දකින ප්‍රධාන දූෂණයක් තමා ශබ්ද දූෂණය. ඒ කියන්නේ අපට කනෙන් ඇසෙන විවිධ ශබ්ද තරංග නිසා අප ජීවත් වන අපේ පරිසරයට ඇති කරන අහිතකර බලපෑම. ඒකට අපි කියනවා ශබ්ද දූෂණය කියලා. විවිධ හේතු නිසා ශබ්දය දූෂණය වෙනවා. ඉතින් ශබ්ද දූෂණය වන්නට හේතු වන කාරණා විවිධ යි. කාර්මිකකරණය නිසා, ජන බහුලත්වය නිසා, වාහන නිසා, කර්මාන්තශාලා නිසා, විනෝදකාමී ක්‍රියා නිසා, තරගකාරී ක්‍රියා නිසා, මහජන ඒකරාශිවීම් නිසා ආදි වශයෙන් මෙයට විවිධ හේතු තිබෙනවා. බොහෝ දියුණු රටවල පරිසරයට ශබ්ද නිසා ඇති අහිතකර බලපෑම් ඉවත ලීමේ අරමුණ ඇති ව විවිධ අණපනත් රේගුලාසි පනවා තිබෙනවා. ඒ නීති රීති උල්ලංඝණය විම නිසා එවැනි අයට එරෙහි ව අධිකරණ ක්‍රියා මාර්ග පවා ගැනීමට බලය තිබෙනවා. ලංකාවේ පවා එවැනි කාරණා සම්බන්ධ ව අධිකරණ ක්‍රියා මාර්ග රැගෙන තිබෙනවා.

ඉතින් මේ අප විසින් ප්‍රකාශ කරන ශබ්ද දූෂණයට ප්‍රධාන හේතුව වශයෙන් අවධාරණය කරන්නේ මිනිසා ගේ කටෙන් පිටවන වචන නිසා ඇති කරන අහිතකර බලපෑම හා ඊට විසඳුම් සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා දුන් මාර්ගය කුමක්දැ කියා පැහැදිලි කරන්නට යි.

උන්වහන්සේ ගේ දේශනාවට අනුව මිනිසා හැමවිට ම ක්‍රියා කළ යුතු වන්නේ තමන්ට ත්, තමන්ගෙන් බාහිර සමාජයේ අනෙකුත් පුද්ගලයන්ට ත් කිසිදු හානියක්, අලාභයක්, අසාධාරණයක් නො වන

ආකාරයෙනුයි. යම් අයෙක් එසේ ක්‍රියා කරනවා නම්, එතැන පවතින්නේ බෞද්ධ ආචාරධර්මවලට අනුව සිදු වන පැවැත්මක්. බුදුදහමේ ඉගැන්වෙන හැටියට එය කුසලයක්. හොඳ ක්‍රියාවක්. ඉතින්, අපේ කයෙන් පිට කරන වචනය ත් අප යොදා ගන්නට ඕන කරන්නේ එයින් තමන්ට ත්, අනුන්ට ත් යහපතක් වන ආකාරයට යි. අපේ මේ

කටහඬ හෙවත් වචනය කීප ආකාරයකින් පාවිච්චි වෙනවා. එහි හොඳ පැත්තට වඩා වැඩියෙන් ම පාවිච්චි වෙන්නේ නරක පැත්තට යි. ඒනිසා සතියෙන් යුතු ව අපේ කට, අප විසින් හසුරුවා ගත යුතු වෙනවා.

වචනයෙන් වෙන අයහපත් පැත්ත බුදුදහමට අනුව වර්ග කොට ප්‍රකාශ වෙනවා බොරුකීම, කේලාම්කීම, රළුගොරෝසු පරුෂ වචන කීම හා හිස් වචන කීම යන විදිහට. මේවා වචනයෙන් සිදුවන අකුසල් ලෙසත් බුදුදහමෙන් අපට පැහැදිලි කරනවා. මේ කියන හතරට විරුද්ධ හතර වන්නේ, ඒ හතරෙන් වැළකී සිටීම යි. එසේ වන්න නම් ඒ වචනය බොහොම පරිස්සමට භාවිත කරන්න ඕන. පරිස්සමට පාවිච්චි කරනවා කියන එකේ අදහස වන්නේ සිහිය පිහටුවා වචන කථා කිරීම යි. දැන් අප සිතා බැලුවොත් ගතවන දවසේ අපි වැඩි හරියක් ම භාවිත කරලා තිබෙන්නේ මේ කියන වචන හතරෙන් සමන්විත වචන සමූහය ක්. එසේ නම් අප කළ යුතු

වන්නේ කුමක් ද? ඒකට දෙන්නට පුළුවන් හොඳ ම උත්තරය තමා වචනය නිවැරැදි ව පාවිච්චි කරන්නට නො හැකි හැම අවස්ථාවක ම නිශ්ශබ්දතාව රැක ගෙන ක්‍රියා කිරීම. අප ජීවත් වන සමාජයේ ඇතැම් කෙනෙක් ඉන්නවා නිතර ම දෙඩමලු වෙනවා. ඉවරයක් නැතිව මොනව මොනව හරි කියනවා. බුදුදහමේ ඉගැන්වෙන හැටියට නම් ඒවා කිසිවක් වැඩකට නැති සම්පප්ප්‍රලාප කියලා කියන්නට පුළුවනි. එවැනි

උදවිය කියන දේ බාහිර උදවිය ගණන් ගන්නෙත් නැහැ. තවත් සමහර උදවිය ඉන්නවා. ඒ අය යමක් කතා කරන්නේ බොහොම කලාතුරකින්. හැබැයි එවැනි අය යමක් ප්‍රකාශ කරන හැමවිට ම අනෙකුත් උදවිය ඒ ගැන වඩාත් විමසිලිමත් ව එම ප්‍රකාශ කළ දේ පිළිබඳ විමසිලිමත් වෙනවා.

> තවත් සමහර උදවිය ඉන්නවා. ඒ අය යමක් කතා කරන්නේ බොහොම කලාතුරකින්. හැබැයි එවැනි අය යමක් ප්‍රකාශ කරන හැමවිට ම අනෙකුත් උදවිය ඒ ගැන වඩාත් විමසිලිමත් ව එම ප්‍රකාශ කළ දේ පිළිබඳ විමසිලිමත් වෙනවා.



අපේ බුදුරජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල පැහැදිලි කරලා දීලා තිබෙනවා, ආර්ය නිශ්ශබ්දතාව කියලා අදහසක් ගැන.

ඉතින් ඒ ආර්ය නිශ්ශබ්දතාව පවතින්නේ ආර්ය මාර්ගයන් අවබෝධ කරගත් උතුමන් වෙත යි. එහෙම වුණ ත් කවදා නමුත් මේ සසර ගමන අවසන් කර සදාකාලික විමුක්තිය වන නිවන අවබෝධ කර ගැනීම තමා බෞද්ධයා ගේ එකම අරමුණ. ඉතින් මේ ආර්ය මාර්ගය අවබෝධ කර ගැනිම එකම ඉලක්කය කර ගත් අප විසින් එම ආර්ය නිශ්ශබ්දතාව පිළිබඳ ධෛර්යවන්ත අදහක් ඇති කරගෙන ඒ සඳහා උනන්දුවෙන් කටයුතු කිරිම තුළින් වචනය නිසා ඇති වන දූෂණය අපට අවම කර ගැනීමේ ශක්තිය තිබෙනවා. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා.මිනිසා කියන සත්වයා පමණක් නො ව, තිරිසන් ගත සතා සිවුපාවා පවා සාමූහිකව යි ජීවත් වන්නේ. ඒ අතර මිනිසා තමා උසස්. ඒ වගේ ම උපතින් උරුම වෙච්ච තම පැවැත්ම උසස් තත්වයකට ගෙන ඒමට විවිධ උපක්‍රම භාවිත කරමින් දැනුමෙන් තේරුමෙන් පමණක් නොව කල්‍යාණ මිත්‍ර සේවනයෙන්, සද්ධම්ම ශ්‍රවණයෙන්,

ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් හා යෝනිසො මනසිකාරයෙන් යුක්ත ව ක්‍රියා කිරීමෙන් මේ සසර ජීවිතය කෙළවර කර ගැනිමට හැකි උසස් ම ගණයේ සත්වයා බවට පත් ව තිබෙන්නේ.

ඉතින් බුදුහාමුදුරුවෝ ප්‍රකාශ කරනවා එවැනි උසස් මනසක් ඇති සසර සැරිසරන සත්වයකු වශයෙන් උතුම් මිනිස් බවයක් උරුම කර ගත් අප විසින් එකිනෙකා හමුවන, සුහද හමුවීම් පවත්වන, රැස්වන හැම අවස්ථාවක ම දැහැමි කථාවෙන් කල් යවන්නට අවශ්‍යයි, කියන මේ කාරණය.


ඒ වගේ ම දැහැමි කතාබහෙන් තොරව සිටින හැමවිට සෝවාන් ආදි මගඵල පසක් කළ උතුමන් විසින් ධ්‍යානාදි හෝ සමාපත්තියකට සමවැදී ක්‍රියා කළ යුතුයි. ඉතින් කොහොම වුණ ත් අද දවසේ ජීවත් වන අප විසින් තේරුම් ගත යුත්තේ වැරැදි කිසිදු කතාබහකට ඉඩ නො තබා නිහඬ ව සිටිම ඉතාමත් සුභදායක වන බව යි.

මේ වචනය පිළිබඳ ව එක්වරක් බුදුරජාණන් වහවන්සේ ප්‍රකාශ කළේ "පුරිසස්ස හි ජාතස්ස කුඨාරි ජායතෙ මුඛෙ" අප කටෙන් කරන එක් ප්‍රධාන ක්‍රියාවක් වන්නේ සිතෙහි සිතිවිලි මඟින් ගොණු කර ගන්නා වචන පිටකිරීම යි. මේ වචනයේ ශක්තිය හොඳ නරක දෙපැත්තට ම එක විදියට සමාන යි. බරපතල යි. ඕනම දරුණු කෙනෙක් දමනය කරලා නිවැරැදි මඟට ගන්නේ වචනයෙන්. ඕනෑම මිනිස් ඝාතනයක් දක්වා වන දරුණු අපරාධ බොහොමයකට මුල් වන්නේ ත් වචනය වැරැදි විදියට පාවිච්චි කිරීමෙන් වගේ ම තවත් අයෙක් වැරැදි විදිහට වචනය තේරුම් ගැනීමෙන්. මේ නිසා මිනිසා මෙලොව උපදින්නේ තම මුවෙහි, එහෙම නැත්නම් කටේ කෙටේරියක් ඇතිව යි කියා බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙනවා. කෙටේරිය කියන්නේ දෙපැත්තට කැපෙන තියුණු ආයුධයක්. ඉතින් ඒ කෙටේරියක් කටේ තියෙනවා කියන්නේ තමන් ගේ කටත් කැපෙනවා වගේ ම එය උදව් කරගෙන අනුන් විනාශ මුඛයට ලක් කරන්නත් හැකියාවක් තිබෙනවා කියන එක යි. ඉතින් අප තේරුම් ගන්නට අවශ්‍යයි, මේ කට දෙපැත්ත කැපෙන තියුණු ආයුධයක් වගේ බොහෝ යහපතට මෙන් ම අනර්ථයට යොමු වන්නට ත් ඉඩ තිබෙන්නට පුළුවන්.

25 පිටුවට...

# සමාජයට යහපත් දෙයක් ලබා දී තමන් ගේ යුතුකම ඉටු කරන්න

**සසර දුක නිමාකොට විමුක්තිය සාක්ෂාත් කිරීම බුදුසමයේ මූලික ඉගැන්වීම යි. එය එසේ වුව ද සසර දුකින් නිදහස් වීම නම් ඉතා කඨිනමින් කළ හැකි දෙයක් නොවේ. ඒ සඳහා දීර්ඝකාලීන පුහුණුවක් අවශ්‍ය වේ. මේ නිසා සසර දුකින් නිදහස් වීමට අමතර ව සසර සැපවත් කර ගන්නා ආකාරය ද බුදුදහමින් පෙන්වා දෙයි.**



කොළඹ විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රාජකීය පණ්ඩිත ආචාර්ය
**උඩුහාවර ආනන්ද හිමි**

සංසාරික ජීවිතය මෙලොව හා පරලොව වශයෙන් සැපවත් කර ගැනීමට ආධාර කර ගත හැකි පුහුණු කළ යුතු ආචාර ධර්ම පද්ධතියක් බුද්ධ දේශනාවල ඇතුළත් ව තිබේ. ඒවා ප්‍රගුණ කරන්නකුට මෙලොව මෙන් ම, පරලොව ජීවිතයත් අර්ථවත් හා සුන්දර එකක් බවට පත්කර ගත හැකි ය. සිඟාලෝවාද සූත්‍රයෙහි ඇතුළත් සතර සංග්‍රහ වස්තු ඒ සඳහා අනුගමනය කළ හැකි සාරධර්ම පද්ධතියකි. පුද්ගලයා ගේ මෙන් ම සමාජයේත් යහපත හා දියුණුව ඇතිකර ගැනීම ඒවා ප්‍රගුණ කිරීමේ මූලික අරමුණ වේ. දානය හෙවත් පරිත්‍යාගය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව හෙවත් සමාජයට මඟ පෙන්වීම හෝ සමාජයට හිතකර කාර්යයක නිරතවීම, සමානාත්මතාව හෙවත් සැමට එක හා සමාන ව සැලකීම යන සිව්වැදෑරුම් ප්‍රතිපත්ති පුද්ගලයා ගේ මෙන් ම සමාජයේත් දියුණුව හා සංවර්ධනය පිණිස හේතු වන, සමාජය ඒකාබද්ධ කෙරෙන ප්‍රතිපත්ති සමූහයකි.

මෙම සිව්වැදෑරුම් ප්‍රතිපත්ති සමාජය නැමති රෝදයෙහි කඩ ඇණය ලෙස නම් කර තිබේ. රථයකට සවිකර ඇති රෝදය එයින් ඉවත්ව යා නොදී ඒ හා බද්ධ ව පැවතීම සඳහා කඩ ඇණය අවශ්‍ය වේ. එය නොමැති විට රෝදය ඉදිරියට නොයයි. නැතහොත් රථයෙන් ඉවත් ව ගැලවී යයි. එවිට රථයේ ගමන නතරවී රථය ද, රථයේ ගමන් කරන්නා ද අනතුරට භාජනය වෙයි. රථයක රෝදය මෙන් සමාජය ඉදිරියට ගමන් කරවන බලවේගය සතර සංග්‍රහ වස්තුවයි. සමාජයක ඉදිරි පැවැත්ම තීරණය වන්නේ සතර සංග්‍රහවස්තුවෙන් ඔවුනොවුන් සංග්‍රහ කෙරෙන තාක් පමණි. සතර සංග්‍රහ වස්තු යටතේ දැක්වෙන කරුණු බොහෝ දෙනකුට අමුතුවෙන් පැහැදිලි කළ යුතු ද නොවේ. සැමදෙනා විසින් ම අනුගමනය කළ යුතු මෙම ප්‍රතිපත්ති හතර අතුරෙන් තුන්වන සංග්‍රහ වස්තුව වන අර්ථචර්යාවෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද යන්න පැහැදිලි කිරීම මෙම ලිපියේ අරමුණ යි.

සිව් සඟරාවත් අතුරින් අර්ථචරියා යනුවෙන් අදහස් වන්නේ අන්‍යයන් ගේ යහපත වෙනුවෙන් ක්‍රියාත්මක වීමයි. නැතහොත් සමාජයට හිත පිණිස පවතින ඵලදායි ක්‍රියාවක නිරත වීමයි. එය විවිධ අයුරින් සිදු කළ හැකි ය. සතර සංග්‍රහවස්තු යටතේ එන දානයෙන් අදහස් වන්නේ භෞතික වශයෙන් යමක් බෙදා ගැනීම යි. එහෙත් තුන්වන සංග්‍රහ වස්තුවෙන් අදහස් කෙරෙන්නේ බුද්ධිමය හා චර්යාමය වශයෙන් කෙරෙන දායකත්වය යි. මේ යටතේ කෙනකුට තමා සතු දැනුම හා අවබෝධය අන්‍යයන්ට ලබාදීමෙන් ඔවුන් දැනුවත් කළ හැකි ය. ඒ යටතේ මෙසේ කළ යුතු ය, මෙසේ නොකළ යුතු ය ආදි වශයෙන් කෙනකු ගේ යහපත උදෙසා කෙරෙන මඟ පෙන්වීම් අර්ථ චර්යාවෙන් අපේක්ෂා කෙරේ.

එසේ ම සමාජයට හිතකර කාර්යයක නිරත වීමෙන් තවත් අයුරකින් අර්ථචර්යාවෙන් සංග්‍රහ කළ හැකි ය. නව නිපැයුම් කරන්නකුට තම නිපැයුම් සමාජයට හඳුන්වා දීමෙන් සමාජ ජීවිතය පහසු එකක් බවට පත්කළ හැකි ය. එසේත් නොමැති නම් ලෝකයට හිත පිණිස පවතින කවර හෝ ඵලදායි ක්‍රියාවක නිරත වෙමින් ලෝකයට සේවයක් සැලසිය හැකි ය. සමාජ සුභ සාධනය උදෙසා ස්වේච්ඡාවෙන් ක්‍රියා කිරීමත් අර්ථචර්යාවට අයත් වූවකි. ධනය වෙනුවට තම ශ්‍රමය අන්‍යයන් ගේ යහපත උදෙසා කැප කළ හැකි ය. ධනය ඇති අයකුට එය වැය කොට සමාජයට සේවයක් වන පරිදි ක්‍රියා කළ හැකි ය. පොදු ජනයා ගේ සුභ සිද්ධිය උදෙසා කළ හැකි එබඳු කටයුතු බොහෝ ය.

සිව් සඟරාවට අයත් අර්ථචර්යාවෙන් අදහස් වන්නේ අන්‍යයන් ගේ පෙළඹවීමකින් තොරව සමාජ සේවය සඳහා කැපවීම ය. එය සදාචාර ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කරනු මිස වෙනත් පටු පරමාර්ථවලින් කිළිටි නොවිය යුතු ය. මෙම සදාචාර ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ පුද්ගලයා ගේ පටු ආත්මාර්ථකාමී පුහුදුන් ගති පාලනය කිරීම යි. ඒ වෙනුවට කරුණාව හා මෛත්‍රිය ප්‍රගුණ කරවීම යි.

අන්‍යයන් ගේ යහපත උදෙසා වන සමාජ සේවය ක්‍රියාත්මක විය යුත්තේ එම යහපත් අරමුණු පෙරදැරි කර ගෙන ය.

මව්පියන් ගේ මෙන් ම ගුරුවරයා ගේ අර්ථචර්යාව නම් දරුවන්ට යහමඟ පෙන්වීම මෙන් ම දැනුම ලබාදීමයි. භික්ෂුව ගේ අර්ථචර්යාව වන්නේ ශ්‍රද්ධාව නැති තැනැත්තා ශ්‍රද්ධාවෙහි පිහිටුවීමත්, දුශ්ශීල පුද්ගලයා ශීලයෙහි පිහිටුවීමත්, මසුරු පුද්ගලයා ත්‍යාගයෙහි පිහිටුවීමත් ප්‍රඥාව නොමැති පුද්ගලයාට ප්‍රඥා සම්පත්තියෙහි පිහිටුවීමත් ය. පාලකයා ගේ අර්ථචර්යාව වන්නේ පුරවැසියා ගේ යහපත වෙනුවෙන් කටයුතු සම්පාදනය කිරීමයි. ආයතන ප්‍රධානියා ගේ අර්ථචර්යාව වන්නේ ආයතනයේ සේවය කරන පිරිසට හා ආයතනයෙන් සේවය ලබා ගන්නා පිරිස ගේ සුභසිද්ධිය උදෙසා නිවැරදි අයුරින් ආයතනය පවත්වා ගෙන යාම යි. වෛද්‍යවරයා ගේ අර්ථචර්යාව වන්නේ රෝගියා සුවපත් කිරීම සඳහා කටයුතු කිරීම යි. ඒ සඳහා රෝගියා දැනුවත් කිරීම යි. මේ අනුව සැම අයකුට ම සමාජය වෙනුවෙන් ඉටු කළ යුතු යහපත් කාර්ය භාරයක් පවතී. එය මැනවින් ඉටු කිරීම අර්ථචර්යාව ලෙස අර්ථකථනය කළ හැකි ය.

සැම අයෙක් ම තමා ගේ පැවැත්ම මූලික කරගෙන වුව සමාජය වෙනුවෙන් සිදු කරන්නේ අර්ථචර්යාවකි. ගුරුවරයකුට ඔහු ගේ හෝ ඇය ගේ සේවය වෙනුවෙන් වැටුපක් ගෙවනු ලැබේ. වැටුප් ලබා ගැනීමේ අරමුණින් වුව ගුරුවරයා සිදු කරන්නේ ශිෂ්‍යයා ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම යි. එමගින් ශිෂ්‍යයාට යහපතක් සිදු වේ. ඒ අනුව ගුරුවරයා තම වගකීම හා සේවය නොපිරිහෙළා ඉටු කරන්නේ නම්, ඔහු ගේ හෝ ඇය ගේ සමාජ වගකීම සම්පූර්ණ වේ. උපදේශකයා ගේ කාර්යය වන්නේ ඔහු අභියසට එන විවිධ ගැටලු සහිත පුද්ගලයන්ට එම ගැටලු විසඳ ගැනීමට අවශ්‍ය නිවැරදි උපදෙස් හා මඟ පෙන්වීම යි. සමාජයේ පැවැත්ම සඳහා ඔවුනොවුන් ගේ උපකාරය හා මඟ පෙන්වීම අත්‍යවශ්‍ය වේ. එය විවිධ අයුරින් සිදු කළ හැකි ය. අර්ථචර්යාව යටතේ ජනමාධ්‍ය වෙත පැවරෙන වගකීම විශාල ය. විවිධ දෑ සම්බන්ධයෙන් සමාජය දැනුවත් කරන අතර ම ජනතාවට හිතකර වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන් අර්ථ චර්යාවෙන් සංග්‍රහ කිරීම සිදු වේ.

එහෙත් එය එසේ ම සිදු නොවන බව කරුණු සහිත ව අවබෝධ කර ගත හැකි වේ. විනෝදය සැපයීම පමණක් ම කේන්ද්‍රීය අරමුණ කර ගත් වැඩසටහන් මගින් සමාජයට ඵලදායි යමක් වේ ද යන්න සැක සහිත ය. ඇතැම් විටෙක ආගමික හා වාර්ගික ගැටුම් ඇති කෙරෙන ප්‍රකාශන හා වැඩසටහන් සමාජ සාමයට බාධාවක් වේ. නව දැනුම සැපයීම හා සමාජයට නිවැරදි මඟ පෙන්වීමක් ලබාදීම ජනමාධ්‍ය වෙත පැවරෙන වගකීම වේ. එය මැනවින් ඉටු කිරීම ජනමාධ්‍ය හා බැඳුණු අර්ථචර්යාව සම්පූර්ණ කිරීමක් වේ. පාලකයා ගේ අර්ථචර්යාව විය යුත්තේ පුරවැසියන් ගේ සුභසිද්ධිය උදෙසා අර්ථවත් සැලසුම් හා යෝජනා ක්‍රියාත්මක කිරීම යි. පුරවැසියා ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කරදීමත් පාලකයා ගේ අර්ථ චර්යාවට අයත් කාර්යයකි. රාජ්‍ය දේපළ අපහරණය මෙන් ම අවභාවිතයෙන් තොර ව ඒ සියල්ල පුරවැසියා ගේ අභිවෘද්ධිය වෙනුවෙන් යොමු කිරීම පාලකයා ගේ අර්ථචර්යාවට අයත් තවත් විශේෂ වගකීමකි. පාලකයකු රට වැසියාට කළ යුතු සංග්‍රහය නම්, එම රට තුළ ආර්ථික, සාමාජීක, සංස්කෘතික වශයෙන් පුනර්ජීවනයක් ඇති කිරීම යි. කලා කරුවා ගේ අර්ථ චර්යාව නම්, ජනතාව ගේ දැනුම හා අකල්ප දියුණු වන ආකාරයේ නිර්මාණ ඉදිරිපත් කිරීම යි. මේ අනුව සතර සංග්‍රහ වස්තු යටතේ එන අර්ථචර්යාව ඒ ඒ පුද්ගලයා සතු භූමිකාව හා වගකීම අනුව වෙනස් වේ. අවසාන වශයෙන් අර්ථ චර්යාවෙන් අර්ථවත් වන්නේ සමාජයට යහපත පිණිස පවතින කිසියම් කාර්යයක නිරත වීමයි. එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. සැම අයෙක් ම තමන්ට අදාළ භූමිකාව යටතේ ලෝකයට හා සමාජයට යහපත පිණිස පවතින ඵලදායි ක්‍රියාවක නිරත වීම සමාජයට කෙරෙන උසස් ම සංග්‍රහය වේ. ඔවුනොවුන් එකිනෙකා සමාජය වෙනුවෙන් කැපවී සමාජ සේවයේ නිරත වීමෙන් සමාජයක ඉදිරි පැවැත්ම තීරණය වේ.



# අශ්වයා පැන යන්නට පෙර
# ඉස්තාලය වසා දමන්න

**දරුවන් ගේ හෙට දවස සුරක්ෂිත වනවා දැකීම හැම අම්මා, තාත්තා කෙනක් ම හදවතින් ම ප්‍රාර්ථනා කරනවා. එහෙත් අවාසනාවකට එය එලෙසින් ම ඉටු වන්නේ නෑ. වරද දරුවන් ගේ ම නම් නොවේ. බහ තෝරන වයසේ සිට ම දරුවන්ට හොඳ නරක හොඳින් තේරෙන තුරු ඔවුන් පසු පස නොසිටීම යි.**



ප්‍රංශයේ ජේතවනාරාමාධිපති
ප්‍රංශයේ ප්‍රධාන අධිකරණ සංඝනායක
**මුරුංගාගස්යායේ ඤාණිස්සර නා හිමි**

තමන්ට ම රැස් කර ගන්නට දිවා රෑ වෙහෙසෙන බොහෝ පුද්ගලයන් බලා සිටින්නේ දරුවෙක් හෝ බිල්ලට දී තම අරමුණට යන්නට යි. දරුවා කාගේ ද, මේ ජීවිතයක් නේ ද යන වගක් ඔවුන්ට අදාළ නෑ. දරුවන් රැක ගන්නට නම් මිනිසුන් ගැන ඉගෙන ගන්නට ම ඕනෑ. නරක මිනිසුන්ගෙන් තමන් ගේ දරුවන් ආරක්ෂා කර ගන්නට ඕනෑ. අපේ දරුවෝ බොහෝ දෙනෙක් ජීවිතය විනාශ කර ගන්නේ මත්ද්‍රව්‍ය නිසයි. ඇබ්බැහි වන්නේ එහි බරපතළකම ගැන දන්නේ නැති නිසයි. ඒ නිසා පුංචි කාලයේ සිටම දරුවන්ට මේ ගැන කියලා දීම වැදගත්. දරුවන්ට කියලා දෙන්නට නම්, අම්මා තාත්තා ඒ ගැන මුලින් ම දැනුම්වත් වී සිටී ම වැදගත්. අශ්වයා පැන යන්නට පෙර ඉස්තාලය වසා නොදැමුවොත් නැවත ඒ අශ්වයා අල්ලා ගැනීම නම් පහසු වන්නේ නෑ. අපේ දරුවොත් ඒ වගෙයි. නොමඟ ගියොත් හරි මඟට ගන්න බොහෝ දුක් මහන්සි වන්නට වෙනවා.

## ඇත්තට ම මේ මත්ද්‍රව්‍ය කියන්නේ මොනවා ද?

ලෝකයේ මත්ද්‍රව්‍යවලට තිබෙන්නේ ඈත ඉතිහාසයක්. ඉන්දු නිම්න, හොවැංහෝ වගේ ශිෂ්ටාචාර යුගයේ ජීවත් වූ මිනිසුන් සුරා පානය වගේ මත්වන දියර පානය කළ බවට සාක්ෂි තිබෙනවා. අද වන විට එය පානය කිරීමේ ස්වභාවයෙන් පමණක් නොවෙයි, පෙති, කුඩු වශයෙන් ද ආඝ්‍රහණය කිරීමට හා ශරීරයට එන්නත් කර ගැනීමේ ස්වභාවයෙන් ද ව්‍යාප්ත ව පවතිනවා. අබිං, කංසා, හෙරොයින්, මර්ජුවානා හා හසීස් වගේ නම්වලින් හඳුන්වන මත්ද්‍රව්‍ය වගේ ම එක් වරක් පාවිච්චි කළ පමණින් ගලවාගත නොහැකි ලෙස ඇබ්බැහිවන, නම ඇසූ පමණින් සලිත වන මාරක මත්ද්‍රව්‍යයන් ද ලොව පුරා වේගයෙන් සංසරණය වෙමින් පවතිනවා.

## යක්ෂයා ගේ හුස්ම

ඒ අතරින් ලොව ඉතාම භයානක මත්ද්‍රව්‍යයක් ලෙස සැලකෙන 'ස්කොපොලැමින් බුරුන්ඩැන්ගා' හෙවත්,යක්ෂයා ගේ හුස්ම ලෙස හඳුන්වන මත්ද්‍රව්‍යය සුළු ප්‍රමාණයක් ශරීර ගත වීමෙන් සිතීමේ හැකියාව අඩපණ වන අතර මතක ශක්තිය සම්පූර්ණයෙන් ම නැත වී යනවා. වැඩි මාත්‍රාවක් ගත හොත් ජීවිතය පවා නැතිවී යන ප්‍රබල මත් කාරකයක් . මෙම භයානක මත්ද්‍රව්‍ය නිපදවන්නේ ඉක්වදෝරය, කොළෙ ාම්බියාව හා වෙනිසියුලාව වගේ රටවල වැවෙන පැළෑටියකින්.

'කීටමින්' නමින් හඳුන්වන අශ්වයින් සන්සුන් කිරීම සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍යයක් නූතනයේ මත්ද්‍රව්‍යයක් ලෙස ද භාවිත කෙරෙනවා. එය කෙටිකාලීන වේදනා නාශකයක් ලෙස භාවිතා වුව ත් එහි ඇබ්බැහිවීමට ලක්වූවකුට මනඃකල්පිත රූප

පෙනීම,ශරීරය අප්‍රාණික වීම, ස්වසන පද්ධතිය අඩපණවීම හා සියදිවි නසා ගැනීමට තරම් මානසික ව්‍යාකූලතාවයක් නිර්මාණය කිරීම ද සිදු වෙනවා.

'ක්‍රිස්ටල් මෙත්' කියන මාරාන්තික මත්ද්‍රව්‍යය ද ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත වෙමින් තිබෙනවා.

මෙම මත්ද්‍රව්‍යය ශරීරගත වූ සැණින් හිතේ සතුටක් හා ප්‍රබෝධයක් වැනි හැඟීමක් ඇතිවනවා. එහෙත් වැඩි කල් නොගොස් ශරීරය ම විරූපී වෙලා මොළ යට දැඩි හානි ගෙන දෙමින් මරණය ළඟා



කර දෙනවා. හෙරොයින් මත් ද්‍රව්‍යට ඇබ්බැහිවූ අයට මූලික අතුරු ආබාධ ලෙස විදුරුමස්

ඉදිමීම, දහඩිය දැමීම, නින්ද නොයෑම, ප්‍රතිශක්තීකරණ පද්ධතිය දුර්වලවීම, මාංශ පේෂී දුර්වලවීම, රුධිර නාලිකාවලට හානි කරවීම හා ශරීර කොටස් කුණුවීම ඇතිවෙනවා.

මෙම මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ ශ්‍රී ලාංකිකයන් ගේ ප්‍රමාණය 50,000 ට අධික බව පර්යේෂණ මගින් හෙළි වී තිබෙනවා. ඒ විතරත් නොවෙයි, ඔවුන් අවුරුදු 18–30 අතර වයස් කාණ්ඩවලට අයත් බව ද ජාතික අන්තරායක ඖෂධ පාලක මණ්ඩලය පෙන්වා දෙනවා.

මීට අමතර ව ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මත්ද්‍රව්‍යයක් ලෙස අබිං

හා ගංජා හැඳින්විය හැකියි. පෘතුගීසීන් විසින් මෙරටට හඳුන්වා දුන් අබිං කෑම පසු කාලයේදී බලපත්‍ර සහිත වෙළඳමක් ලෙස ද සම්මතවුණා.1829දී ඉංග්‍රීසි

ආණ්ඩුකාරවරයා විසින් වතුකරයේ ද්‍රවිඩ ජනතාව සඳහා අබිං ගෙන්වීම හා වගා කරවීම ද සිදුකරනු ලැබුවා. මෙම පෙළඹවීම පසුකාලීන ව විශාල සමාජ ගැටලුවක් වුණා. 1867 අංක 19 දරන අබිං සහ කංසා ආඥපනත පැනවීමට එකල බ්‍රිතාන්‍ය ආණ්ඩුවට සිදුවුණේ මේ නිසයි. නූතන ලෝකයේ බොහෝ රටවලට මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් නිසා විසඳ ගත

නොහැකි ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවී තිබෙනවා. ඒ අතරින් සමාජයේ යහ පැවැත්මට ඇතිවන අහිතකර බලපෑම සුළුපටු නෑ. මතට ඇබ්බැහි වූ අය ත් මේ සමාජයේ ම එක් කොටසක් වන නිසා ඔවුන් ගේ ක්‍රියාකලාපය සමස්ත සමාජයේ ම ආර්ථික, සංස්කෘතික, ආගමික, දේශපාලනික හා අධ්‍යාපනික ආදී අංශවලට ප්‍රබල බලපෑමක් සිදුකරනවා.බොහෝ පුද්ගලයන් කෙටි කාලීන සැපය, සොම්නස් බව සඳහා මත් ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවීමට පෙළඹී තිබෙනවා. එහෙත් දිගුකාලීන ව ඇබ්බැහිවීම තුළ ඇත්තේ වේදනාව දුක පමණ යි. එසේ වේදනාව දුක අත්විඳින විට ඔවුන් ඇබ්බැහිවීමේ කෙළවරට ම ඇවිත්.

## හැඟීම් දැනීම්වලට වෙන දෙය

සමහර අයට මත්ද්‍රව්‍ය භාවිත කරන මොහොතේ දී කිසිදු හැඟීමක් ඇති වන්නේ නෑ. එය යම් ආකාරයකට හිරිවැටීමක්. වින්දනයක් නොමැති අවස්ථාවක්. ඇතැම් අය මෙම ස්වභාවයට ද කැමැතියි. වේදනීය අංශයේ අහිතකර ප්‍රතිඵල වශයෙන් පුද්ගල ශාරීරික මානසික හා සාමාජික අංශවලට ද ප්‍රබල ලෙස බලපෑම් සිදුකරනු ලබනවා. නිදිබර ගතිය, ඇස්වලින් කඳුළු ගැලීම, නාඩි වේගය වැඩිවීම, ඔක්කාරය, ඇස් රතුවීම, වේගයෙන් හුස්ම ගැනීම, පේශිවල ඇතිවන වෙනස්කම්, අධිකව ඇතිවන හිසරුදාව, ශරීර ගැස්ම, කෝකේන් හා නිකොටින් භාවිතය නිසා මධ්‍ය ස්නායු පද්ධතියට බලපෑම් කිරීමෙන් ලේ ගමනාගමනය අවහිරතා ඇති කිරීම, හුස්ම ගැනීමේ අපහසුතා ඇති කිරීම ආදිය සිදු වෙනවා.

අබිං භාවිතය නිසා මතක ශක්තිය අඩුවීම, ආහාර රුචිය අඩුවීයාම මෙන් ම මර්ජුවානා මගින් පුද්ගල සන්තානය කෙරෙහි බලපෑම් ඇතිකරනවා. එපමණක් නොවෙයි, මධ්‍යසාර මගින් මොළයේ සංයුතිය හා ක්‍රියාකාරිත්වයට අහිතකර බලපෑම් ඇති කරන අතර ම, ගංජා මගින් ද මොළයේ ශෛල විනාශ කිරීම සිදු කරනවා.

## නැති දේ ඇති ලෙස දැකීම

මානසික වශයෙන් ද මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන්ට මුහුණ දෙන්නට සිදුවන අන්තරායන් බොහෝ යි. බොහෝවිට මතට ඇබ්බැහිවූවන් පවසන්නේ භාවිතය මගින් තමන්ට මානසික වින්දනයක්, නිදහස් බවක් මෙන් ම සහනයක් ද ලැබෙන බැවින් එය සිදුකරන බවයි. එය මිත්‍යාවක්. බොහෝ පුද්ගලයන් මතට ඇබ්බැහිවී සිටින්නේ මායා හා භ්‍රාන්ති යන ලක්ෂණයන් නිසයි. මායාවන් කියන්නේ පවතින දේ වෙනස් වී පෙනෙන්නට පටන් ගැනීම යි. භ්‍රාන්ති කියන්නේ ලෝකයේ නැති දේ, පවතින දේ ලෙස පෙනීමට පටන් ගැනීම යි. එබැවින් මතට ඇබ්බැහිවූ අය සිහින ලෝකවල සැරිසරමින් භ්‍රාන්ති හා මායාවන් මත සිටිමින් කෙටි කාලීන සුවයකට පුරුදු වී සිටිනවා.

එය මානසික රැවටීමක් පමණයි. එ මගින් පුද්ගලයාට මානසික ව සිදුවන හානිය අතිවිශාල යි. මතකය හීනවීම, අවධානය පිළිබඳ ගැටලු ඇතිවීම, බුද්ධිය හා පෞරුෂත්වය පිළිබඳ ගැටලු,

ප්‍රජනන ගැටලු ඇතිවීම, තීරණ ගැනීමේ ගැටලු, නිර්මාණ චින්තනය පිළිබඳ ගැටලු, ආත්ම විශ්වාසය පිළිබඳ ගැටලු ආදිය ඒ අතරින් ප්‍රධාන වෙනවා. මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූවන් නිසා සාමාජික වශයෙන් සිදුවන බලපෑම ද අතිවිශාල යි.

පවුලේ සමගිය බිඳ වැටීම හා පවුල් ගැටුම් ඇතිවීම, සියදිවි නසා ගැනීම ,අධික ණය බර, දික්කසාදය, ලිංගික

බෙලහීනතාවය, වෘත්තීය ගැටලු ඇතිවීම, සමාජයෙන් කොන්වීම, හුදකලාවීම, දෛනික ජීවන රටාව අක්‍රමවත්වීම, අඹුදරුවන්ගෙන් ඈත්වීම ආදී ගැටලු රාශියක් ඇතිවීමට හේතු වෙනවා.

23 පිටුවට...



# අතීතය ලියා අනාගතයට පාඩම් කියා දෙන අභිලේඛන සාහිත්‍යය

**පසුගිය නිකිණි පුර පසළොස්වක පෝ දා ලිපියෙන් අපි ඔබට අභිලේඛන උරුමය පිළිබඳ හැඳින්වීමක් කළෙමු. මෙම උරුමය විමසා බලද්දී ශ්‍රී ලංකාවේ අතීත සමාජය පිළිබඳ හමුවන විශ්වසනීය තොරතුරු රාශියකි.**

එක්තරා යුගයක සමාජය විමසන සමාජ විද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස ද අභිලේඛන හැඳෑරීමට ගත හැකි ය. විශේෂයෙන් පැරැණි ලක්දිව පැවති විවිධ සමාජ සංවිධාන පිළිබඳවත්, සමාජ මෙහෙය වූ විවිධ බලවේග මෙන් ම, සමාජ සිරිත් විරිත් පිළිබඳවත් වටිනා කරුණු රාශියක් විමසීම මෙහි දී සිදු කෙරෙයි. පැරණි පුරාවිද්‍යාත්මක කැණීම් රාශියක් අනාවරණය කළ වැදගත් කරුණක් වන්නේ ලංකාවේ ඉපැරැණි රෝහල් සම්බන්ධ තොරතුරු ය. රෝහල් පිළිබඳ තොරතුරු අභිලේඛනයන් හි දැක්වේ. දහ වැනි සියවසට අයත් කිරිබත් වෙහෙර ටැම් ලිපිය පෙන්වා දෙන්නේ රෝහලේ නඩත්තුව සඳහා ඉඩකඩම් පවරා දී තිබූ බවයි. එමෙන් ම 'වෙද්හල්', 'බෙහෙත් ගේ', 'මහවෙද්නා', 'සුළු වෙද්නා', 'වෙද්හල් සම්දරුවන්', 'වෙද්හල් කැමියන්', 'වෙද්හල් දසුන්' වැනි වෛද්‍ය වෘත්තියට අදාළ ස්ථාන සහ තනතුරු නාම රාශියක් ම බොහෝ අභිලේඛනවල හමු වීමෙන් පෙනෙන්නේ පැරැණි සමාජයේ සෞඛ්‍ය සම්පන්න බව කෙරෙහි සමාජයේ පැවති ආකල්පය යි.

ජලය හා බැඳුණු සංස්කෘතියක් පැවති අයුරු බොහෝ අභිලේඛන පෙන්වා දෙන කරුණකි. දිඹුලාගල සමීපයෙන් සොයා ගත් මෝලාහිටියවෙලේගල ගිරි ලිපියෙන් අනාවරණය කරන්නේ "සොවණ කොතුරු නියතෙ" යනුවෙන් ස්වර්ණ වූ කෙණ්ඩියකින් ජලය වත් කොට විහාර නඩත්තුව පිණිස ඇළක් භික්ෂූන්ට පූජා කළ බවයි. මෙම සම්ප්‍රදාය වත්මන තුළ අපට දැකිය හැකි වන්නේ දේපළක් විහාරාරාම සන්තක ව පූජා කිරීමේ දී මෙම ක්‍රමය අනුගමනය කිරීමෙනි. එහි දී ජලය හුවමාරු සංකේතයක් ලෙස පිළිගැනේ. අනුරපුර පෙරුම්යම්කුලම් ගිරි ලිපියෙහි දැක්වෙන්නේ 'දකපති' සහ 'මජිබක' යනුවෙන් රජුට හිමි ජල බද්ද සහ මාළු බද්ද භාවනා ගෘහයක් ප්‍රතිසංස්කරණය සඳහා විහාර සන්තක කළ බවයි. ජලය සංස්කෘතික මෙන් ම ආර්ථික සම්පතක් වූ අයුරු එයින් පෙනෙයි.

ලංකාවේ එවකට අපරාධ අවම කරලීම සඳහා රජවරුන් දැඩි දඬුවම් පනවා තිබුණු අයුරු අභිලේඛන පෙන්වා දෙයි. වේවැල්කැටිය පුවරු ලිපිය මෙයට ඉතා වැදගත් ම නිදසුන වෙයි. එල්ලා මැරීම, අත් පා කැපීම, හංවඩු ගැසීම, රත් කළ යකඩ පාවහන් පැළඳවීම, දඩ ගැසීම හා පිටුවහල් කිරීම වැනි දඬුවම් නියම කර තිබුණි. මෙහි දී මිනීමැරීමේ වරදට මරණ දඬුවම පනවා ඇතත් එය තීරණය කළ යුත්තේ දසගම් ප්‍රධානීන් එකතු වී සාකච්ඡා කොට නඩුව විචාරා සියලු තොරතුරු ලියා තැබීමෙන් පසුව ය. රාජ නියෝගයකින් මරණ දඬුවම ක්‍රියාත්මක නොවූ බව එයින් පෙනේ.

සොරකමට දඬුවම නඩුව අසා නියම කරවා අයිතිකරුට අයත් කොට දී සොරු එම ගමින් නෙරපා හැරීම යි. මේ නිසා අපරාධකරුවන්ට සැඟවී සිටීමට නොහැකි විය.

මිනී මැරීමට අනුබල දීම මිනීමැරීම තරම් බරපතළ වරදක් සේ පිළිගැනුණි. ඔහුට රත්‍රං කලං පනහක් දඩ ගැසිය යුතු වූ අතර එය ගෙවිය නොහැකි වූ විට ගෙය රාජසන්තක කිරීමට හෝ අත් කපා දැමීමට හෝ නියෝග කර තිබුණි. ගවයා පැරැණි යුගයේ වටිනා ම ආර්ථික සම්පතක් සේ පිළිගැනුණු අතර, ගවයා මැරීම මරණ දඬුවම ලැබීමට තරම් වරදක් ලෙස වේවැල්කැටිය ලිපියෙහි නියෝග කර තිබෙයි. ගවයින් සොරකම් කරන්නන් අල්වා කිසිල්ලේ හංවඩු ගැසීමට නියෝග කර

> **ගවයා පැරැණි යුගයේ වටිනා ම ආර්ථික සම්පතක් සේ පිළිගැනුණු අතර, ගවයා මැරීම මරණ දඬුවම ලැබීමට තරම් වරදක් ලෙස වේවැල්කැටිය ලිපියෙහි නියෝග කර තිබෙයි. ගවයින් සොරකම් කරන්නන් අල්වා කිසිල්ලේ හංවඩු ගැසීමට නියෝග කර තිබීමෙන් පෙනෙන්නේ ගව සම්පත ආරක්ෂා කර ගැනීම කෙරෙහි තිබූ රාජ්‍ය මැදිහත් බවයි.**

තිබීමෙන් පෙනෙන්නේ ගව සම්පත ආරක්ෂා කර ගැනීම කෙරෙහි තිබූ රාජ්‍ය මැදිහත් බවයි. මෙම නීති උල්ලංඝනය කළ වුන් අල්වා රත් කළ යකඩ පාවහන් පැළඳවීමට නියම කර තිබීමෙන් පෙනෙන්නේ නීතියේ තිබූ දැඩි බවයි. නීතිය ලිහිල් ව ගිය සමාජයක සාමකාමී සහජීවනය අපේක්ෂා කළ නොහැකි බවට පැරැන්නන් තුළ පැවති විශ්වාසයේ අගය වර්තමානය හා සමග සසඳ බලද්දී අපට පෙනෙයි.

පෝෂණීය ආහාර වේලක තොරතුරු තෝනිගල ගිරි ලිපියෙන් පෙනෙයි. මෙයට අනුව වී, උඳු, මුං, කව්පි, තල ආදිය ප්‍රධාන නිෂ්පාදිතයන් වූ අතර ජනතාව ගේ ප්‍රධාන ආහාර වේල බවට මේවා පත්විය. මෙයට අමතර ව දීකිරි, මීපැණි, කැවිලි වර්ග, පැනි, දුන්තෙල් හා පලා වර්ග ද, බුලත් ද ආහාර වේලෙහි අංග විය. සෞඛ්‍ය සම්පන්න පෝෂණීය ආහාර වේලකට අවශ්‍ය දෑ මෙහි අන්තර්ගත ය.

දහ වැනි සියවස පමණ වන විට පොහොය දිනය ලංකාවේ නිවාඩු දිනයක් ව පැවති බවට බදුලු ටැම් ලිපිය අනාවරණය කරයි. පෝදා වෙළඳම් කරන්නකු වෙතින් තෙල් බද්දක් දඩය වශයෙන් නියම කර ඇති අතර, එම තෙල් වැය කොට මහියංගණ විහාර භූමියෙහි පහන් දැල්වීමට නියම කර තිබුණි. දඬුවම නියම කෙරුණේ නැවත එවන් වැරැද්දක් නොවන ලෙස ආගමික පසුබිමක ගත කිරීමට ය. තිඹිරිවැව ලිපියට අනුව රාජ කාර්යයන් සඳහා දින නියම කර තිබූ අතර පෝ දිනයෙහි කිසිදු රාජකාරියක් නියම කර නොතිබුණි. මේ අනුව පෙනෙන්නේ ආගමික කටයුතු සඳහා පොහොය දිනය වෙන් ව තිබූ බවයි.

අල්ලස් ගැනීම දහ වන සියවස වන විට මුළුමනින් ම තහනම් කර තිබුණි. බදුලු ටැම් ලිපියෙහි දැක්වෙන්නේ 'ගමට ආ රදෙලන් රහමස් දී ගිතෙල් නොගන්නා ඉසා' යනුවෙනි. එයින් කියවෙන්නේ රාජ්‍ය නිලධාරීන් ගම්වලට වැද රා මස් ආදිය අල්ලසට දී ගිතෙල් ලබා නොගත යුතු බව ය. හතර වන මිහිඳු රජු පැනවූ මිහින්තලා පුවරු ලිපියෙහි ද දැක්වෙන්නේ විහාර රාජකාරී වෙනුවෙන් ලබන වැටුප්වලට අමතරව වෙනත් කිසිවක් නොලද යුතු බව යි. අල්ලස් ගැනීමට එරෙහි ව පැරැණි සමාජයේ පැවති තහංචි රාශියක් අභිලේඛන රාශියක ම දැක්වෙයි.

ලොව ඉතා සාධාරණ වෙළඳ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවේ පැවති බවට තොරතුරු හෙළි කරන්නේ ද බදුලු ටැම් ලිපියයි. පාරිභෝගිකයා මෙන් ම නිෂ්පාදකයා ද ආරක්ෂා වන පරිදි එහි පැනවීම් රාශියක් කර තිබෙයි. මෙයින් පාරිභෝගිකයා කෙතරම් ආරක්ෂා කර තිබේ ද යන්න පෙන්වා දෙන්නේ බුලත්, පුවක් වැනි ක්ෂණික ආහාර ආවරණයකින් තොරව විකිණීම තහනම් කර ඇති බැවිණි. නූතන වෙළඳ සමාජ හා සංසන්දනය කිරීමේ දී මෙවන් වෙළඳ ප්‍රතිපත්ති අතීත සමාජය කොතෙක් සෞඛ්‍ය සම්පන්න කළා ද යන්න පෙන්වයි.

එමෙන් ම සාධාරණ කිරුම් මිනුම් ක්‍රම එකල භාවිත කිරීමට නියෝග කිරීමෙන් පාරිභෝගිකයා සුරක්ෂිත කෙරිණි. 'ගණ ලහස්සෙන් මිසැ සෙසු ලහසියෙන් නොමනනු' යන නියෝගය තුළ පෙන්නේ සම්මත ලාසුවෙන් ම ධාන්‍ය මැනිය යුතු බවයි. හොර තරාදි, හොර පඩි භාවිතය වැළැක්ම සඳහා ඒවා සීල් තැබීමේ ක්‍රමයක් ද පැවතුණි. භාණ්ඩ විකිණීමට සුදුසු ස්ථාන නියෝග කර තිබීමෙන් නුසුදුසු ස්ථානවල වෙළඳමෙන් පාරිභෝගිකයාට වන අනර්ථය වළකා තිබෙයි. නූතන වෙළඳ සමාජය මෙම අතීතයෙන් පාඩම් උගත යුතු ව තිබෙයි.

මෙසේ මෙම ඓතිහාසික මූලාශ්‍ර පරීක්ෂා කිරීමේ දී ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ රසබර තොරතුරු රාශියකින් ම අප දැනුවත් කෙරෙයි. මේවා මතාන්තර යයි කිසිවකුටත් බැහැර කළ හැකි ද? ක්‍රමවත් පරිපාලනයක් හා සමාජ රටාවක් එකල සකස් ව පැවති බවට මොන තරම් සාක්ෂ්‍ය අභිලේඛන සාහිත්‍යය අපට අනාවරණය කරයි ද?



කොළඹ විශ්වවිද්‍යාලයේ
සිංහල අධ්‍යයන අංශයේ
මහාචාර්ය
**අගලකඩ සිරිසුමන හිමි**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## බිනර පුර පසළොස්වක 2021.09.20

# දැහැමි දිවි පෙවෙතකට වීර්යය වඩමු

සම්බුද්ධ ශාසනයේ මෙහෙණි සසුන් දෙර විවිර වූ උතුම් බිනර පුර පසළොස්වක පොහෝ දිනය අදයි. ලෝ වැසි බොදු කාන්තාවන්ට සේ ම හෙළ බොදු කාන්තාවට ද මේ සුවිශේෂී දිනයකි. එදා බුදුරජාණන් වහන්සේ අභියස බුද්ධ මාතා තොමෝ උතුම් පැවිදි බව ඉල්ලා සිටියේ මුළු මහත් කාන්තා පරපුර ම වෙනුවෙනි. කාන්තා පැවිද්දේ බාරදූර බව නිසා ම ඒ ඉල්ලීම සාක්ෂාත් කර ගන්නට බුද්ධ මාතාවන්ට බොහෝ වෙහෙසෙන්නට සිදු විය. එහෙත් එතුමිය උත්සාහය අත් නොහළා ය. කුල කාන්තාවන් සමඟ කහවත් පොරවාගෙන යොදුන් ගණන් දුර පා ගමනින් ගෙවා දමමින් තථාගතයන් වහන්සේ අභියසට පැමිණියේ කවර බාධක මධ්‍යයේ වුව ද උතුම් පැවිදි බව ලැබීමේ අරමුණෙන් ම ය. අවසානයේ මහා ප්‍රජාපතී ගෝතමී බුද්ධ මාතාව රහත් තෙරණින් වහන්සේ නමක් බවට පත්වන්නේ අත් නොහළ උත්සාහය හා කැපවීම නිසා ය. මේ උතුම් පෝදා

ඒ අසිරිමත් සිදුවීම සිහිපත් කරමින් විශේෂයෙන් බොදු කාන්තාව තමන් ගේ චරිතයට ද ඒ සුවිශේෂී ගුණ ආදර්ශයක් කර ගන්නට අධිෂ්ඨානයක් ඇති කර ගත යුතු ය.

ජීවිතයේ අපමණ වගකීම් නිසා සියලු කාන්තාවන්ට ගිහි ගෙය අතහැර යා නොහැකි බව සත්‍ය ය. එහෙත් ධර්මයට අනුව ජීවිත් වන්නට ඇයට කිසිදු බාධාවක් නැත. ඊට අවශ්‍ය උත්සාහය යි. දියණියක, සොයුරියක, මවක, මිත්තණියක ආදී ලෙස කාන්තාවකට ජීවිතයේ විවිධ චරිතයන්ට ජීවය දෙන්නට සිදු වේ. එහි දී ඉතා වැදගත් ම වන්නේ මවක ගේ භූමිකාව යි. අනෙකුත් චරිත නො වැදගත් යැයි මෙහි දී කිසිසේත් අවධාරණය වන්නේ නැත. ලොවක අනාගතය තීරණය වන්නේ මවක සතු යුතුකම් හා වගකීම් නිසියාකාර ව ඉටු වන්නේ නම් පමණක් ම ය. මවක් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සිව් බඹ විහරණ ගුණයන්ගෙන් පූර්ණ වූ තරමට ය යහපත් දරුවෙක් නිර්මාණය කළ හැකි වන්නේ. යහපත් දරුවන් සමාජගත වන පමණට ය සමාජය යහපත් වන්නේ.

ජීවත් වන වටපිටාව, ආර්ථිකය, පවුල තුළ හා සමාජම ය පිළිගැනීම ආදී විවිධ හේතු සාධක නිසා මවක ගේ සිතිවිලි අයහපත් විය හැකි ය. වෛරය, ද්වේෂය, ලෝභය, ඊර්ෂ්‍යාව ආදී අපිරිසුදු සිතිවිලි නිසා ඇය ගේ හැසිරීම් අයහපත් විය හැකි ය. එවැනි තත්වයක් තුළ ඇය ගේ චරිතය අර්ථවත් වන්නේ නැත. බෞද්ධ කාන්තාවන් ලෙස අප එම තත්වයට වැටිය යුතු නැත. අපට ගමන් කරන්නට අපූර්ව දහම් මාවතක් ඇත. ඒ මඟ ඉගෙන ගන්නට ඕනෑ තරම් මාර්ග ද ඇත. අවශ්‍ය කරන්නේ ධාර්මික ජීවිතයකට හැඩ ගැසීමේ වුවමනාව හා උත්සාහය පමණි.

අයහපත් ලෙස ජීවත් වුවහොත් එය තමන් ගේ මෙලොව ජීවිතයට සුබ දායී වන්නේ නැත. මරණින් මතු උරුම වන්නේ ද දුගතිය ම ය. ධර්මයෙහි හැසිරෙන පුද්ගලයා ධර්මය විසින් ම ආරක්ෂා කරන බව ය දහමෙහි සඳහන් වන්නේ. අවිනිශ්චිත ජීවිතයේ දැහැමි දිවි පෙවෙත නිසා ලබන්නා වූ ආශීර්වාදය කාන්තාවකට ඉතා වැදගත් ය. අප නිරතුරු උත්සාහ කළ යුතු කවර බාධක පැමිණිය ද දහමට අනුව ම ජීවත් වන්නට ය. එවිට කාන්තාවක ලෙස කවර චරිතයක් නියෝජනය කළ ද, තමා ද සුවඳවත් චරිතයක් වී, සමාජය ද සුගන්ධවත් කිරීමට හැකි වනු ඇත.



# Binara Full Moon Poya day Message

**Binara Full Moon Poya day is the third full moon poya day in the rainy retreat season (Was Kalaya).**

During the rainy retreat season venerable monks mostly spend their valuable time to develop their morality, concentration and wisdom whilst lay followers gather merits by taking care of those monks and learning the Dhamma , dedicating their time to practice the Dhamma preached by the Buddha . Most of the monks dedicate their time during rainy retreat for the caseation of definements. During this period they get the chance to be away from normal chaos and practice the Noble Path taught by the Buddha.

Have you ever given a thought as to how many rainy retreats you have passed in this life? Have you achieved a satisfactory result in the Noble Path? Up to which spiritual stage you have reached in the Noble Path of Dhamma. When think in these lines , it is a must requirement to develop seven factors of enlightenment (Saptha Bodhi Anga) in order to reach higher spiritual results. The concentration of the said seven factors of enlightenment is the utmost important step one should take in reaching at least the sovan hood.

The following Dhammapada stanza helps and guides us to reach the aforesaid targets in life.

"Kichcho manussa patilabo : Kichchang Machchana Jeewitham

Kichcham Saddhamma Sawanam: Kichcho Buddhanam Uppado"

It is explained by the Buddha that "Being born as a human is difficult , Having a good life is also difficult , getting the opportunity to listen to Dhamma preached by the Buddha is rare and the birth of a Buddha is extremely rare"

Thus , we must realize that being a human and having a good life is a very rare and a very valuable thing. The Buddha has explained that the Samsarik journey is filled with sorrow and pain and it does not easily reflect the end. Out of all the births one had been born, mostly they were born in the four types of hell. Therefore, it is apparent that the rare human life should be made very useful. Our normal life style evolves around Education, Family Life, Occupation, Services etc. whilst having a disciplined life. However, the absolute truth of life as per the principles based on Dhamma it is very much different to the aforesaid accepted normal life style. The Buddha preached that everything is based on the theory of cause and effect. When the cause ceases the effect ceases together with such initial cessation. In other words everything that has the nature of arising, inherits the nature of passing away. It is explained in the Dhamma , that everything or every living being inherits the three signs of existence (Thilakkhana ) namely Impermanency (Anicca),Unsatisfactory (Dukkha) and Selflessness( Anatta).



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

> ‘Have you ever given a thought as to how many rainy retreats you have passed in this life? Have you achieved a satisfactory result in the Noble Path? Up to which spiritual stage you have reached in the Noble Path of Dhamma.’

The constant practice of the reality of life, as explained in the aforesaid manner will help one's mind to be nonattached (viraga) to the materialistic world. This higher state of mind will help to achieve the utmost result of caseation of all the definements, being enlightened.

On this Binara full moon poya day may you be determined to walk the Noble path shown and proven by the Buddha to attain the supreme bliss of Nirvana.

අවිදු අඳුර දුරලනු වස් දහම් ප්‍රදීපය දල්වා ලූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තරම් දෙව් මිනිසුන්ගේ ආදරය හා ගෞරවය දිනා ගත් අන් කිසිවෙක් ලොව නැත. දයා බවින් හා මෙත් කරුණාවෙන් ආද්‍රත හදවතක් ඇතිව සව් සතුනට යහපත සැලසූ ඒ ධර්ම රාජයාණෝ මානව වංශයේ යහපැවැත්ම හා විමුක්තිය උදෙසා මුළු ජීවිතය ම කැප කළහ. අපමණ සත්වගකට නිවන් අමාවේ රස පොවා කිසිදා නොවියකෙන කිත් පැසසුම් ගුණ ඝෝෂා ඇති ව සංසාර ගිරි දුර්ගය තරණය කළ මහා වීරයාණෝ වූ හ.

පුහුදුන් මිනිසා ප්‍රභුත්වය, ප්‍රධානත්වය, ගෞරවය, ලාභ සත්කාර හා කීර්තිය ලැබීමට ඉඳුරා ම කැමැති වේ. එහෙත් ඒවා ලැබෙන ප්‍රතිපදාව ගැන කිසිදු සැලකිල්ලක් නොදක්වයි. ලාමක හා අසත්පුරුෂ ධර්මයන්ගෙන් යුක්තව කල් ගෙවමින් අන්‍යයන්ගේ ගරු සැලකුම් අපේක්ෂා කොට නොලැබෙන කල්හි තමා ඇසුරු කරන සමස්ත සමාජයට ම අවළා ද නංවයි. එමගින් ඔහු තව තවත් අපකීර්තියට පත් වී කිසිදු ආනුභාවයක් නැති අසරණයෙක් බවට පත් වේ.

මිනිස් සමාජයෙන් පමණක් නොව දෙව් බඹුන්ගෙන් පවා අපරිමිත පැසසුම් ලද අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ ප්‍රියවීමට, ගෞරවයන් ලැබීමට හා සමගියෙන් සතුටින් කල් ගෙවීමට හේතුවන මනෝභාවයන් හෙවත් යහපත් චින්තන මාර්ගයක් පෙන්වා වදාළහ. ඒ අනුව සිතන, ක්‍රියා කරන පුද්ගලයා මිනිසුන් ගේ පමණක් නොව දෙව් ලොව දෙවියන්ගේ ද නමස්කාරයට පාත්‍රවන ආකාරය දෘෂ්ඨාන්ත සහිතව ම තහවුරු කළහ.

අංගුත්තර නිකායේ අධිකරණික සූත්‍රයට අනුව යම් පුද්ගලයෙක් භාවනීයයෙක් වීමට බලාපොරොත්තු වේ නම් තමා අධිකරණකාරකයෙකු නොවිය යුතු ය. ගිහියෙක් හෝ පැවිද්දෙක් තමා ජීවත් වන සමාජයේ සහචරයන් අතර ආරවුල්, මත ගැටුම්, දෘෂ්ටිවාද, අරගල හා කෝලාහල ඇතිවන ආකාරයෙන් කටයුතු නොකර ඇතිවන තාක් අධිකරණයන් දුරදිග නොයවා ඒ ඒ තැන ම සමථයකට පත් කිරීමට කටයුතු කිරීම මගින් ගෞරවනීය පුද්ගලයකු බවට පත් වේ. ඒ සඳහා පළමු ව ඉවසන්නකු හා දරාගන්නකු විය යුතු ය. එකට එක නොකර අවමන්, ගැරහුම්, හානි පැමිණවීම් ආදියෙන් කම්පිත නොවී වෛර නොබැඳ සිටින පුද්ගලයා දෙව් මිනිසුන් අතර කීර්තිධරයෙක් වේ. යුක්තියේ නාමයෙන් වුව ද සමාජය කෝප ගන්වන ප්‍රකාශයන් හා ක්‍රියාවන් නොකළ යුතු අතර, ඥාණගෝචර හා දුරදර්ශී විසඳුම් හඳුනා ගැනීම ගෞරවනීය පුද්ගලයන් ගේ භාවප්‍රකූර්තිය යි.

තමා ශික්ෂාකාමියකු වීම හා ශික්ෂා සමාදානයෙහි වටිනාකම පෙන්වා දී ඇසුරු කරන්නන් සීලවන්තයින් බවට පත්කිරීම උදෙසා කැපවීමෙන් කටයුතු කිරීම ප්‍රියභාවයට, ගෞරවයට හා සමගියට හේතු වන දෙවන කාරණය යි.



# මිනිසුන් ගේ මෙන් ම දෙවියන් ගේ ද

# ගෞරවය ලබන්නේ මේ වගේ අය යි

සිල්වතාට දෙව් මිනිසුන් පමණක් නොව යක්ෂ ප්‍රේතයින් ද හිස නමන ආකාරය ධර්මයේ සඳහන් ය. එබැවින් ඔබ පළමු ව සිල්වතකු වී, දෙවනුව ඔබේ පවුලේ කිහිප දෙනාවත් සිල්වතුන් කිරීම සඳහා හැකි සෑම උත්සාහයක් ම ගත යුතු ය. අද්‍යතනික සමාජයේ බොහෝමයක් අර්බුදයන්ට හේතු වී ඇත්තේ දුස්සීලභාවය යි. සිල්වතා හැඟීම් පාලනයක් සහිත හැසිරීමක් ඇත්තෙක් බැවින් ඔහු කෙරෙන් කිසිවකුටත් අනතුරක් නොවන අතර, අගතිගාමීත්වයෙන් තොරව කටයුතු කරයි.

ගරු බුහුමන් ලැබීමට හේතුවන තුන් වන කාරණය අල්පේච්ඡ භාවය යි. එනම් ලද දෙයින් සතුටු වීම යි. ගිහි පැවිදි කාටත් එක සේ වැදගත් වන මෙම කාරණය සිත් හි පිහිටුවා ගැනීම මගින් පරිභෝගකාමීත්වය විෂයයෙහි කැදරකම දුරු වේ. කොතෙක් ලැබුණත් තුටු නොවන මිනිසා කිසිවකින් සතුටු නොවන අතර, කෘතවේදීත්වය නැමති උදාර ගුණය ඔහු කෙරෙන් ගිලිහී යයි. තමාට කරන ලද ස්වල්ප වූ ත් උපකාරය සිහි කරන්නා අල්පේච්ඡතාවයෙන් යුක්ත වන්නෙකි. මහිච්ඡතාවයට ගිය ගිහියා ද ,පැවිද්දා ද ජන සමාජයේ තදින් ම පිළිකුලට භාජනය වේ. ගිහි අපටවත් නොමැති තෘෂ්ණාවක් මේ හාමුදුරුවන්ට ඇතැයි ඇතැම් පැවිද්දන්ට අවමන් ලැබීමට සිදු වන්නේ අල්පේච්ඡ නොවීම හේතුවෙනි. අල්පේච්ඡ භාවයෙන් යුතු පැවිද්දා සැමකල් හි ජනාදරයට පත්වන සැටි කස්සප සංයුක්තයෙන් පිළිබිඹු වේ.

ගින්නත්, සාගරයත්, මහිච්ඡ පුද්ගලයාත් කොතෙක් ප්‍රත්‍ය ලද මුත් පුරවාලිය නොහැකි බව බණ පොතේ සඳහන් වේ. අවම අවශ්‍යතා ප්‍රමාණයකින් සෑහීදිවි ගෙවන තැනැත්තා සැමකල් හි පැසසුමට ලක්වන අතර, ඔහු සමග ජීවිත කාලය ම වුව ද සමගියෙන් වාසය කළ හැකි ය. තමා අල්පේච්ඡ වී, අන්‍යයන් ද අල්පේච්ඡයන් කිරීම පිණිස කටයුතු කිරීම මගින් ජන සමාජය තුළ සාමය හා සමගිය ආරක්ෂා වනු ඇත.

ක්‍රෝධ නොකිරීම ගරු බුහුමන් ලැබීමට හේතුවන සතරවන කාරණය යි. බුරා නැගෙන ගින්නක් බඳු ක්‍රෝධය නිසා පළමු ව තම හදවත ඇවිල යන අතර ,දෙවනු ව අන්‍යයන් ගේ සිත් අවුලුවා, දා ගිය වනයක් සේ බොහෝ දෙනා ගේ ජීවිත පුළුස්සා නිශ්‍රීක කරයි. ද්වේශ සහගත වචන හා ක්‍රියාවන් බහුල පුද්ගලයා ආනන්තරිය මට්ටමේ පාපයකට වුව ද මොහොතකින් නැඹුරු වේ. යක්ෂාවේශයෙන් මෙන් හැසිරෙමින් ජනයා අතර බලවත් අපකීර්තියට පත්වන්නේ සද්ධර්මය නොදත්, සිතිවිලි මාත්‍රයක මෛත්‍රියක් නොමැති අසත්පුරුෂයෝ ය. මෛත්‍රිය නැමති සිසිල් දියෙන් දන මන නිවූ මහා ගෞතම දම්රාජයාණන් ගේ ශ්‍රාවකමුලුව අත්‍යන්තයෙන් ම මෙත් සිත් ඇතියයන් විය යුතු ය. මෛත්‍රී සහගත කාය – වාග් – මනෝ කර්මයන් ඇති හැකි සෑම තැනක ම පැමිණවීම මගින් බුදුසව්වා දෙවියන්ට පවා ප්‍රියමනාප පුද්ගලයකු වේ.

අන්‍යයන් ගේ ගුණ නොමකනා ස්වභාවය හා යථාභූත ගුණයන් නොමසුරු ව ප්‍රකාශ කිරීම ගරු බුහුමන් ලැබීමට හා සමගියට හේතුවන පස්වන කාරණය යි. ගුණමකු පුද්ගලයා කිසිකෙනකු ගේ යහපත් ක්‍රියාවක් අනුමෝදන් නොවේ. සෑම විට ම අනුන් ගේ නුගුණ හා අඩුපාඩු සොයමින් තම සිත දූෂ්‍ය කර ගනී. එම ස්වභාවය උත්සන්න වූ විට මානසික රෝගී තත්වයක් නිර්මාණය වී විරාගී ආර්යයන්ට පවා උපවාද කිරීමට තරම් සැහැසි වේ. අනුන් ගේ අඩුලුහුඩුකම්වලින් තමාට වන පාඩුවක් හෝ ලාභයක් නොමැති බව හඳුනා යමකුගේ විද්‍යාමාන ගුණයක් අගයමින් කතා කිරීම මගින් කිසිවකු ගේ දෝෂ දර්ශනයට ලක් නොවේ. ඔවුනොවුන් අතර හොඳ හිත ශක්තිමත් වී සමගිය හා සාමය ද ඇතිවේ.

සාමග්‍රීකරණයට හා ප්‍රියකරණයට හේතුවන සයවන හේතුව සඨභාවයෙන් යුක්ත නොවීම යි. නැති ගුණ හුවා දක්වා තමා ගේ සැබෑ ස්වභාවය වසන් කිරීම සඨභාවය නම් වේ. එය කෛරාටික භාවය යනුවෙන් ද හැඳින්වේ. සත්‍ය සඟවා මුසාවක් හුවා දක්වා වැඩි කාලයක් පැවතිය නොහැක. සත්‍ය කවදා නමුත් හෙළිවීම ලෝක ස්වභාවයකි.


16 පිටුවට...



බෙලිහුල්ඔය සීලසමාහිත යෝගාශ්‍රමවාසී
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත
**බලංගොඩ රාධ හිමි**

# පෙර බවයේ මතකය මේ බවයේ දී ගිලිහී යන්නේ ඇයි?

**විශ්වාසය යනු බුදු දහම විසින් අගය නො කෙරෙන මානසික ආකල්පයකි. ලෝකයේ පැවතියා වූ ද ,මේ වන විට පැතිර පවතින්නා වූ ද සෑම ආගමක ම පදනම විශ්වාසය (Belief) යි. එහෙත් බුදු දහම යනු විශ්වාසය ඉක්මවා සිටින, සම්මා දිට්ඨිය හෙවත් නිවැරැදි දැනුම සහ අවබෝධය පදනම් කොටගත් ඉගැන්වීමකි.**



ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක, ආචාර්ය

**ඕමල්පේ සෝභිත නා හිමි**

විශ්වාසය යන වචනය සමග ම ඇතිවන අදහස අවිශ්වාසය සමඟ මුසු වූවකි. තම අත්දැකීම්, ආත්මාවබෝධය, දැනුම ආදී කරුණු සඳහා ඒ තුළ ඉඩක් නැත. විශ්වාසය යන්නට නිරන්තරයෙන් ම පදනම් වන්නේ අනුන් ගේ වචන, අනුන් ගේ තොරතුරු හෝ පොතපතේ සහ පාරම්පරික ව එන විස්තර, වාර්තා ආදිය යි. එහෙයින් එහි ලා ස්වතන්ත්‍ර වූ අත්දැකීමක් සම්බන්ධ වන්නේ නැත. නිදසුනක් වශයෙන්, සදාකාලික අපාය, සදාකාලික දෙව් ලොව, ලෝකය මැවීම ආදී අදහස් දැක්විය හැකි ය. මේ කරුණු සියල්ල ම වෙනත් කවුරුන් ගේ හෝ අත්දැකීමක් වශයෙන් වාර්තා වී ඇත.


එසේ වූව ත් "නැඟෙනහිරින් ඉර පායනවා" යන්න හෝ "උපන්නා වූ සැම සත්වයකු ම ඒකාන්තයෙන් ම මිය යනවා" යන අදහස, එසේත් නැති නම්, "සොරකම් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් ය" යන නිගමනය එබඳු බාහිර සංකල්පයක් මත පදනම් වූවක් නොව, ස්වකීය අත්දැකීම් සහ දැනුම මත පදනම් වූවකි. එහෙයින් එය විශ්වාසය ඉක්මවා සිටි ආත්ම ප්‍රත්‍යක්ෂය පදනම් වූවකි. එය දැකීම, අවබෝධය යන්න හා බැඳේ. එහෙයින් සම්මාදිට්ඨිය යන අර්ථකථනයට එහි ඍජු සම්බන්ධතාවක් ඇත.

බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ කාලාම සූත්‍රයේ දී කේසපුත්ථ කාලාම ගමේ වැසියන්ට පහදා දුන්නේ විශ්වාසය සහ දැනුම සම්බන්ධ විශ්වගත සම්මුතිය යි. ඒ අනුව බෞද්ධයන් වශයෙන් අප කරුණු තහවුරු කර ගත යුත්තේ පොතපතෙන්, පරම්පරාවෙන් හෝ ආගමික විශ්වාසයන් ගේ බලපෑමෙන් නොව අභ්‍යාසයෙන් සහ ප්‍රත්‍යක්ෂයෙන් තහවුරු කර ගත් දැනුම හෙවත් ස්වකීය චින්තනය මුල් කරගෙන ය. එය ම අන්තගාමී නොවන මධ්‍යස්ථ විද්වත් ජන අභිනන්දනයට හේතු වන්නක් වන බව ද නිසැක ය.

නැවත ඉපදීම නැමැති සංසිද්ධිය පිළිබඳ නිගමනයකට පැමිණීමේ දී අප විසින් අනුගමනය කළ යුතු ක්‍රමවේදය වන්නේ ද එය යි. වත්මන් හි පැතිර පවත්නා ප්‍රධාන සෑම ආගමක ම නැවත උපතක් පිළිබඳ පිළිගැනීමක් ඇත. ඒ උපතේ ස්වභාවය ගැන වෙනස් වෙනස් මතිමතාන්තර පවතින්නේ නමුදු මරණයෙන් පසු මනුෂ්‍යයාට අත්විඳින්නට සිදුවන අත්දැකීමක් වශයෙන් එ කරුණ හැම ආගමක ම ඒකාග්‍රතාවයකට පැමිණ තිබේ.

මානව සමාජය තුළ විවිධාකාර ආගමික සංවිධාන ආරම්භ වීමෙන් පසු නැවත ඉපදීම පිළිබඳ පොදු විශ්වාසයක් සමාජගත වූ අතර එයට අමතර ව විවිධ උගතුන්, පර්යේෂකයන්, දාර්ශනිකයන් මේ මාතෘකාව සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.

බුදුරජාණන් වහන්සේට බෙහෙවින් සමකාලීන ව සිටි පයිතගරස් නැමැති දාර්ශනිකයා ද එවන් මතයක් දැරුවකු විය. තම අතීත ආත්මභාවයන් සිහිපත් කිරීමට ඔහුට හැකියාවක් පැවති බව ද සඳහන් ය. ප්ලේටෝ නැමැති දාර්ශනිකයා ද තම පෙර ආත්ම භාවයන් ගණනාවක් ගැන ප්‍රකාශ කර සිටියේ ය. ඔහු ගේ මතයට අනුව සෑම මනුෂ්‍යයකු ම දහ වරක් නැවත උපත ලබයි. මිනිසා තිරිසන් ආත්මභාවයන් හි උපත ලබන බව ද තවදුරටත් ප්ලේටෝ තුමන් ප්‍රකාශ කර තිබේ.



පුරාණ ඊජිප්තුවේ ත්, චීනයේ ත් පැවති පොදු අදහසක් නම්, රජවරුන් වැනි ප්‍රභුවරයින් දිව්‍ය ලෝකයේ නැවත උපත ලබන බව යි. ඒ නිසා ම ඔවුන් ගේ මතු ප්‍රයෝජනය සඳහා ධන ධාන්‍ය පමණක් නොව, ළඟින් ම ඇසුරු කළ භාර්යාවන් හා දැසි දස්සන් ද ඇතුළත් කර අතිවිශාල සොහොන් ගෙවල් තැනීමේ චාරිත්‍රය ප්‍රකට ව පැවතිණ.

තුන් වැනි සියවසේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ ජීවත් වූ සම්භාවනීය ක්‍රිස්තියානි දාර්ශනිකයා වූ ඔරිජේන් තුමා (Origen – 185 – 254CE) පුනර් ජන්මය දැඩි ලෙස විශ්වාස කළ අයෙකි. කිතුනු පල්ලියේ අධිකාරියට අභියෝග කරමින් ඔහු කියා සිටියේ මිනිසා සදාකාලික ව ම තබනු ලබන සදාතනික අපායක් (enteral hell) කිසිසේත් පිළිගත නොහැකි බව ය. 19 වැනි සියවසේ ජීවත් වූ ජර්මානු දාර්ශනික ඉමැනුවෙල් කාන්ට් තුමා (Immanuel Kant - 1804) මිනිසා ගේ නැවත ඉපදීම ගැන විශ්වාසය පළ කළ අතර, සදාකාලික දණ්ඩනය සහිත අපායගාමිත්වය සම්බන්ධයෙන් පවත්නා කිතුනු මතවාද පිළිකුලෙන් හෙළා දුටුවේ ය. දිව්‍යමය ආත්මභාවයෙන් මනුෂ්‍ය ආත්ම භාවයටත් ,මිනිසා ගේ ආත්මය මාරුවෙන් මාරුවට ගමන් කරන බව එතුමා ගේ මතය විය. පුනර් ජන්මය පිළිබඳ හොඳ හෝ නරක තීරණය කරන්නේ වතර්තමාන ජීවිතයේ අනුගමනය කරන චරිතාකල්පයන් හෙවත් ආචාර විචාර බව ද හේ කියා සිටියේ ය.

නැවත ඉපදීම පිළිබඳ සංකල්පය ගැන සාකච්ඡා කරන විට මතකයට නඟා ගත යුතු තවත් වැදගත් දාර්ශනිකයකු වන්නේ ජර්මන් ජාතික ෂෝපන් හවර් (Schopenhauer - 1860) මහතා ය. මරණයෙන් පසු ජීවිතය තවදුරටත් ඉදිරියට පවත්නා බව කී හෙතෙම එසේ අනාගත පැවැත්මට හේතු වන ප්‍රධාන සාධකය වන්නේ එසේ නැවත නැවතත් ඉපදීම සඳහා මිනිසා තුළ ස්වභාවයෙන් ම පවත්නා අශාව හෙවත් භවාශාව බව ද දක්වාලී ය.

මෙසේ සලකන විට ආගමික ආචාර්යවරුන් පමණක් නොව විවිධ දාර්ශනිකයන්, චින්තකයන් සහ නිදහස් මතධාරීන් පවා නැවත ඉපදීම පිළිබඳ අදහස තහවුරු වන පරිදි මිනිස් ඉතිහාසය පුරාම මත පළකර ඇති බව පැහැදිලි ය. ස්වකීය පෞද්ගලික අත්දැකීම්, චින්තනයන්, තර්කයන් හා පර්යේෂණ මඟින් ඇති කර ගත් දැනුම මෙන් ම ස්වතන්ත්‍ර වූ නිගමන එවන් මතවලට හේතු සාධක වී ඇති බව පැහැදිලි ය.

ඉන්දියාව චීනය ඇතුළු පෙරදිග සමාජය ඇසුරු කළ හා ඇසුරු කරන අපට නැවත ඉපදීම යන්න අරුමයක් නොවු ව ද අපරදිග සමාජයට එය අතිමහත් විමතියකට කරුණක් විය. එයට හේතුව එවන් මතයක් දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන ආගමික විශ්වාසයන්ට එම සමාජ ගොදුරු වී සිටීමයි. නැවත ඉපදීමක් යන මතය ආගම් විරෝධී වන්නක් සේ ම යක්ෂයා ගේ අදහස් ලෙසින් ද සලකා, එවැනි මත දැරුවන්ට තාඩන පීඩන පවා සිදුකරන්නට එබඳු සමාජයන් පියවර ගෙන ඇත්තේ ඒ නිස යි.

"මරණයෙන් ජීවිතය කෙළවර වෙයි. ශරීරිය සෑදී ඇති මූලද්‍රව්‍ය විසිරී ගිය පසු නැවත ඉපදෙන හෝ ඉදිරියට යන බලවේගයක් නැත. එනිසා සත්වයා අත් දකින්නේ වර්තමාන ජීවිතය පමණී" යනුවෙන් පවත්නා අදහසක් ද සමාජගතවී ඇත. එය භෞතිකවාදය, ද්‍රව්‍යවාදය, කොමියුනිස්ට් වාදය ආදි වශයෙන් හඳුනා ගනු ලබයි. බුද්ධ කාලයේ පවා පැවති එම දර්ශනය උච්ඡේදවාදය ලෙසින් දක්වනු ලැබ ඇත.

වත්මන්හි ලෝක ජනගහනයෙන් වැඩි දෙනකු සම්බන්ධ ව පවත්නා බවක් කියැවෙන ක්‍රිස්තියානි, යුදෙව්, ඉස්ලාම් යන ආගමික මතවාදවල ද මරණින් පසු උපතක් පිළිගැනී ඇති බව මුල දී සඳහන් කෙළෙමු. එහෙත් එයින් කියැවෙන්නේ එකම උපතක් ගැන යි. සදාකාලික වූ ඒ එක ම උපත යළිත් වෙනස් වන්නේ නැත. බුදුදහම දක්වා සිටින්නේ යළි උපතක් ගැන නොව යළි යළිත් සිදුවන උපතක් (පුනර්භවයක්) ගැන යි. අනාත්මවාදය පිළිබඳ ඉගැන්වීමත් සමග බුදුදහමේ ආකල්පය හින්දු ධර්මය ත් සමඟ නොපෑහෙන ආකාරය අවබෝධ කරගත හැකි ය.

තාඕ, කොම්පියුසියස්, හින්දු, ජෛන, බෞද්ධ ආදී මතවාදයන් හි ඇසුර ලද පෙරදිග වැසියන්ට පෙරභවය හා පුනර්භවය පිළිබඳ පවත්නේ සාමාන්‍ය දැනීමට සමාන වූ ආකල්පයකි. එම තත්වය සමස්ත සමාජයේ ම සදාචාර සංවර්ධනයට පවා ඉවහල් වී ඇති හෙයින් සංසාරික පැවැත්ම වූ කලී ආගමික විශ්වාසයන් ඉක්මවා සිටි සමාජ ව්‍යවස්ථාවක් බවට පත්වී ඇති බව කිව යුතු ය.


පෙර භවය හෙවත් කලින් ජීවත් ව සිටි ජීවිතය පිළිබඳ ඉතා කලාතුරකින් කෙනකු විස්තර කියන බව නිතර වාර්තාවන කරුණකි. එය එසේ නම්, අප හැම දෙනාට ම, සියලු මිනිසුන්ට පෙර භවය ගැන සිහිපත් කළ නො හැක්කේ මන් ද?

25 පිටුවට...

# එකතු කරනවා වැඩි කරනවා වගේ ම
# අඩු කරන්න බෙදන්න ත් පුරුදු වෙන්න ඕනෑ

**දෙව් මිනිසුන්ට නිසි මඟ පෙන්වා දී ම, වැරැදි මඟින් මුදවා ගැනීම තථාගතයන් වහන්සේ ගේ මූලික බුදු ගුණයකි. මඟ නොමඟ දැන හඳුනා ගෙන නිවැරැදි ආකල්ප ඇති කර ගැනීම සඳහා නැණවත් බව මහත් උපකාරී වන බව දහමේ පිළිගැනීම යි.**





කොළඹ 06
හැව්ලොක්සිටි සාම විහාරාධිපති
**අතපත්තුකන්දේ ආනන්ද නා හිමි**

එමෙන් ම, 'නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස' යනුවෙන් තමන් වහන්සේ ගේ ධර්මය අනුවණයන්ට නොවන බව ද භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට තිබේ. අනුවණයන් යනු බාලයන් ය. තථාගතයන් වහන්සේ විසින් 'මෝඝ පුරිස' වශයෙන් ආමන්ත්‍රණය කර ඇත්තේ ද එබඳු බාලයන් සඳහා විය හැකි ය. මෙහි දී එබඳු අධර්මවාදී අය හැඳින්වීම සඳහා 'මෝඩ මිනිසා' යන රළු භාෂිතය යොදා ඇති අවස්ථා පිළිබඳ ත්‍රිපිටක ධර්මයෙහි බොහෝ ස්ථානයන් හි දක්නට ලැබේ. වර්තමානයෙහි ද නිර්මල ථේරවාදී බුදු දහම තමන් ගේ සිතැඟි පරිදි විග්‍රහ කරමින් බෞද්ධ සමාජය නොමඟ යවන භික්ෂු ප්‍රතිරූපක වෘද්ධ පබ්බජිත මෝඝ පුරුෂයන් කිහිප දෙනකු සමාජගතවී ඇති බව ද දක්නට ලැබේ. බුදු දහම නිරන්තරයෙන් ම එබඳු පුද්ගලයන් නම් කර ඇත්තේ 'බාල' නම් වූ බාල යෙදුමින් ය. එබඳු වූ බාලයන් ඇසුරු නොකළ යුතු අධම පුද්ගලයන් ලෙස දහමින් ප්‍රතික්ෂේප කරයි. ඔවුන් හඳුනා ගැනීමේ ලක්ෂණ ද පෙන්වා දෙයි.

සාමාන්‍ය ජන සමාජය තුළ තම දරුවන් පිළිබඳ මව්පියන්ට ඇත්තේ සාඩම්බර වූ හැඟීමකි. තමන් සතු ධනය පිළිබඳව ද ඇත්තේ එබඳු හැඟීමකි. ඇතැමකුට දරුවන් පිළිබඳ නැති මහා මානයක්, ධනය පිළිබඳ ඇති බව ද නො රහසකි. බුදු දහම දරුවන් පිළිබඳ ලබා දී ඇති පැහැදිලි කිරීම 'පුත්තා වත්ථු මනුස්සානං' යන්න යි. එනම්, මිනිසුන්ට ඇති එකම වස්තුව දරුවන් බව ය.

ධනය පිළිබඳ දේශනා කිරීමේ දී, පුද්ගලයා උපයා ගත් ධනයෙන් පරිපූර්ණ විය යුතු බවත්, 'දාලිද්දියං භික්ඛවේ දුක්ඛං' යනුවෙන් දිළිඳු බව දුකක් බවත් පෙන්වා දෙයි. එහෙත්, දූ දරුවන් පිළිබඳ හෝ ධනය පිළිබඳ හෝ සිතමින් ඒ පිළිබඳ මුළාවට පත්වීම, අවිචාරවත් ව ක්‍රියා කරමින් සසර දිගු කර ගැනීම සම්බුදු දහමින් විවේචනයට ලක්වී ඇති අයුරු ධම්මපද පාලියෙහි සඳහන් මෙම ගාථා ධර්මයෙන් දැක ගත හැකි ය.

පුත්තාමත්ථි ධනං මත්ථි – ඉතිබාලෝ විහඤ්ඤති

අත්තාහි අත්තනෝ නත්ථි – කුතෝ පුත්තා කුතෝ ධනං

මෙහි පුත්තාමත්ථි යනු තමන්ට දරුවන් ඇතැයි සිතීම පමණක් නොවෙයි. දරුවන් ගේ උසස්කම්, බලවත්කම්, සවිමත්කම් පිළිබඳ සිතමින් මුළා ව ක්‍රියා කිරීම ය.

ධනංමත්ථි' නම්, මට ධනය ඇතැයි සිතීම යි. තව තවත් ධනය රැස් කිරීමට පමණක් නොව, ඒවා රැකීමට දරනු ලබන උත්සාහය මෙන් ම ලබා ඇති ධනයෙහි ප්‍රමාණය පිළිබඳ සිතා මහත් සේ මුළා ව ක්‍රියා කිරීම යි. සමහර කෙනකු සතුටට පත් වන්නේ තමන් සතු ධනය පිළිබඳ දිනපතා ප්‍රමාණ වශයෙන් සිතමිනි. ඇතැම්විට ඒවා ගණනය කරමිනි. මෙම ස්වභාවය ඇතැම්විට 'මදයට' හෙවත් මත්වීමට පත්වීමකි. සම්බුදු දහමෙහි එබඳු 'මද' සත් විස්සක් පිළිබඳ සංඛ්‍යාත්මක ව දක්වා තිබේ. මේවා මත් වතුරකින් හෝ මත් ද්‍රව්‍යකින් සිදු කරන හානියට වඩා විශාල හානියක් සිදු කරයි. මත්ද්‍රව්‍යයන්ගෙන් මත්වීම සීමිත කාල පරාසයකට සීමා වුවත් 'භෝග මදය, ලාභ මදය, ජීවිත මදය' වැනි මීට අදාළ ව ඇති මත්වීම ජීවිත කාලය පුරාම රඳා පවතියි. මෙසේ තම ජීවිතය තුළ ලබන ලද දූ දරුවන් හා ධනය මෙන් ම එහි ලාභය පිළිබඳ ඇති කර ගන්නා මත්වීමෙන් සාමාන්‍ය ජීවිතයෙන් වෙන් වේ. සාමාන්‍ය චර්යාවන්ගෙන් වෙන් ව ක්‍රියා කරයි. තම ආගම දහමින් ඈත් වෙයි . එය නිරායාශයෙන් සිදු වන්නකි. එබඳු වූ සිතුවිලි පුද්ගලයා තම ජීවිතය තුළින් ඈත් කරයි. ඔහු ජීවිතයට නිමාවක් ඇති බව ද නොසිතමින් තාවකාලික වූ ජීවිතය සදාකාලික බවට පත් කර ගනියි. එය අභාග්‍යයකි.

තමන් ගේ සිරුර පිළිබඳ තමන්ට තරම් වෙනත් කිසිවකුට ත් අවබෝධයක් නැත. එමෙන් ම එහි පැවැත්මට, ආරක්ෂාවට, ශක්තියට මෙන් ම පෙනුමට දක්වන සැලකිල්ල ලොව ඇති කිසිවක් සඳහා දක්වන්නේ ද නැත. එසේ පෝෂණය කරමින්, සවිමත් කරමින්, සරසමින්, සුවපත් කරමින් රැක ගන්නා ශරීරය හෝ තමාට අයත් දෙයක් නොවන බව පෙනෙන්නේ එම සිරුර ද මෙහි තබා මෙලොව හැර යාමෙනි. එසේ නම් ආදරයෙන් හදා වඩා ගත් දරුවන් හෝ සෙනෙහසින් එක් ව දිවි ගෙවූ බිරින්ඳෑවරුන් හෝ 'ධනය හෝ කොයින්දැ යි මෙහිදී ප්‍රශ්න කෙරේ.

රැයක් දවාලක් නැති ව වෙහෙස මහන්සි වී උපයන ලද ධනයෙන් අංශු මාත්‍රයක් මිය යාමේ දී කිසිවකු, කෙලෙසකින් හෝ ගෙන යන බවක් හෝ ගෙන ගිය බවක් ඇසිය දැකිය නොහැකි ය. තමා ඉතා මැනවින් රැක බලා ගන්නා සිරුර, සර්පයන් තම හැව හැරයන්නාක් මෙන් හැර යයි. ජීවිතයෙන් සමු ගනියි. මම ය, මාගේ ය යන දැඩි ආශාව පීඩාවට හේතුවක් මෙන් ම දෙලොව ම දුක් ගෙන දෙන බව මෙහි දී ඉතා මැනවින් විස්තර කර ඇත්තේ ඉතා සංවේගාත්මක ව ය. තමා ඉතා ඇළුම් කරන තම ශරීරය මෙන් ම, ඊට සමානව ම ඇලුම් කරන දරුවන් පමණක් නොව ප්‍රිය බිරිඳ හෝ සැමියා ද, තමාට උරුම වූ ධනය ද යන මෙම භෞතික වස්තුන් කිසිවකුටත් දුරස් වූ සංකල්පයක් නොවේ. නිතර දැනෙන, පෙනෙන පරිභෝග කරන මේ සියල්ල කිසියම් දිනක අතහැර දමා හුදකලා ගමනක යන අයුරු දැක්වීමට තථාගතයන් වහන්සේ භාවිත කර ඇති උපමා රූපක තුළින් තම උතුම් ධර්මය පුද්ගල මනසට ප්‍රවිෂ්ට කර ඇත්තේ ඉතා සරල ස්වභාවයකිනි. වර්තමානයෙහි අප පීඩාවට පත් කර ඇති කොරෝනා නම් වූ ගෝලීය වසංගතය දිනෙන් දින අපට පසක් කරනුයේ තථාගතයන් වහන්සේ ගේ එම උතුම් දර්ශනයෙහි සත්‍යතාව ය යි.

භාග්‍යවතුන් වහන්සේ ගේ මෙම ධර්ම දේශනය සඳහා හේතු වූ සිදුවීම ද සසරෙහි බියජනක බව මැනවින් ගතට හා සිතට දැනෙන බේදනීය පුවතකි.


එ දවස සැවැත් නුවර ආනන්ද නම් සිටුවරයකු විය. ඔහු ගේ වත්කම කෝටි 40 ක් පමණ ය. එහෙත් ඔහු දැඩි මසුරු ය. සුවිසල් ධනවත්කම පිළිබඳවත්, මූලසිරි නම් එකම පුතු පිළිබඳවත් මුළා වූ සිතින් යුතුව ක්‍රියා කරන ලද මොහු තම පුතුට දෙන ලද අවවාදය වූයේ හිමි ව ඇති ධනය අඩුවෙන් සලකමින් තව තවත් ධනය එකතු කර තබන ලෙසයි. බෙදීම හෝ අඩු කිරීම තම පුතුට කිසිවිටෙකත් කියා නොදුන් මෙම මසුරු පියා එකතු කිරීම හා වැඩි කිරීම පමණක් කියාදුන්නේ ය. සඟවා තබන ලද නිධානයන් පිළිබඳව ද හෙළිදරව් නොකර ම මරණයට පත්වූ යේ ය.

ගත කළ මසුරු ජීවිතයට අනුව මොහු ඊළඟ බවය ලැබුවේ මිනිස් ලොව සැඩොල් කුලයක ය. පියා ගේ මරණයෙන් පසු පුතු සිටු තනතුරට පත් විය. පියා ගේ අවවාද ගරු කරමින් ධනය පරිහරණය කළේ ය. ඉතා ලෝභී ව මහත් මසුරුකමින් යුතුව දිවි ගෙවී ය. මිය ගිය සිටුවරයා පිළිසිඳගත් සැඩොල් කුලයෙහි එම සැඩොල් මවට පමණක් නොව මුළු ගමට ම එදින සිට කිසිවක් නොලැබුණේ ය. ආහාර පාන ආදිය දිනෙන් දින අඩු විය. සැඩොලුන්, තම ගමෙහි කිසියම් අභාග්‍ය සම්පන්න පව්ටෙකු ඉපිද ඇතැයි සොයා බලා දරු ගැබ සහිත එම කාන්තාව ද ගමෙන් එළවා දැමී ය. ඒ මවට උපන් දරුවා බියජනක ය. විරූපී ය. ඇස්, කන්, නාසා ආදී ශරීරාංගයන් ද නිසි අයුරින් නොපිහිටියේ ය. මව ගේ කරුණාවෙන් ඇතිදැඩි විය.

25 පිටුවට...



# බාධක ජය ගන්නට නම් සිතේ දුර්වලතා හඳුනාගන්නට ඕනෑ



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහ නා හිමි**

**මිනිස් සිත හරිම පුදුමාකාරයි. මොහොතින් මොහොත වෙනස් වෙමින් තැනින් තැන ගමන් කරන්නේ සිත අයිති පුද්ගලයාටත් නොදැනී ම යි.**

ඇත්තට ම මේ සිත කියන්නේ කුමකට ද? එය නිවැරැදි ව අවබෝධ කරගන්නේ කෙසේ ද? එහි නියම ම ස්වරූප කෙබඳු ද? සිත හඳුනාගන්නේ කෙසේ ද? සිත වැරැදි මඟක ගමන් කරනවා නම්, එහි ප්‍රතිඵලය කුමක් ද? නිවැරැදි මඟක ගමන් කරනවා නම් එහි ප්‍රතිඵලය කුමක් ද? දුර්වලතා හඳුනාගෙන නිවැරැදි මඟක ගමන් කරන්නේ කෙසේ ද? ආදි ලෙස විවිධ පැතිකඩවලින් සිත ගැන කළ දීර්ඝ විග්‍රහයක් බුදු දහමෙහි සඳහන් වෙනවා.

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක

"නාහං භික්ඛවේ අඤ්ඤං ඒක ධම්මං පි සමානුපස්සා මි සං ඒවං චිත්තං"

සිත වැනි වැදගත්වන වෙනත් කිසිම දෙයක් මෙලොව මා දැක නැත. සිත වැඩි දියුණු කරනවා නම් ,නිවැරැදි ව මෙහෙයවනවා නම් මිනිසාට ඔහු ගේ සිත උතුම් මෙහෙයක්, උතුම් සේවාවක් ඉටු කර දෙනු ඒකාන්තයි." යනුවෙන් දේශනා කළා.

සැම දෙනාගේ ම බලාපොරොත්තුව සතුටින් ජීවත්වීම යි. සාමයෙන්, සමගියෙන් ජීවත්වීමයි. සාමාන්‍ය විශ්වාසය නම් සතුට ලබන්නට ධනය තිබිය යුතු බවයි. බලයත්, සමාජ තත්වයත් තිබිය යුතු බවයි. මේ ගැන අවබෝධයෙන් සිතන්න. සත්‍ය වශයෙන් ම මේ සියල්ල හිමි වූව ද නියම සතුටක් ලැබෙනවා ද? මේ කවර සම්පත් ලැබුණත් නියම සතුටක්, තෘප්තියක් ලැබෙනවා ද? ලෝභකමින්, වෛරයෙන්, ක්‍රෝධයෙන්, ඊර්ෂ්‍යාවෙන් දැවෙන සිතට මොන සතුටක් ද? නියම සතුටක් ලැබීමට නම් අප පළ මුකොට ම කළ යුත්තේ අප ගේ සිත ගැන නිවැරැදි දැක්මක් ඇති කර ගැනීම යි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වන්නට පුළුවන්. සංසාරය හා නිර්වාණය ලෙස. මේ කරුණු දෙක ම සලකා බැලූ විට පෙනී යන්නේ බුදු දහම එකම කරුණක් ගැන දේශනා කර ඇති බවයි. ඒ, අපගේ සිත ගැන යි. සිත කිළිටි නම් එය සංසාරය යි. සිත නො කිළිටි නම් එය නිර්වාණය යි. ඒ අනුව සිත අපිරිසුදු වීම සංසාරයට මඟ යි. ඒ සිත පිරිසුදු වීම නිර්වාණයට මඟ යි.

පිරිසුදු සිතේ තෘෂ්ණාව ආදී කෙලෙස් නෑ. ඒත් අපිරිසුදු සිත කෙලෙස්වලින් බර යි. මේ අනුව සිත කියන්නේ ප්‍රබල ශක්තියක්. එය අවබෝධ කර නො ගන්නා පුද්ගලයා, ලෝකයේ ප්‍රබල ම ශක්ති වේගය හඳුනාගෙන නැති තැනැත්තා යි. බුදුරජාණන් වහන්සේ සිත පිළිබඳ මෙසේ දේශනා කළා.

"චිත්තං භික්ඛවේ අභාවිතං අපාතෝ භූතං මහතො අනත්ථාය සංවත්තති"

මෙහි අපට නැවත නැවතත් සිතන්නට ප්‍රායෝගික ජීවිතයට ඉතා වැදගත් වචන දෙකක් තිබෙනවා. 'ඉන් එකක් 'අභාවිත" යන්න යි. එහි අර්ථය සිත හරියට නිවැරැදි ව සංවර්ධනය කර නොමැති බව යි. යහපත් පැත්තට යොමු කර ගෙන නොමැති බව යි. දෙවැන්න "අපාතෝභූතං" යන්න යි. එහි අදහස සිත ධනාත්මක පැත්තට යොමුකර ගෙන නොමැති බව යි. සමහරු යමක් කරන්නට පෙර

"මට මේ වැඩේ නම් කරන්නට බැහැ, එය ඉතා අපහසු දෙයක්. මේ තරම් වැඩ තියෙන අතරේ තවත් වැඩ කොහොම කරන්න ද?

යනාදී වශයෙන් සිතනනවා. මෙබඳු අය නිෂේධනාත්මක සිතිවිලි ඇති අය යි. එහෙත් තවත් කෙනෙක් "මම කුමන අයුරකින් හෝ මගේ අරමුණ ජය ගන්නවා. මට මේ දෙය කරන්න පුළුවන්. උත්සාහ කර බලනවා. කෙසේ හෝ බාධක ජය ගන්නවා." යන සිතිවිලිවලින් යුතුයි. ධනාත්මක සිතිවිලි ඇති අය මේ අයුරින් සිතනවා. බුදු දහමෙහි මෙය හඳුන්වන්නේ ප්‍රාතුර්භූත" කියල යි.

සමහර ළමයි ඉගෙනීමෙහි දක්ෂ යි, සමහරු අදක්ෂ යි. විභාගවල දී අඩු ලකුණු ගන්නවා. ඇතැම් මව්පියවරු සේ ම ගුරුවරු ද අදක්ෂ දරුවා ගේ සිතෙහි ධනාත්මක සිතිවිලි ඇති කරනවා වෙනුවට නිෂෙ 'ධනාත්මක සිතිවිලි ඇති කරනවා.

"අනේ මේ ළමයාට නම් ඉගෙන ගන්න බැහැ. කිසිදෙයක් හිතේ හිටින්නෙ නැහැ. මොන තරම් පාඩම් කළත් වැඩක් නැහැ. ගණන් හදන්න බැහැ. විද්‍යාව බැහැ. අපරාදෙ වියදම් කරන්නෙ, තේරුමක් නැහැ."

ආදී ලෙස කුඩා කාලයේ සිට ම දෝෂාරෝපණය කරමින් දරුවා ගේ සිතේ නිෂේධනාත්මක ආකල්ප වර්ධනය කරනවා. එහෙත් මවක ගේ, පියකු ගේ, ගුරුවර වැඩිහිටියන් ගේ වගකීම වන්නේ, එවැනි දරුවෙක් වේ නම් දුර්වලතා මඟහැර වීමට උත්සාහ කිරීමත්, දරුවා දිරිමත් කිරීමත් මිස තව තවත් දරුවා අධෛර්යවත් කිරීම නොවෙයි.

" පුතාට පුළුවන්. තව තවත් මහන්සි වන්න. අමාරු පාඩම් නිතර නිතර අධ්‍යයනය කරන්න. පාඩම්වලට හොඳට ඇහුම්කන් දෙන්න. එතකොට හොඳට ඉගෙන ගන්න පුළුවන්".

මෙසේ උනන්දු කළේ නම්, ඒ සිතිවිලි දරුවා ගේ සිතේ තැන්පත් වෙනවා. ඒ අනුව ධනාත්මක සිතිවිලි ඇතිවනවා. ධනාත්මක, වගේ ම නිෂේධනාත්මක සිතිවිලි ද මෙලොව ජීවිතයටත්, සසර ගමනටත් බලපෑම් කරන්නට පුළුවන්. ඒ, එම සිතිවිලි ගලේ කෙටුවා වගේ සිතේ රඳා පවතින නිසයි. නිතර ධනාත්මක සිතිවිලි සංවර්ධනය කර ගැනීමෙන් අප ගේ දුර්වලතා හදා ගන්නට පුළුවන්.

දීපංකර පාද මූලයේ දී සුමේධ තවුසාණන් කළ අධිෂ්ඨානය ධනාත්මක යි. එතුමා නිතර ඒ ගැන සිතුවා. මතු බුදුවන්නට අවශ්‍ය දේ විමසා බැලුවා. බාධක හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාදාමයන් අනුගමනය කළා. එහි ප්‍රතිඵලය, බලාපොරොත්තු වූ ඉලක්කය සපුරා ගැනීම යි. ඕනෑම කෙනකුට ධනාත්මක සිතිවිලි ඇති කර ගෙන ඊට අදාළ ක්‍රියාදාමයන් වෙහෙසත්, මහන්සියත් නො බලා, බාධක මැඩගනිමින් ඉදිරියට ක්‍රියාත්මක කරනවා නම්, ඒ යහපත් අරමුණ ඉටුකර ගැනීම අපහසු වන්නේ නෑ.

මෙයට මූලික වන්නේ තමන් ගේ සිතයි. සිත නිතර එහෙ මෙහෙ දුවනවා. එක් තැනෙක රැඳෙන්නේ නෑ. රඳවා ගැනීම ද අපහසු යි. සිත විකෘති කරන අංශ පහක් ධර්මයෙහි සඳහන් කරන තිබෙනවා. මතක ශක්තිය නැතිවීමට ද මෙම කරුණු පහ ප්‍රධාන වශයෙන් ම බලපානවා. ඉන් පළ මුවැන්න ආශාව යි. ආශාව, කාමය වැඩි වූ විට බුද්ධිය යටපත් ව හැඟීම් ඉදිරියට එනවා. දැනීම යට යනවා. කල්පනා ශක්තිය අඩුවෙනවා. නුවණින් විමසා බලන්නට අපහසු වෙනවා. එවිට වැරැද්ද – නිවැරැද්ද පෙනෙන්නේ නෑ. මවුපිය වැඩිහිටියන් අවවාද කළ ත් ඒවා බැහැර කරනවා.

විවිධ පාට වර්ග මිශ්‍ර වූ වතුර බේසමකින් කණ්ණාඩියකින් බලන ආකාරයට මුහුණ බැලිය නොහැකි යි. මේ අයුරින් ම කාම සිතිවිලිවලින් යුක්ත තැනැත්තාට යම් දෙයක නියම ස්වරූපය දැක ගත නොහැකි යි. දෙවැන්න ක්‍රෝධය යි. වෛරය, තරහ ව ලෙස ද හඳුන්වන්නේ මෙය යි. ධර්මයෙහි ව්‍යාපාදය ලෙස මෙය හඳුන්වා තිබෙනවා. මේ සිතිවිලි වර්ධනය වූ විට ප්‍රකෘතිය විකෘති වෙනවා. එවිට බුද්ධිය, අවබෝධය නැතිව යනවා. හැඟීම්වලට බර වනවා. ඔවුනොවුන් අඬදබර කර ගන්නේ, සියදිවි නසා ගන්නේ, ගැටුම් උග්‍ර වන්නේ මේ හැඟීම් පාලනය කර ගත නොහැකි ව ඇත්ත තත්ත්වය නොදැකීම නසයි. රත් වූ , බුබුළු දමන දිය බඳුනකින් තමන් ගේ මුහුණ බැලිය නොහැකි වනවා වගේ

ද්වේෂයෙන් යුක්ත සිතකින් සත්‍ය ස්වභාවය පෙනෙන්නේ නෑ.

සිත විකෘති කරන තුන්වැනි අංගය සිතේ ගිලන් බවයි. සිතිවිලි දුබල කරන, අප්‍රාණික කරන, ආකර්මන්‍ය කරන, හකුළුවන මේ ස්වභාවය ථීනමිද්ධ යනුවෙන් ධර්මයෙහි සඳහන් වෙනවා.කම්මැලි ව, අලස ව, නිදිමත ස්වභාවයෙන් සිටින පුද්ගලයාට යම්කිසි වැදගත් අරමුණක, වැඩක යෙදෙන්නට නොහැකියි.

දියසෙවෙල් බැඳුණු දිය බඳුනකින් මුහුණ නිවැරැදි ව දැක ගත නොහැකි වනවා වගෙයි. ඔහුගේ සිතට නිදහසක් නෑ. සිත සිරගෙයක් වගෙයි. කිසිදු වැඩක් කරන්නට සිතෙන්නේ නෑ. ඔහුට තිබෙන්නේ නිද්‍රාශීලි සිතක්.

වික්ෂිප්ත බව හා පසුතැවිල්ල සිත විකෘති කරන හතරවන අංගය යි. මෙවැනි සිතක එකඟ බවක් නෑ. නොසන්සුන්කාරියි. සිත එක අරමුණක පවත්වන්ට නොදී විවිධ අරමුණු කරා සිත විසුරුවනවා. සුළඟින් සෙලවෙන දිය බඳුනකින් මුහුණ බැලිය නොහැකි සේ සිතෙහි පැහැදිලි බවක් නෑ. සුළඟින් සෙලවෙන කොඩියක් වගෙයි. දියෙන් ගොඩට දැමූ මාලුවකු වගෙයි. අවුල් වූ සිතට ඉගෙනීමක් කළ නොහැකියි.

පස්වන අංගය සැකය යි. බුදුරජාණන් වහන්සේ සධාරණ හෙවත් කරුණු සහිත සැකයට අනුමැතිය දී තිබෙනවා. බුද්ධාදී අටතැන් පිළිබඳ අවිශ්වාස බව සැකය හෙවත් විචිකිච්ඡාව යි. මඩ මිශ්‍ර වූ දිය බඳුනකින් මුහුණ බැලිය නොහැකි සේ සැකය නිසා යම් දෙයක් පැහැදිලි ව දැකිය නොහැකි යි. පංච නීවරණයන්ගෙන් තොර ව ඔබේ සිත පවත්වා ගත හැකි නම් ඔබට ඕනෑම දෙයක සත්‍ය ස්වභාවය තේරුම්ගත හැකි වනවා. ඔබේ මතකයත්, නිවැරැදි අවබෝධයත්, නිර්මාණශීලි චින්තනයත් ගොඩනඟා ගත හැකි වන්නේ එවිට යි.

# දුරින් ඉඳන් ළඟින් ඉමු

**කෙනකු ගේ ළඟින් හිඳිමින් දුක සැප බෙදාගැනීම සාමාන්‍ය ජීවිතයේ ස්වභාවය යි. ගෘහ ජීවිත ගත කරන අය ලෙස එසේ සිටීම වරදක් නොවේ.**

එහෙත් යම් සුවිශේෂී අවස්ථාවන්ට මෙන් ම දේශයට, කාලයට අනුව වෙනස් විය යුතු අවස්ථා තිබෙනවා. එවැනි විටෙක එයට අනුගත වෙන්නට ම ඕනෑ. බොහෝ දෙනෙක් සමීපවීම යන්න වරදවා වටහාගෙනයි සිටින්නේ. සමීපවීම කියන්නේ උරෙන් උර ගැටී, එක බත්පත අනුභව කොට, තුරුල්ලේ සිටීම නොවේ. දහමට අනුව අපට එකිනෙකාට සමීප වීමට බොහෝ අවස්ථා තිබෙනවා.

අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ සුවිදූර සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ අපට බොහෝ ඈත ඇති කාරණා 04ක් ගැනයි.

අහස, පොළොව,සමුද්‍රයේ එතෙර මෙතෙර, සූර්යයා හා සත්පුරුෂ, අසත්පුරුෂ ධර්ම යි.

බැලූ බැල්මට මෙම හතර දුර වූව ද සමීපව පවත්වා ගෙන දෙලොව අභිවෘද්ධිය සකසා ගත් ඇත්තන් ද දුලබ නොවෙයි. මෙහි දී බොහෝ දුර වන්නේ සත්පුරුෂ ධර්මයි. එහෙත් එයට සමීප ව ආධ්‍යාත්මය මෙන් ම, භෞතික පැත්ත ද වඩා ශක්තිමත් කර ගත් පිරිස් ද නැත්තේ නොවේ.

ආර්ය භූමින්වලට පත්වීමට සත්පුරුෂ සේවනය අත්‍යවශ වන අතර සතර අපායෙන් මිදීමට අසත්පුරුෂ සේවනය දුරු කළ යුතු වෙනවා. යමකු සත්පුරුෂ සේවනයට සමීප වන්නේ නම්, සියල්ල තමන්ට සමීප ව පවත්වා ගන්නට පුළුවන්. සූර්යයා බොහෝ දුර වූව ද ප්‍රයෝජන අඩු වන්නේ නෑ. ඒ ඉන් ප්‍රෙයෝජන ගන්නට සිතන දක්ෂයාටයි.

ආධ්‍යාත්මික ප්‍රතිපදාව ගෙන බැලුවත්, විමුක්ති ලාභය ලැබීමට පළ මුව තමන් ආත්මාර්ථකාමී වන්නට ඕනෑ. ඇතැමෙක් ආත්මාර්ථකාමීත්වය නරක දෙයක් ලෙස දකිනවා. වරද වන්නේ ආත්මලාභය සහ ආත්ම තෘෂ්ණාව යි. තමන් කුමන තත්වයක දී හෝ අනෙකාට අයහපත් නොවී දියුණුවක් ලබයි නම්, එය අගය කළ යුතුවනවා. තමා ගේ දියුණුවක් නැති ව අනෙකා ගේ දියුණුව සැලසීම කළ නොහැකි නිසයි. තමන් කියන දේට ජීවගුණයක් එකතු නොකොට කටයුතු කිරීම තුළ තමන් අන් අය ගේ හැල්ලුවට, උපහාසයට ලක්වීම නොවැළැක්විය හැකියි.

තථාගතයන් වහන්සේ දේශනා කළේ තමන්ට කිඹුල්වතින් හමන සුළඟත් සැපයි කියලයි. එසේ දේශනා කළත් උන්වහන්සේ කිඹුල්වත ම රැඳී සිටියේ නෑ. ඥාතීන් විසින් පූජා කරන ලද නිග්‍රෝධාරාමයේ පවා වැඩ සිටියේ ඉතා අඩු කාලයක්. එහෙත් උන්වහන්සේ ඥාතීන්ට සමීප වුණා. එසේ සමීප වූයේ ගතින් නොවෙයි. තමන් අවබෝධ කොට ගත් උතුම් සත්‍යය අවබෝධ කොටදීමෙනුයි. ඒ සමීපවීම දෙ ලොව වැඩදායක යි. කෙනකුට සමීප වෙනවා යනු ඔහු ගේ හෝ ඇය ගේ හෝ දෙලොව අභිවෘද්ධිය පිණිස කටයුතු කිරීම යි. ගතින් සමීපවීම තුළ කෙනකුට ජීවිත තර්ජනයක්, රෝග බිය හෝ රෝග ව්‍යාප්තියක්, සිදු වන්නේ නම්, එවන් සමීපවීමට වඩා දුරින් සිටීම පින් ලැබීමට හේතු වෙනවා.

තව පිරිසකට සමීප වනවා යනු ඔවුන් සමඟ සිටීම නොවෙයි. ධර්මයෙහි දක්වා ඇති පරිදි පංචබලි සිදු කිරීමයි. ඥාතීන්ට, ආගන්තුකයන්ට, මියගිය ඥාතීන්ට සිදුවිය යුතු යුතුකම් ඉටු කිරීමත්, රජයට බදු ගෙවීමත් මත ඒ ඒ කොටස්වලට සමීපවිය හැකියි. එසේ නොමැති ව ඔවුන් සිපවැළඳ ගැනීමට යාම අනුචිතයි. ළඟින් සිටියත් ඔවුනට අනුග්‍රහය පිණිස නො පවතින්නේ නම්, එය දුරස්වීමක් ලෙසයි සැලකිය හැකි වන්නේ. ගතින් දුරස්වූව ද ඒ යුතුකම් සිදු කරන්නේ නම් වඩාත් ළංවීමක් වනවා. වර්තමානයේ අවශ්‍ය වන්නේ ත් එවැනි ළංවීමක්.

තමන් පරිභෝජනය කරනවා සේ ම මව් පියන්ට, ඥාති අසල්වැසි අයට ද පරිත්‍යාග කිරීම සතුටක්. මෙවන් කාලයක අනෙකාට සමීපවීමට ඇති ඉතා හොඳම ක්‍රමය එය යි. මෙවන් කාලයක දී පවා අඩුලුහුඩුකම් නැති ව තමන්ට යමක් ලැබෙනවා නම්, ඇත්තෙන් ම ඔබ සසර එවැනි බෙදාහදාගැනීම් සමඟ ජීවත් වූ කෙනෙක්. කෙනකුට තිබෙන ලොකුම ගින්න බඩගින්න යි. එය නිවාලීම තරම් සමීපවීමක් තව ඇත්තේ නෑ. ඒ වගේ ම තමන් වෙනත් ගෙදරකට යාමත් ඔවුන් තමන් ගේ නිවසට ඒමත් මේ කාලයේ දී නවතා දමා මෙවන් යුතුකම් තුළ සමීපවීම තහවුරු කරගත යුතු වනවා.


ස්වාමි භාර්යාවන් ද කොහේ කොතනක සිටියත් දෙදෙනා නො ඉක්මවා කටයුතු කරන්නේ නම්, එම බැඳීම අධ්‍යාත්මික එකක් බවට පත් කරගත හැකියි. නිවසේ සිටිය ද ආධ්‍යාත්මික බැඳීම නැතිනම් ඔවුන් බොහෝ දුර සිටිනවා වගෙයි.

යසෝධරාව දුරින් සිටිය ද නිරන්තර ව බෝසතාණන් වහන්සේට සමීප ව සිටියා . උන්වහන්සේ එක වේලක් වැළඳද්දී ඇය ද එක් වේලක් පමණක් ආහාර ගත්තා. විවිධ යෝජනා හමුවේ දී පවා තම සැමියා වෙනුවෙන් ම ජීවත් වුණා. දුරින් ඉඳන් ළඟින් ඉඳීමට මීට වඩා පරමාදර්ශී චරිතයක් නැති තරම්. සියල්ල මනාව තේරුම් ගැනීම තුළ දුරින් සිටියත්, ළඟින් සිටීමට හැකි බව සිතමින් තමන් ගේ යුතුකම් ඉටු කරනවා නම් මේ රෝග උවදුරු සහිත කාලයේ අපට සතුටින්, සැනසීමෙන් ජීවත් වන්නට පුළුවන්.



කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**





# අන්න බලන් පුතු පියතුමො වඩිතෙයි

රන්සිරි පා පියුමයි
සක් ලකුණින් බැබළෙයි
චාමර චත්‍ර දෙපා සරසයි
අන්න බලන් මගෙ රාහුල පුතුනේ
ඔබ පියතුමො වඩිතෙයි
බුදු පදවිය ලබලා
සැකිකුල සුකුමල වූ
දෙතිස් ලකුණු සැපිරූ
දෙව් බඹු මිනිසුන් වැඳුම් ලැබූ
ඇත් රජු විලසින් පියතුමො වඩිතෙයි
පොඩි රාහුල පුතුනේ

නිලඹර පුන් සඳකි
වට රන් තරු රැසකි
සව්වන් මැද සදහම් දෙසති
පියුම් විලක රන් පියුමකි පියතුමො
පොඩි රාහුල පුතුනේ

නරසීහ ගාථා ඇසුරිනි

ආචාර්ය **රත්නපාල වික්‍රමසිංහ**

# මහ ඉසුරෙන් උඩු මහලේ සැඟවී පැණි කොමු පිස කෑවේ ලූ



පෑලියගොඩ
විද්‍යාලංකාර පිරුවෙන්හි ආචාර්ය
කැලණිය විශ්ව විද්‍යාලයේ
සිංහල අංශයේ අංශාධිපති,
ආචාර්ය
**මල්වානේ චන්දරතන හිමි**

**සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් වැනි දීර්ඝ සසර ගමනක කළ පර්යේෂණයේ දී ගෞතම බෝධිසත්වයන් වහන්සේ පසක් කරගත් යතාර්ථයක් වන්නේ සත්වයා ගේ සසර ගමනට තෘෂ්ණාව ඉවහල් වන බව යි.**

උත්පත්තියට ප්‍රධාන හේතුව තෘෂ්ණාව නම් එකී හේතුව නැති කළ කල්හි ඉපදීම ද නැවැත්විය හැකි බව හේතුඵල දහමේ ප්‍රධානතම න්‍යාය යි.කෙසේ වෙතත් මිනිසා තෘෂ්ණාවෙහි ම ඇලී ගැලී වාසය කිරීමට වැඩි කැමැත්තක් දැක්වීම සසර ගමනෙහි නිමාවට ඇති එකම බාධකය යි. බුදුන් වහන්සේ ආසවක්ඛය ඤාණයෙන් අවබෝධ කොට ගත්තේ ද කෙලෙස් ප්‍රහීණ කළ තැන සැනසීම ලැබෙන බව යි.

කොපමණ වස්තුව ලැබුණ ද මිනිසා සෑහීමකට පත් වන්නේ නැත. එසේ ම අතෘප්තිකර ය. සැමවිට ම තෘෂ්ණාවෙහි ම දාසයන් බවට පත් වී ජීවත් වන බව රට්ඨපාල සූත්‍රයේ දී "ඌණො ලොකො අතිත්ථො තණ්හා දාසො" යනුවෙන් සඳහන් වේ. එම නිසා මිනිසා තෘෂ්ණාවෙන් මුදවා ගෙන සාධු පැහැපත් දැහැමි මාවතකට යොමු කිරීමට ආගම දහම මෙන් ම සිංහල සාහිත්‍ය ද අපමණ වෙහෙසක් ගෙන ඇත.

එකී සාහිත්‍ය යම් කෙනෙක් මැනවින් භාවිත කරන්නේ නම් මෙම අති බිහිසුණු සංසාර සාගරයෙන් එතෙර වීමට හැකියාව තිබෙන බව සත්‍යයකි. එකී සදුපදේශයන් සම්ප්‍රදානය කිරීමේ මෙහෙවරෙන් ප්‍රශස්ත මෙහෙවරක් නූතන ගීත සාහිත්‍ය තුළ ද අන්තර්ගත ව පවතී. පරාක්‍රම කොඩිතුවක්කු කිවිඳුන් විසින් රචනා කළ, රෝහණ වීරසිංහයන් ගේ තනු නිර්මාණයෙන් සැරසුණ, සුනිල් එදිරිසිංහයන් විසින් ගැයෙන "සොර දෙටුවෙක් කස තැළුම් කකා" යන ගීතය මෙහි දී අප ගේ විශේෂ අවධානය යොමු වන්නේ යථෝක්ත යතාර්ථය සමඟ පවතින සමීපතම ඥාතිත්වය හේතු කොට ගෙන ය.

**"සොර දෙටුවෙක් කස තැළුම් කකා**
**දං ගෙඩියට ගෙන යන ගමනේ**
**වධක බෙරේ දැක සොරා ගන්න එය**
**කදිමයි ලොබ සිතුවාලු**
**අනේ මෙහෙ තණ්හාවක් අනේ මෙහෙ ආශාවක්"**

සොරකම් කිරීම වරදකි. එය පාප කර්මයකි. සමාජ ස්ථරය බිඳ හෙළන අසම්මතයකි. ලෝකයේ බොහෝ සිර ගෙවල් පිරී පවතින්නේ මෙම අසම්මත ක්‍රියාවට පෙළඹී ගිය සිත් ඇති මිනිසුන්ගෙනි. එම නිසා ම අතිශය බිහිසුණු සමාජයක් අප ඉදිරියේ නිර්මාණය වී ඇත. සොරකමට පුරුදු ව, වරදකරු වූ මිනිසා දං ගෙඩියට යන ගමනේ දී වැයෙන වධක බෙරය ද ඔහුට සොරා ගැනීමට සිතෙන බව කවියා මෙහි දී පවසයි. ඔහුට තව මොහොතකින් උරුම වන්නේ මරණය යි. ඒ බව දැන දැනත් තෘෂ්ණාවේ ම දාසයන් බවට පත් වූ සිතකට එයින් මිදීමට ඇති අසීරු බව මෙහි දී පසක් වනු ඇත. එය වඩාත් තීව්‍ර වන්නේ "අනේ මෙහෙම තණ්හාවක් අනේ මෙහෙම ආසාවක්" යන පද්‍ය පාදවලිනි.

එසේ තම මසුරු සිත් ඇති අය ධනය රැස් කරමින්, ඒ හේතුවෙන් ම තම සසර ගමනත් දීර්ඝ කර ගනී. තම ධනයෙන් තමන්ට ත්, අනුන්ට ත් පිහිටක් නැති තද මසුරු සිත් ඇති සිටාණ කෙනෙක් බෞද්ධ සාහිත්‍යයේ ජීවත් වූ බව අප කාටත් මතක ඇත.

> ‘දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටාණන් ගේ කතාව, එසේ ම කුරුණෑගල යුගයේ හතර වැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජු විසින් රචිත සිංහල ජාතක පෙතෙහි එන ඉල්ලීස ජාතකයෙහිත් මසුරු සිටාණන් ගේ කතාවලින් ආභාසය ලබා පරාක්‍රම කොඩිතුවක්කු මෙම ගීතය රචනා කිරීමට ගත් උත්සාහය අතිශයින් ම අර්ථාන්විත ය.’

දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටාණන් ගේ කතාව, එසේ ම කුරුණෑගල යුගයේ හතර වැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජු විසින් රචිත සිංහල ජාතක පෙතෙහි එන ඉල්ලීස ජාතකයෙහිත් මසුරු සිටාණන් ගේ කතාවලින් ආභාසය ලබා පරාක්‍රම කොඩිතුවක්කු මෙම ගීතය රචනා කිරීමට ගත් උත්සාහය අතිශයින් ම අර්ථාන්විත ය.

රජගහ නුවර සක්ඛර නම් නියම් ගමෙහි මච්ඡරිය කෝසිය සිටාණන්ට මුගලන් මහ රහතන් වහන්සේ වැඩම කොට ධර්මාවබෝධය ලබා දුන් කතාව අපි කවුරුත් හොඳින් දනිමු. මෙම මච්ඡරිය කෝසිය සිටාණන් පැණි කොමු උඩු මහලේ සිට සැඟවී අනුභව කරන්නේ තිවසට පැමිණි කවුරුන්ට හෝ දීමට සිදු වේ ය යන සිතිවිල්ලෙනි. අසූ කෙළක් ධනය ඇති මෙම මසුරු සිටාණන් තණ අග ගල්වා තෙල් බිංදුවක්වත් අනුන්ට දීමට තරම්වත් ත්‍යාගශීලි මනසක් නැත.

"තණ අග ගලා තෙල් බින්දුවක් විතරක් අනුන්ට දීලත් නම් සිතට දුක් බවත් හෙයිනුත්" යනුවෙන් සද්ධර්ම රත්නාවලියෙහි සඳහන් වන්නේ ඔහු තුළ පැවති තද මසුරු චින්තනය යි.

**"බුදු පුතෙකුත් පිඬු සිඟා වැඩියහොත්**
**දෙන්නට වේ යැයි සැක සිතිලා**
**මහ ඉසුරෙන් උඩු මහලේ සැඟවී**
**පැණි කොමු පිස කෑවේලු//**

කවියා මෙහි දී උත්සාහ ගන්නේ එකී තණ්හාවෙන් වර්තමන සමාජය මුදවා ගෙන සරල අව්‍යාජ දැහැමි දිවි පෙවෙතකට යොමු කරවීම යි. එම නිසා නිසා ම මෙම ගීත රචකයින් මෙන් ම, ගායකයන් ද සමජ ශෝධකයින් ලෙස ප්‍රශංසා කටයුතු ය.

එසේ ම මෙම සමාජය සුරාව නිසා ජරාවෙන්, ව්‍යාධියෙන් පීඩිත වී ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ. එසේ සුරාවෙන් මත් වූවන්ට යුක්තිය සාධාරණය සංස්කෘතිය කුමක් දැයි තේරුම් ගැනීමට තරම් සුවපත් මනසක් නැත. කවියා මෙහි දී පවසන්නේ කන්දක් මුදුනින් පහළට වැටෙන සුරාවෙන් මත් වූ සුරා සොඬෙක් ගේ චින්තාවලිය යි. බිමට පතිත වන ඔහුට තව මොහොතකින් මරණය පවා උරුම විය හැක. එහෙත් වැටෙන විට ශරීරයෙහි දැවටෙන සුළං රැළි සැපක් ලෙස සිතීමට තරම් ඔහු වික්ෂිප්ත රෝගී සිතිවිලිවලින් පෙළෙන්නෙක් බවට පත් වී ඇත.

**"සුරා සොඬෙක් ගිරි කුළකින් විසි වී**
**මහ පොළොවට පා වී එද්දී**
**ගත දැවටෙන මේ සීත සුළං රැළි**
**අහෝ සැපයි කීවාලු//,**

මෙම සියලු ම පටලැවිලි කවියා දකින්නේ අසීමිත තණ්හාව නිසා ඇති වූවක් බව ය. එකී තෘෂ්ණාව නැති කිරීමේ මාර්ගය බුදු දහම උගන්වන ආර්ය මාර්ගය යි. එම නිසා පරාක්‍රම කොඩිතුවක්කු විසින් රචිත රෝහණ වීරසිංහයන් ගේ තනු නිර්මාණයෙන් හැඩවුණ, සුනිල් එදිරිසිංහයන් ගේ මියුරු හඬින් ගැයෙන මෙම ගීතය බණ පදයකි. මෙම ගීත සාහිත්‍යයන් ස්වකීය සදාදරණීය සහෘදයිනට ආරාධනා කරන්නේ සාධු සම්මත මාවතෙහි පියවර නගමින්, දුශ්චරිතයෙන් වැළකෙන ලෙස යි. එහෙයින් ම මෙ වැනි ගීතවලින් දැනෙන නිරාමිස මිහිර අසීමිත ය.



# මාතෘ භූමියටත් බෞද්ධ භික්ෂූන් වහන්සේටත් එරෙහි ව ත්‍රස්තවාදීන් විසින් ගෙන ගිය අන්තර්ජාතික මතවාද පරාජය කිරීමට දායක වුණා

**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ වජිරවංශ පාර්ශ්වයේ තායිලන්ත නකොන්පතොම් ප්‍රාපතොම්චේදී රජමහා විහාරය සහ අයුත්තයා මහේයොන්ග් භාවනා මධ්‍යස්ථාන උභය විහාරවාසී හෙයියන්තුඩුව මාබිම තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ නිර්මාතෘ අතිපූජ්‍ය ශාස්ත්‍රපති**

**රාස්සගල සීවලී ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**



**තායිලන්තය හා විශේෂ සම්බන්ධතා පවත්වනු ලබන ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් රාස්සගල සීවලී හාමුදුරුවෝ යන නාමය ජන සමාජයේ ප්‍රචලිත යි. එම නිසා ජාතික, ආගමික, සංස්කෘතික වශයෙන් අගය කළ යුතු සුවිශාල කාර්යභාරයක් සිදුකරනු ලබන ඔබ වහන්සේ ගේ කුඩා කාලයේ මතකය අවදි කරමින් අපේ කාතාබහ ආරම්භ කරමු හාමුදුරුවනේ.**

බලංගොඩ රාස්සගල විජිනත්කුඹුර කියන බොහොම සුන්දර ගැමි පරිසරයක උප්පත්තිය ලැබුවා. මගේ මව පියා ශ්‍රද්ධාවන්ත ව, ගුණගරුක ව, ආදර්ශසම්පන්න ව සාමාන්‍ය ගොවි පවුලක ජීවත්වුණ මව්පිය දෙපළක්. අම්ම ගේ ඉල්ලීමත් , මගේ කැමැත්තත් ඇතිව පැවිදිවීමේ අරමුණින් 1972 වර්ෂයේ දී ගාල්ල විද්‍යාරාජ පිරිවෙන් පරිවේණාධිපති ව වැඩසිටි පූජ්‍ය නෙල්ලිවල විමලජෝති මහා නායක හාමුදුරුවන් වහන්සේට බාර කළා. ඒ අනුව ඕපනායක ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දී වතාවත් පුරුදු පුහුණු වෙමින් 1973 වර්ෂයේ ජනවාරි 11 වැනි දා බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නායක හාමුදුරුවන් වහන්සේ ගේ වැඩමවීමෙන් කුල දරුවන් පැවිදි කිරීමේ පුණ්‍යෝත්සවයේ දී සංසාරගත පුණ්‍ය ශක්තියට අනුව රාස්සගල සීවලී යන උත්තරීතර ශාසනික නාමයෙන් පැවිදි ජීවිතයට ඇතුළත් වුණා. අමරපුර වජිරවංශ මහා නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ වැඩමවීමෙන් නෙල්ලිවල විමලජෝති නායක හාමුදුරුවන් වහන්සේ ගේ ආචාර්යත්වයෙන් 1981 වර්ෂයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදා සීලයට පත්වුණ බවත් ගෞරවයෙන් සිහිපත් කළ යුතු යි.

**ඔබ වහන්සේ ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබාගත් ආකාරය පිළිබඳ කෙටි සඳහනක් කරනවා නම්,**

නෙල්ලිවල විමලජෝති නායක හාමුදුරුවන් වහන්සේ ගේ නායකත්වය යටතේ 1973 වර්ෂයේ දී ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය සඳහා ගාල්ල විද්‍යාරාජ පිරිවෙනට ඇතුළත් වුණා. අනතුරුව 1976 දී ඕපනායක විහාරස්ථ අභයරාජ පිරිවෙන 1977 දී හාලිඇල සුධර්මාවාස පිරිවෙන, 1978 දී ගාල්ල විද්‍යාරාජ පිරිවෙන ආදී පරිවේණාස්ථානයන් තුළින් ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය සිදුකරමින් 1981 වර්ෂයේ දී කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් ව 1985 වර්ෂයේ දී සංස්කෘත භාෂා විශේෂවේදී උපාධිය ලබා ගත්තා. තවදුරටත් ප්‍රංශ භාෂාව වසර 4ක් ඉගෙන ගෙන උසස් ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් සම්පූර්ණ කළා. 1988 වර්ෂයේ දී බදුල්ල ඌව මහා විද්‍යාලයට ලැබුණ උපාධි පත්වීමත් සමඟ ගුරු සේවය ආරම්භ කළා. 1996 – 1998 වර්ෂවල තායිලන්ත මහාචූලාලංකාර විශ්ව විද්‍යාලයෙන් බෞද්ධ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තා.

**ඔබ වහන්සේ තායිලන්තය සමඟ සමීප සබඳතාවයක් ගොඩනඟාගත් ආකාරයත්, ඒ තුළින් සිදුකළ සේවයත් පිළිබඳ යම් පැහැදිලි කිරීමක් කරනවා නම්, හාමුදුරුවනේ,**

1988 වර්ෂයේ දී තායිලන්තයට වැඩම කළත්, ස්ථිර වශයෙන් එහි වැඩ සිටීමට තීරණය කළේ 1991 වර්ෂයේ දී යි. 1989 වර්ෂයේ දී තායිලන්ත ප්‍රධාන බෞද්ධ කේන්ද්‍රස්ථානයේ පැවැති ආගමික වැඩසටහනකට වැඩම කළ අවස්ථාවක නකොන්පතොම් නගරයේ රජමහා විහාරයේ නායක ස්වාමීන් වහන්සේ වගේ ම එම පළාත බාර නායක හාමුදුරුවන් වහන්සේ යන දෙනම විසින් එහි වැඩ සිටින ලෙසට සිදුකළ ආරාධනාව එයට හේතු වුණා. ඒ මීට වසර 30 කට පෙර උන්වහන්සේලා ගේ ආරාධනාව බාරගෙන එහි වැඩසිටීමට තීරණය කළ බවයි. ඒ වගේ ම තායි ස්වාමීන් වහන්සේලාට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට කටයුතු කළ නිසා එම සම්බන්ධතාවය වඩාත් බලවත් ව ගොඩනැඟීමට හේතු වුණා.

ඒ වගේ ම තායිලන්ත මහාචූලාලංකාර විශ්ව විද්‍යාලයේ දී ඉදිරිපත් කරන්නට යෙදුණ උපාධි නිබන්ධනය පිටපත් විශාල ප්‍රමාණයක් මුද්‍රණය කරමින් එම විශ්ව විද්‍යාලය විසින් බෙදාහැරීමටත් කටයුතු කළා. ධර්ම දානමය පුණ්‍යකර්මය වෙනුවෙන් පිරුවානා පොත් වහන්සේ ඇතුළු ව ධර්ම ග්‍රන්ථ නැවත මුද්‍රණය කරමින් බෙදා හැරීමට විශාල දායකත්වයක් ලබා දුන්නා. අනතුරුව එම පශ්චාත් උපාධි ආයතනයේ සමාජිකයකු වශයෙන් කටයුතු කළ නිසා මඩිහේ මහානායක හාමුදුරුවන් වහන්සේටත්, 2000 වර්ෂයේ දී එංගලන්ත ලන්ඩන් බෞද්ධ විහාරස්ථානයේ වැඩ සිටි මැදගම වජිරඤාණ නායක හාමුදුරුවන් වහන්සේටත් ගෞරව ආචාර්ය උපාධි ලබාදීමට කටයුතු කළා. 2000 වර්ෂයේ සිට වසර 24 ක් පුරා ස්වර්ණාලේපිත බුද්ධ ප්‍රතිමා වහන්සේ විශාල ප්‍රමාණයක් ලංකාවේ විහාරස්ථාන වෙත පූජා කළා වගේ ම ශ්‍රී ලාංකික කුල දරුවන් විශාල ප්‍රමාණයක් පැවිදි කළා. ජාත්‍යන්තර සංවිධාන කමිටුවල සමාජිකයකුවීම නිසා ම වසර 10 ක් පුරා තායිලන්ත වෙසක් උත්සවය සඳහා ලංකාවේ නියෝජිතයන් අඛණ්ඩ ව සම්බන්ධ කර ගැනීමට අවස්ථාව ලැබුණා.

ඒ වගේ ම කොටි ත්‍රස්තවාදීන් විසින් අපේ අහිංසක ජනතාව, භික්ෂූන් වහන්සේ ඝාතනය කරමින් , බෞද්ධ විහාරස්ථාන විනාශ කරමින් මහා විපතක් සිදුකළ කාල පරිච්ඡේදයේ දී තායිලන්ත තානාපතිතුමා ගේ සහයෝගය ඇතිව ලංකා නාවික හමුදාපතිතුමා ගේ ඉල්ලීම මත තායිලන්ත නාවික හමුදාපතිතුමා ලංකාවට පැමිණි අවස්ථාව සම්බන්ධීකරණය කිරීමට හැකි වුණා. කොටි ත්‍රස්තවාදීන් විසින් අපේ රට විනාශ කිරීමට තායිලන්තය හරහා පවත්වාගෙන ගිය ආයුධ සැපයීම නවතා දැමීමට එම අවස්ථාව විශාල ලෙස ප්‍රයෝජනවත් වුණා. සම්බුද්ධ ශාසනය ආරක්ෂා කළා සේ ම මාතෘ භූමියටත් , බෞද්ධ භික්ෂූන් වහන්සේටත් එරෙහි ව කොටි ත්‍රස්තවාදීන් විසින් ගෙන ගිය අන්තර්ජාතික මතවාද පරාජයට පත්කිරීමට කටයුතු කළා. කොටි ත්‍රස්තවාදීන් විසින් සිදුකළ මහා විපත් වළක්වා ගැනීමට උත්සාහ කළ එම අවස්ථා සිහිපත් කරන විටත් විශාල සතුටක් ඇතිවෙනවා. ඒ වගේ ම 2001 වර්ෂයේ දී තායි – ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය ආරම්භ කිරීමට කටයුතු කළා.

**ලංකාවේ නූතන ශාසනික ප්‍රවණතාවයන් පිළිබඳ ඔබ වහන්සේ දරන මතය කෙටියෙන් පැහැදිලි කරනවා නම්,**

ඒක මුල්තැන දිය යුතු හුඟක් වැදගත් ප්‍රශ්නයක්. මම කවදාවත් භික්ෂූන් වහන්සේ නමක් ලෙස පක්ෂ දේශපාලනය කළේ නැහැ. එය සතර අගතියෙන් එකක්වීම නිසාත්, පොදු වශයෙන් ශාසනයේ විශාල පරිහානියකට හේතු වෙනවා. මම ඒ සඳහා පෞද්ගලික ව එකඟ නැති වුණත්, කවදාවත් මම ඡන්දය පාවිච්චි නොකළත්, පසුගිය කාලය තුළ රට පත්ව ඇති තත්ත්වය සිතා පසුගිය ජනාධිපතිවරණයේ දී ජනාධිපතිතුමාට පක්ෂ ව ඡන්දය භාවිත කිරීමට සිදුවුණා. තායිලන්ත භික්ෂූන් වහන්සේලාට ඡන්දය පාවිච්චි කිරීම තහනම් වෙනවා. එම භික්ෂූන් වහන්සේ මාසයකට දෙවතාවක් පොහොය කිරීම සිදු කරනවා. පසළොස්වක පොහොයට පෙර හිස රැවුල් බානවා. භික්ෂූන් වහන්සේ ධර්ම විනය තුළ රැඳී සිටීම සම්බුද්ධ ශාසනය පණ වගේ ආරක්ෂාවීමට හේතුවක්. තාක්ෂණික දියුණුවත් සමඟ එම තත්ත්වය හොඳින් පවත්වා ගෙන යාමට තායිලන්තය කටයුතු කරනවා. තායිලන්ත සංඝරාජ ස්වාමීන් වහන්සේ කිසිවකු විසින් විවේචනය කරන්නේ නැහැ. උන්වහන්සේ ගේ අනුශාසනය අවසාන අනුශාසනාව ලෙස සියලුදෙනා පිළිගනු ලබනවා මිස වෙනත් මත පළ කරන්නේ නැහැ. සංඝ සාමග්‍රිය හොඳින් ආරක්ෂා කරගෙන යනවා. බුද්ධ කාලීන ක්‍රමවේදයන් තායිලන්තය තුළ තවමත් ක්‍රියාත්මක කරගෙන යනවා. අධ්‍යාපනය ඉතා ම ඉහළින් අගය කරමින් ඒ සඳහා මූලිකත්වය ලබා දෙනවා. ලංකාවේ අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේ දැනුමට පමණක් සීමා නොකර ප්‍රතිපත්ති පූරණය සඳහා භාවනා පුහුණු වැඩ සටහන් අනිවාර්ය අංගයක් කළ යුතු බවට යෝජනා කරන්න මම කැමැතියි. එම රටවල උපාධියේ එක් අනිවාර්ය අංගයක් ලෙස භාවනාව ඇතුළත් වෙලා තිබෙනවා.

හේමමාලා රන්දුනු

# පූනාහැල සද්ධානන්ද නාහිමි



**කොවුල්වැව ශ්‍රී වර්ධනාරාමය, රණස්ගල්ල ශ්‍රී සුධර්මාරාමය යන උභය විහාරාධිපති, විනයාචාර්ය මංගල ධර්මකීර්ති ශ්‍රී සරණපාල ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත පූනාහැල සද්ධානන්ද ස්වාමීන් වහන්සේ වයඹ පහළ දෙළොස් පත්තුවේ ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙති. උන්වහන්සේ ව්‍යක්ත, විශාරද ,බහුශ්‍රැත ,ප්‍රතිබල සම්පන්න සංඝ නේතෘන් වහන්සේ නමක් ලෙස නිරන්තරයෙන් සම්භාවනාවට පාත්‍ර වෙති .අප නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම මස 10 වන දා සිය ජීවන චාරිකාවේ 84 වැනි වියට පා තැබූහ. මෙම ලිපිය ඒ නිමිත්තෙනි.**

සබරගමු පළාතේ කැගලු දිස්ත්‍රික්කයේ පූනාහැල නම් සුන්දර ග්‍රාමවරයේ දී උන්වහන්සේ ගේ ජන්මය සිදු වන්නේ 1938/09/10 වන දින දී ය . පූර්වෝක්ත සුන්දර ගම් පියසෙහි විසූ අයි .ඇම්. පුංචි අප්පුහාමි මහතා ගේ සහ ඩබ්ලිව් .ඇම් . බණ්ඩාර මැණිකේ යන දම්පතීන්ට දාව උපත ලත් මුන්වහන්සේ සහෝදර සහෝදරියන් අට දෙනකුගෙන් යුත් පවුලේ වැඩිමහල් දරුවා ද විය. ක්‍රිස්තු වර්ෂ 1952 අගෝස්තු මස 18 වැනි දින පැවිදි දිවියට පත් වූයේ පූජ්‍යපාද ඇකිරියගල සරණපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ ආචාර්යත්වයෙනි.

උන්වහන්සේ මූලික අධ්‍යාපනය මහනුවර මල්වතු මහා විහාරානුබද්ධ සංඝරාජ මහා පිරිවෙණෙන් ලබා ගත්හ. අනතුරුව කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් වූ උන්වහන්සේ රාජකීය පණ්ඩිත උපාධිය එහි දී සම්පූර්ණ කළහ . අනතුරුව අප කතා නායකයාණෝ ප්‍රථම උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළත් වී ඉතාමැනවින් අධ්‍යාපන කටයුතු සිදු කොට ගෞරව ශාස්ත්‍රවේදී උපාධියත් , අනතුරුව කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් පවත්වනු ලබන ශාස්ත්‍රපති උපාධියත් ලබා ගත්හ .

වර්ෂ 1968 දී මහනුවර මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාවට පත්විය. තමා උගත් දෑ ලෝක ශාසනයා ගේ උභයාර්ථය පිණිස යෙදවීමට කල්පනා කළ උන්වහන්සේ 1966 වසරේ දී ගුරු සේවය සඳහා මුල්පත්වීම් ලැබූහ.

ප්‍රථමයෙන් මරදාන ශ්‍රී ලංකා විද්‍යාල මහ පිරිවෙනේ පරිවෙණාචාර්යයන් වහන්සේ නමක් වශයෙන් සේවය කළ අතර, අනතුරුව අධ්‍යාපන පශ්චාත් ඩිප්ලෝමාවත් සමත්වූ උන්වහන්සේ සිය ප්‍රථම පාසල් පත්වීම ලෙස හොරම්පැල්ල මධ්‍ය මහා විද්‍යාලයේ දී ගුරු වෘත්තිය සඳහා අත් පොත් තැබූහ.

අනතුරුව මිනුවන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය , පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය, නාරම්මල මයුරපාද මධ්‍ය මහා විද්‍යාලය, කොළඹ නාලන්දා විද්‍යාලය සහ කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලය යන ජනප්‍රිය පාසල් කිහිපයක ම සේවය කොට දහස් සංඛ්‍යාත දරු දැරියන්හට ඥාණාලෝකය ලබා දී වර්ෂ 1997 දී විශ්‍රාම ලැබූහ .




අප සද්ධානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ කොළඹ නාලන්දා විද්‍යාලයෙහි වසර පහළොවක් පමණ අඛණ්ඩ ව සේවය කළහ . නාලන්දා විද්‍යාලයීය වාර්ෂික සංග්‍රහය , 50 වන ස්වර්ණ ජයන්තිය හා 60 වන වාර්ෂික සංග්‍රහය යන කෘතිවල සංස්කාරක ලෙස කටයුතු කළ උන්වහන්සේ නාලන්දා විද්‍යාලය පිළිබඳ දුර්ලභ තොරතුරු රාශියක් ඒවායෙහි පළකොට තිබේ . වර්ෂ 1973 දී ආනන්ද නාලන්ද ක්‍රිකට් සැමරුමේ 50 වන ස්වර්ණ ජයන්තිය මැනවින් පළ කිරීමට සමත් වූ බව අදටත් උන්වහන්සේ සිහිපත් කරන්නේ අතිශය සතුටකින් යුක්ත ව ය. එකල විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන් වූ අනුර රණසිංහ , යොහාන් ගුණසේකර , අසංක ගුරුසිංහ , මහේල ජයවර්ධන සහ කුමාර ධර්මසේන යන මහත්වරු උන්වහන්සේගෙන් අධ්‍යාපනය ලැබූවන් ය. උන්වහන්සේ යටතේ අධ්‍යාපනය ලැබූ බොහෝ උදවිය අද වන විට රටේ පිළිගත් ක්ෂේත්‍ර රාශියක ම ඉහළ තනතුරුවල කටයුතු කරනු දැකීම උන්වහන්සේට මහත් ආත්ම තෘප්තියක් ගෙන දෙන්නක් බව නිතර සිහිපත් කරති. විශ්‍රාම ලැබීමෙන් පසුව උන්වහන්සේ අදටත් නාලන්දා විශ්‍රාමික ගුරු සංගමයේ සාමාජිකයෙක් වශයෙන් කටයුතු කරති.

> ‘උන්වහන්සේ යටතේ අධ්‍යාපනය ලැබූ බොහෝ උදවිය අද වන විට රටේ පිළිගත් ක්ෂේත්‍ර රාශියක ම ඉහළ තනතුරුවල කටයුතු කරනු දැකීම උන්වහන්සේට මහත් ආත්ම තෘප්තියක් ගෙන දෙන්නක් බව නිතර සිහිපත් කරති.’

අප සද්ධානන්ද නායක හාමුදුරුවන් වහන්සේ රජයේ ලියාපදිංචි ග්‍රාමීය ප්‍රජා සංවර්ධන පදනම පිහිටුවා සමාජ සේවා කටයුතු රාශියක් සඳහා ම මූලිකත්වය ලබා දුන්හ. එසේම සමථ මූල මණ්ඩලය සාමාජිකයකු ලෙස පසුගිය වසර දක්වා ම උන්වහන්සේ කටයුතු කළහ.

එසේම කුලියාපිටිය නැඟෙනහිර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු සභාපති ස්වාමීන් වහන්සේ වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කළහ.

අප කතානායකයාණන් වහන්සේ විසින් මෙබඳු වූ ලෝක ශාසනික කටයුතුවල නිරත වන ආකාරය කල් තියාම දුටු

මල්වතු මහා විහාරයෙන් වයඹ දිසාවේ පහළ දෙළොස් පත්තුවේ ප්‍රධාන සංඝනායක පදවිය පිරිනැමිණ. තමන් වහන්සේගෙන් පසුව ලෝක ශාසනික කටයුතුවල නොබියව මුහුණ දියහැකි ශිෂ්‍ය පිරිසක් බිහිකිරීමට හැකිවීම ද උන්වහන්සේ ගේ ශාසනික ජීවිතයේසුවිශේෂත්වයකි.

උන්වහන්සේ ගේ ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේ ලෙස නිට්ටඹුව, දඹදෙණිය සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි පීඨාධිපති , දර්ශනපති , මැදවල සරණපාල හිමියන්, නක්කවත්ත ජාතික පාසලේ ධර්මාචාර්ය, ශාස්ත්‍රපති දීගල්ලේ සෝමවංස හිමියන් , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක, රාජකීය පණ්ඩිත කරපුටුගල කුසලධම්ම හිමියන්, ඉඹුල්ගොඩ අරියවංශ හිමියන් සහ බිබිලේ නාරද හිමියන් යන ශිෂ්‍යවරයන් වහන්සේ සඳහන් කළ හැකි ය.

ස්වකීය ජීවිතයේ වසර හැත්තෑවකට පමණ ආසන්න කාලයක් ලෝක ශාසනික අභිවෘද්ධිය වෙනුවෙන් නිරන්තරයෙන් වෙහෙසී කටයුතු කළ පූජ්‍යපාද පූනාහැල සද්ධානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට දිගාසිරි ලැබේවා.

පුහුලේ ශ්‍රී බැබිලවනාරාම රාජමහා විහාරාධිපති,ගිරිඋල්ල
ශ්‍රී සංඝරක්ඛිත මහ පිරිවෙන්
පරිවේණාධිපති, ශාස්ත්‍රපති,පණ්ඩිත
**මැද්දේපොළ සෝමරතන හිමි**

9 පිටුවෙන්

## මිනිසුන් ගේ මෙන් ම දෙවියන් ගේ ද...

අව්‍යාජ ඇවතුම් පැවතුම් ඇති ව ජීවිතය සකසා ගැනීම ගිහි පැවිදි කාටත් සතුටට හා සමගියට හේතු වේ. ගිහි ගෙවල ඇති වන බොහෝමයක් ප්‍රශ්නවලට ප්‍රධාන හේතුවක් වන්නේ ද සඨභාවය යි. සුදුසු තැන විවෘත වීම හා සත්‍ය ප්‍රකාශ කිරීම මඟින් පුද්ගලයා භාවනීයයෙක් වේ.

මායාවී නොවීම සමගියට, මානනයට හා ප්‍රිය භාවයට හේතුවන සත්වන කාරණය යි. තමා කළ පාපය සැඟවීම මායාවී භාවය යි. සිදු වූ වැරැද්ද පිළිගැනීමත්, යළි එම වැරැද්ද නොකිරීමත් මඟින් පුද්ගලයකුට මෙලොව දී ම ප්‍රශංසා ලැබේ. එහෙත් වැරැද්ද පිළිගැනීමට තරම් නිහතමානී නොවීම බොහෝ දෙනා ගේ බලවත් අඩුපාඩුවකි. කවුරුන් ඉදිරියේ වරද වසන් කළත්, තමා තුළින් මතුවන පසුතැවීම හා දුගතිභය වැළැක්විය නොහැක. මායාව හා සාඨෙය්‍ය යන දුර්ගුණ දෙක පුද්ගලයකු ගේ ගෞරවය හා කීර්තිභාවය මුලුමනින් ම පාහේ වනසා දමයි. මායා සඨෙය්‍යෙයන් යුත් පුද්ගලයකුට වුව ද එබන්දකු ප්‍රිය නොවේ. අමායාවී පුද්ගලයකුට ප්‍රිය නොවීම ගැන අමුතුවෙන් කිව යුතු නොවේ. එබැවින් සමාජයෙන් ගරු බුහුමන් ලැබීමට හා සමගිය වර්ධනය කිරීමට තමා පළමුව මායා සාඨෙය්‍ය හැර දමා අන්‍යයන් ද එම දුර්ගුණයන්ගෙන් බේරා ගත යුතු ය.

නව ලෝකෝත්තර ධර්මය අවබෝධ කර ගැනීම පිණිස කටයුතු කිරීම ගරු බුහුමන් ලැබීමට හේතු වන අට වන කාරණය ලෙසත්, ධ්‍යාන වැඩීම හෙවත්, පටිසල්ලාහය නවවන කාරණය ලෙසත් වදාරා ඇත. ධ්‍යාන හා මගඵල ලාභී පුද්ගලයා අත්‍යන්තයෙන් ම සිල්වතෙක් වන බැවින් ඔහු අතින් කිසිදු අධ්‍යාචාරයක් සිදු නොවේ. ජන සමාජයේ පූජනීය පුද්ගලයා ද ඔහුම ය.

මධුර මනෝහර සදහම් පිළිසඳර ඇති බව සමගියට හා සාමයටත්, ගෞරවයට හා පැසසුමටත් ඍජුව ම හේතු වන දසවන කාරණය ලෙසත් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරා ඇත. සිල්වත්, ප්‍රියශීලි, දහම් කතා ඇති ව අව්‍යාජ සිනාවකින් මුව සරසා ගත් පැවිද්දා ද , අවංක, නිහතමානී හා සීලාචාර සම්පන්න ගිහියා ද යන දෙදෙනා හේතුවෙන් ගෞතම බුදුසසුන තවත් බොහෝ කලකට ආයු ශ්‍රී ලබනු ඇත. ඔබත් එම මහාර්ඝ සත් ක්‍රියාවේ සාමාජිකයෙක් වීමට බලාපොරොත්තු වේ නම් ඉහත කී දසවැදෑරුම් සත්පුරුෂ ධර්මයන් ජීවිතයට ගළපා ගන්න.

“චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මාසම්බුද්ධසාසනං“



# අපමණ දුක් කරදර වින්දත් ඕනෑම කාන්තාවකට වන්දනීය චරිතයක් වන්නට පුළුවන්

**බිනර මාසය කියන්නේ බොදු කාන්තාවන්ට ඉතා සුවිශේෂී මාසයක්. ඒ, භාග්‍යවතුන් වහන්සේ සම්බුද්ධ ශාසනය පිහිටුවීමෙන් පසුව, එම ශාසනයේ කසාවතක් පොරවාගෙන විමුක්තිය සොයන කාන්තාවන්ට එය ඉටුකර ගැනීමට පුළුවන් වූයේ බිනර පෝ දවසක වීම නිසයි.**

මේ බුද්ධ ශාසනයේ පුරුෂයෙක් පැවිද්ද සොයා ගෙන ආවා නම්, ඒ පැවිද්ද කාන්තාව පැවිදි වෙනවාට වඩා බොහෝ ලෙහෙසි වූ වා. උපතිස්ස කෝලිත දෙදෙන පැමිණ ධර්මය ශ්‍රවණය කළ පසු භාග්‍යවතුන් වහන්සේ "භික්ෂුව මේ මනාව දේශනා කළ ධර්ම විනයෙහි හැසිරෙන්න" කියා ඒහි භික්ෂු භාවයෙන් උපසම්පදාව දෙන විට හිස කෙස් අතුරුදන් ව කහ චීවරයක් පෙරවුණා. එය ඒහි භික්ෂුභාවයෙන් පැවිදි උපසම්පාදව ලැබීම යි. එහෙත් කාන්තා පැවිද්ද මෙහි එන්න කියා දුන් එකක් නොවේ. එය ආයාචනා කරමින් ගත් එකක්. ඉතා දුෂ්කර ව ලබා ගත් එකක්. ඒ තරම් දුෂ්කරවයි කාන්තා පැවිද්ද ලැබුණේ. එය අප තේරුම් ගන්නට ඕනෑ. නිතර සිහි කරන්නටත් ඕනෑ.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩම කර නිග්‍රෝධාරාමයේ වැඩ සිටියා. එහි පැමිණි මහා ප්‍රජාපතී ගෝතමී දේවිය

"ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, සම්බුද්ධ ශාසනයේ උතුම් පැවිද්ද අපටත් ලබා දෙන සේක්වා" යි ඉල්ලා සිටියා. භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළා. තව වතාවක් ඉල්ලා සිටියා. එවිටත් ප්‍රතික්ෂේප කළා. තවත් වතාවක් ඉල්ලා සිටියා. එයත් ප්‍රතික්ෂේප කළා. ප්‍රජාපතී දේවිය ගේ ඉල්ලීම තුන් වතාවක් ම ප්‍රතික්ෂේප වුණා.

එතුමිය උත්සාහය අත්හැරියේ නෑ. තවත් කාන්තාවන් පන්සියයක් සමග "අපි පැවිදි වෙමු" කියා අධිෂ්ඨාන කර ඔවුන් ගේ දිගු කෙස් කපා දමා, තනිව ම කසාවත් පොරවාගෙන, මැටි පාත්‍රය අතට අරගෙන රජ මාළිගාවෙන්, සිටු මාළිගාවලින් පහළට බැස්සා. මහ පාරට ආවා. අපි පැවිද්ද සොයා ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත යමු කියා කතිකා කරගෙන වීදිදිගේ ඇවිද ගියා. අව්වේ දැවෙමින්, දහඩිය දමමින් ගමන් කළා. ගිනියම් මහ පාරේ පාවහන් නොමැති ව ගමන් කළා. කකුල් පැලී ලේ ගලන්න ගත්තා. කිසි දිනෙක සිනිඳු පාවහන් නොමැති ව පොළොව මත අඩිය නොතැබූ මේ සියුමැලි කාන්තාවෝ කිඹුල්වත් පුර සිට විශාලා මහනුවරට පා ගමනින් ම ගියා. එදා භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටයේ විශාල මහනුවර කූටාගාර ශාලාවේ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි විහාර ගේට්ටුව අසල මේ කාන්තාවන් පිරිස වාඩි වුණා. මේ අය ගේ දෙපා රත් පැහැ වෙලා. ලේ ගලමින් තිබුණේ. කුසගින්න, පිපාසය නිසා ඉතා පීඩාවට පත් වෙලා සිටියේ. වෙහෙසකර බවයි පෙනෙන්නට තිබුණේ. පැවිදි වීමේ අපමණ බලාපොරොත්තුවෙන් ඒ කුල කාන්තාවෝ ඇස්වල කඳුළු පුරවාගෙන විහාරය දෙස බලා ගෙන සිටියා.

ආනන්ද හාමුදුරුවන් වහන්සේට මේ සිදුවීම දැන ගන්නට ලැබුණා. එතැනට වැඩම කළා. "හිස බා, කසාවත් හැඳ මෙසේ ඇඩි වෙහෙසකින්, දුක්මුසු ව සිටින්නේ ඇයි?" කියා ගෝතමී දේවියගෙන් විමසා සිටියා.

"ස්වාමිනි ආනන්දයන් වහන්ස, තථාගතයන් වහන්සේ කාන්තාවන්ට ගිහි ගෙයින් නික්මී පැවිද්ද ලැබීමට අනුමත කරන්නේ නැහැ. අප ආවේ කාන්තා පැවිද්ද ඉල්ලීමට යි". ගෝතමී දේවිය පැවසුවා.

එවිට දයා කරුණාවෙන් ආනන්ද හාමුදුරුවන් වහන්සේ

"ගෞතමියනි, මෙතැන ම සිටින්න. මම තථාගතයන් වහන්සේ වෙත ගොස් කාන්තාවකට ගිහි ගෙයින් නික්මී උතුම් පැවිද්ද ලැබීමට පුළුවන් ද කියා අසා එන්නම්" කියා භාග්‍යවතුන් වහන්සේ වෙත වැඩියා.

"ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, කාන්තාවන්ට ගිහි ගෙයින් නික්මී බුද්ධ ශාසනයේ පැවිදි බව ලබා ගන්න බැරි ද?"

"ආනන්ද කාන්තාව ගිහි ගෙයින් නික්ම පැවිද්ද ලබා ගැනීම ගැන ඔබට රුචි නොවේවා".

ආනන්ද ස්වාමින් වහන්සේ දෙවැනි තෙවැනි වතාවත් හිදීත් කාන්තා පැවිද්ද ඉල්ලා සිටියා. භාග්‍යවතුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළා.

ඉන්පසු ආනන්ද හාමුදුරුවන් වහන්සේ සහ බුදුරජාණන් වහන්සේ අතර මෙබඳු සංවාදයක් ඇති වුණා.

"භාග්‍යවතුන් වහන්ස, තථාගතයන් වහන්සේ වදාරණ ලද ධර්ම විනයෙහි මේ ගෞතම බුදු සසුනේ කාන්තාවක් ගිහි ගෙයින් නික්මී පැවිදි වුවොත් ඇයට සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, රහත් ඵලයන් ලබන්නට බැරි ද?"

"ආනන්ද, තථාගතයන් වහන්සේ වදාළ ධර්ම, විනය තිබෙන බුද්ධ ශාසනයක කාන්තාවක් වුව ද පැවිදි වුවොත් ඇයට සෝවාන්, සකෘදාගාමී, අනාගාමී මෙන් ම රහත් ඵලයටත් පත්වෙන්න පුළුවනි".

"භාග්‍යවතුන් වහන්ස, එසේ කාන්තාවකට පැවිදි වී මඟපල ලබන්න පුළුවන් නම්, මේ ප්‍රජාපතී ගෞතමිය ඔබ වහන්සේ කුඩා කාලයේ හුගක් උදව් කළානේ. ඔබ වහන්සේ කුඩා කාලයේ උකුලට අරගෙන පෝෂණය කළා. තුරුලේ තබා ගෙන නැළෙව්වා. අනේ භාග්‍යවතුන් වහන්ස, කාන්තාවන් මේ සසර දුකෙන් එතෙර වීම මනා ය" යැයි පැවසුවා. ඒ අවස්ථාවේ භාග්‍යවතුන් වහන්සේ කාන්තා පැවිද්දට කැමැති වුවත් එය එකවරම ලබා දුන්නේ නැහැ. "ඔවුන්ට මනාව පැවිද්ද කරගෙන යා නොහැකි යි. එනිසා ආනන්ද ගෞතම බුදු සසුනේ පැවිද්ද ලබන කාන්තාවට මම අෂ්ටගරු ධර්ම පනවනවා. එය පිළිගන්නවා නම් ගෞතමී ගේ පැවිද්ද ලැබේවි".

තථාගතයන් වහන්සේ පෙන්වා දුන්නා.

"ආනන්ද, ගෞතමිය ඇතුළු පිරිස මේ ගරු ධර්ම රැකීමට කැමැති නම් මෙය යි ඔවුන් ගේ පැවිද්ද. මෙය යි උපසම්පදාව". බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නා.

ආනන්ද ස්වාමින් වහන්සේ මේ සියලු විස්තර ගෞතමියට කියා සිටියා. එවිට ගෞතමිය කියනවා

"ස්වාමිනි, ආනන්දයන් වහන්ස, ලස්සනට ඉන්න ආශා කරන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අලංකාර මානෙල් මල් හෝ දෑසමන් මල්වලින් ගොතා, ලස්සන මල් මාලයක් දෝතින් ගෙන හිස මත රුවා ගන්නවා වගේ මම ජීවිතය තිබෙන තුරාවට මේ කරුණු රැක ගැනීමට පිළිගන්නවා" කියා. එය තමා ප්‍රජාපති තෙරණිය ගේ උපසම්පදාව. එතැනින් තමා කාන්තා බුදු සසුන අරම්භ වූයේ.

එදායින් පසු රජමාලිගාවල සිටි, සිටුමාලිගාවල සිටි, දුගී පැල්පත්වල සිටි, කාන්තාවන් පැවිදි වූ වා. සැඩොල් කුලය, ගොවි කුලය, වෛශ්‍ය කුලයේ කාන්තාවන් පැවිදි වූ වා. කිසිදු භේදයක් නොමැති ව කසාවත පොරවා ගෙන කාන්තාවන් සසුන් කෙත පෝෂණය කළා. නමුත් එය ලෙහෙසි දෙයක් වූයේ නැහැ.

එයට හේතුව තමා ස්ත්‍රීන් ගේ ස්වභාව ය. ඇය ගේ ස්වභාවය කෙලෙස් බහුල යි. ප්‍රජාපතී ගෞතම දේවිය පදුමුත්තර බුද්ධ ශාසනයේ සිට භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු මව වීමට පින් පුරාගෙන එන උත්තමාවියක්. ඒ වගේ උත්තමාවියෝ ගෞතම බුදුසසුන වටේ රොද බැඳුණා. යශෝධරා, ඛේමා, උප්පලවන්නා, භද්‍රා කුණ්ඩලකේශා, භද්‍රකාපිලානි, පටාචාරා, ධම්මදින්නා ආදී මහා පින්වන්තියෝ රහත් තෙරණින් වහන්සේ බවට පත් වුණා. මහ බ්‍රහ්මයාත් ආකාසයෙන් බැස මේ රහත් උත්තමාවියන් ගේ පාද වන්දනා කරනවා. දෙව් ලොව දෙවියෝ ආකාසයෙන් බැස මේ මහරහත් උත්තමාවියන් ගේ පාද වන්දනා කරනවා. රහත් උත්තමාවියන් ගේ ගුණ කඳ කියමින් වන්දනා කරනවා. විශ්මිත පූජනීයත්වයක්, ගෞරවනීය පූජනීයත්වයක් කාන්තා ජීවිතයට අත්පත් කර දුන්නේ අප ගේ භාග්‍යවතුන් වහන්සේ යි.

බොහෝ කාන්තාවන් රාගයෙන් මත් වෙනවා වැඩි යි, බැඳී යනවා වැඩි යි. කිපෙනවා වැඩි යි. වෛර බඳින ස්වභාවය වැඩි යි. අනුන් ගේ සැපට හූල්ලමින් ඊර්ෂ්‍යා කරන ස්වභාවය වැඩි යි. මසුරු බව වැඩි යි. මුදලට වෙනස් වන ගතිය වැඩි යි. කාන්තාව එකටෙක කරන ස්වභාවය වැඩි යි. ගුණ මකන ස්වභාවය වැඩි යි. කාන්තාව ගේ සිතෙහි සැලෙන ස්වභාවය වැඩි යි. පසුතැවීම, වැළපීම වැඩි යි. අඥෝනා වැඩි යි. මෙලෙස දුර්ගුණ රාශියක් තබා ගෙන තමා සාමාන්‍ය ස්ත්‍රිය ජීවත් වෙන්නේ. නමුත් සසරේ කල්ප ගණනක් පෙරම් පුරා ගෙන ආ උත්තමාවියෝ ස්ත්‍රී සිතක උපදින සියලු දුර්ගුණ, බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම මාර්ගයෙන් නසා දැමුවා. කිසිදු දුර්ගුණයක් නැති සියලු ගුණයන්ගෙන් පිරිපුන් උත්තමාවියන් බවට පත් වුණා.

කාන්තාව ගේ ස්වභාවය ගැන දේශනාවක මෙසේ සඳහන් වෙනවා. සියලු නදී වක් වී ගලනවා. සියලු වනයන් හි ඇම්ණෙන දේ තිබෙනවා. ඒ වගේ සියලු ස්ත්‍රීන් අවස්ථාව ආ විට වරදේ බැඳෙනවා කියා. නමුත් මේ උතුම් කාන්තාවන් බුද්ධ ශාසනයක් මුණ ගැසුණ වෙලාවේ, මේ ලෝකයේ සියලු දුර්ගුණ නසා, පරිපූර්ණ ගුණයන්ට පත් ව අරහත්වයට පත්වීමට පුළුවන් වෙලාවේ, රහසේවත් වරදක් නො කර, රහසේවත් පාපයට නැමෙන්නේ නැති පාපයන් සියල්ල දුරු කළ පරම පවිත්‍ර තත්ත්වයට පත් වුණා.

එ නිසා මේ බිනර පෝය අපට විශේෂ යි. කාන්තාවන් වූ අපට උදාර වූ කාන්තා පැවිද්ද ලබා දීමට ඉදිරිපත් වූ ඒ බුද්ධ මාතාවට නමස්කාර කළයුතු දවස බිනර පෝ දිනය යි. බුද්ධ මාතාව ගෞරවයෙන් සිහිපත් කළ යුතු දවස යි මේ. බුද්ධ මාතාවට නමස්කාර කරමින් උතුම් ගුණ ධර්ම පිරිය යුතු දවස යි.

එහෙම නම් මේ බිනර පෝය මුල් කර ගෙන අපි අධිෂ්ඨානයක් ඇති කර ගත්තොත්, ඒ කාන්තා පැවිද්දට පුරෝගාමී වූ තෙරණින් වහන්සේ පුදන්න, සත්කාර කරන්න මමත් අද ප්‍රතිපත්ති පූජාවේ යෙදෙනවා කියා සිතන්න එය අපට මුළු ජීවිත කාලයට ම පිහිටට පවතීවි.

නයනා නිල්මිණී



# එළාර රජු ගේ උපදෙසින් සියලු සේනාංක සීරුවෙන් තබයි

දුටුගැමුණු මහ රජතුමා 47

**සෙනවියකු ලෙසින් නොව සාමාන්‍ය පුරවැසියකු ලෙස බෝ මලුවට පිවිසි සිරිනාග සැමට ම ආචාරශීලී ව බෝධි පූජා කටයුතුවල නියැළුණේ ය. දන්ති ගේ මෙහෙයවීම මත සිරිනාග තමන් වෙත කැඳ වූ කෘෂ්ණා කුමරිය ගැමුණු කුමරු ගේ තොරතුරු දැන ගැනීමේ කැමැත්ත පල කළා ය.**

"රහස් තොරතුරු හැටියට නොවෙයි. සුහද ව ගැමුණු කුමාරයා ගේ තොරතුරු දැන ගන්නටයි මට උවමනා කී ඇය මදහස පෑවා ය.

"සිරිනාග, තවත් කලක් මාගම සිටියා නම් අපට තවත් තොරතුරු රැසක් දැන ගන්නට තිබුණා. චරපුරුෂ සේවයට යැවීමට සුදුසු පුද්ගලයන් දැන් නැති තරම් යැයි දීඝාභය නිතර ම කියනවා." දන්ති කුමරිය කීවා ය.

"කැපවීමෙන් කටයුතු කරන අය දැන් අඩුයි. බල තණ්හාවයි, නිල තණ්හාවයි නිසා රට ජාතිය ආගම ගැන දැන් අපේ හැඟීම් අඩුවෙලා."

"සිරිනාග කියන දේ හරි. අපේ පිය රජතුමාට සේවය කරන වැඩි පිරිසකට ඒ කියමන ගැළපෙනවා"

කෘෂ්ණා කුමරිය ගේ අදහස් පිළිබඳ සිරිනාග පුදුමයට පත්විය. ඇය තවදුරටත් කතා කළා ය. "දුටුගැමුණු කුමාරයා රජරට අල්ලා ගන්නට එනවා. ඒ ඔහු ගේ පරපුරේ අයිතිය ලබා ගන්නට යි. රට එක්සේසත් කර සිංහලයන්ට යහපත් අනාගතයක් ලබාදීම කාගෙන් හෝ සිදු වෙන්නට ඕනේ. දීඝාභය, සිරිනාග, මිත්‍ර සෙනෙවි ඉන්නේ වැරැදි පිළක. වැරැදි තීන්දුවක"

"කුමරිය ඔබතුමිය මට තේරුම් ගන්නට අපහසු යි. ඔබ පියතුමා ගේ අදහස් අනුව නොවෙයි ද කටයුතු කරන්නේ?"

"නැහැ සිරිනාග, කොහෙත්ම නැහැ. මගේ පියතුමාට මා නිතර ම පවසන්නේ සොළී පාලන ක්‍රමය ඉවත් කර ගන්නා ලෙසයි. දුටුගැමුණු රජතුමා රට එක්සේසත් කරන කර්තව්‍යයට සහයෝගය දී එතුමා ගේ යටතේ රජ කෙනකු ලෙස දිගටම රජකම් කරන ලෙසයි. ඒ අදහස ඉදිරිපත් කරන හැම වෙලාවක ම පිය රජතුමා කෝපයෙන් බැන වැදී මා එළවා ගන්නවා."

"සිරිනාග බෝධි පූජාව සූදානම්." සිටු දේවිය පැමිණ පැවසුවා ය. සිරිනාගට තවත් යමක් කතා කරන්නට ඇත්නම් හොඳ යැයි සිතුණි.

මල් පුදා, පහන් දල්වා, දිය කළ රැගෙන බෝධිය ප්‍රදක්ෂිණා කර බෝධිය නහවා වන්දනාමාන කර එම කටයුතු අවසන් කිරීමට හෝරාවක පමණ කාලයක් ගතවිය.

සිරිනාග සියලු දෙනාගෙන් සමුගෙන බෝ මලුවෙන් පිටව අසු පිටට නැඟ සම්මන්ත්‍රණ ශාලාව දෙසට අසු මෙහෙය විය. තොරතුරු දැනගැනීමට පැමිණ සිටි සෙනෙවිවරුන් හා සෙබළුන් සමඟ කතා බහ කළ සිරිනාග උත්සාහ කළේ මාගමට දන්වා යවන්නට වැදගත් තොරතුරක් අනාවරණය කරගන්නට ය.

එළාර රජු ගේ සහෝදරියක ගේ පුතකු වන කුන්ඩිල එහි දී හඳුනා ගැනීමට ලැබීම සිරිනාග ගේ සතුටට හේතු විය. ඔහු සෙනෙවි තනතුරක් ලැබ ඇතුළු නුවර ආරක්ෂක කටයුතු භාරගැනීමේ අපේක්ෂාවෙන් සිටියේ ය.

"සිරිනාග සෙනෙවි බොහෝ දක්ෂයකු බව මට දීඝජන්තු කීවා. ඇතුළු නුවර ආරක්ෂක කටයුතු භාරව සිටින ඔබතුමාට ඉදිරියේ දී ඊට වැඩි වගකීමක් පැවරේවි. මීළඟ යුද මණ්ඩල රැස්වීමේ දී බොහෝ තනතුරු වෙනස් වේවි." කුන්ඩිල කීවේ මද සිනහවක් සමඟ යි.

"දුටුගැමුණු රජතුමා අප සමඟ යුද්ධ කිරීමට ගමන් ආරම්භ කරලා ලු. ඒ නිසා අපේ බලකොටුවල සියලු සේනාංක සීරුවෙන් තබන ලෙසට රජතුමා අණ කර තිබෙනවාලු."

කුන්ඩිල කීවේ තමන් ද රජතුමා ගේ තීරණය පිළිබඳ බොහෝ කරුණු දන්නා බව හඟවමිනි. සිරිනාග මහාසිව මාහිමියන් වෙත ලියා යවන්නට සුදුසු තොරතුරු කිහිපයක් එකතු කරගෙන අනතුරුව අසු මෙහෙය වූයේ මිත්‍ර මහා සෙනෙවි ගේ මන්දිරය දෙසට ය.

මේ වන විට ඔහු මන්දිරයේ නැති බව දන්නා සිරිනාගට එය වඩාත් හොඳ අවස්ථාවක් බව අවබෝධ විය. රාත්‍රී භෝජන සංග්‍රහයට පැමිණීමට නොහැකි බව සෙනෙවි බිරිඳට පැවසීමට තීරණය කළේ ය.

අසු මුර සෙබළුනට පැවරූ සිරිනාග සෙනෙවි මන්දිරයේ ආලින්දයට ගොඩවිය. තමා එන බව දුටු සමන්ති මැතිණිය ඉදිරියට පැමිණියා ය.

"සිරිනාග ඇතුළට එන්න. මහා සෙනෙවිතුමා එන්නට තවත් හෝරා කිහිපයක් ගතවේවි."

"මැණියනි, මට ලැබුණු හදිසි පණිවුඩයක් නිසා අද රෑම විජිතපුර යාමට සිදු වී තිබෙනවා. අද රාත්‍රී භෝජනයට පැමිණීමට නොහැකි බව දැනුම් දීමටයි පැමිණියේ."

"මේ රෑම විජිතපුර යනවා නම් රාත්‍රී ආහාරය ගෙන යන එක හොඳයි."

"මැණියනි, මම වෙනත් දිනයක රාත්‍රී භෝජනය සඳහා පැමිණෙන්නම්."

"හොඳයි සිරිනාග, එහෙනම් අපි ඔබට වෙන දවසක ආරාධනා කරන්නම්"

"මැණියනි, මට යාමට අවසර"

"සිරිනාග, නුඹට හදිස්සියක් නැත්තම් නුඹ සමග රහසින් කතා කළ යුතු කරුණක් තිබෙනවා."

"අද රාත්‍රී කොයි වෙලේ හෝ මා විජිතපුර යා යුතුයි. යා යුතු වෙලාවක් සඳහන් කර නැහැ. දීඝාභය කුමාරයා ගේ ඉල්ලීමක්. නමුත් මට ටික වේලාවක් මෙහි රැඳෙන්නට පුළුවන්."

ඇය කී සැණින් තමාට වැදගත් වන යමක් දැනගත හැකි වනු ඇතැයි සිරිනාගට සිතිණි.

"අපි එළිමහනට ගොස් කතා කරමු. බිත්තිවලටත් කන් තිබෙන බව මා අසා තිබෙනවා"

දෙදෙනා මන්දිරයෙන් ඉදිරි පඩි පෙළ බැස ඉදිරියට පිය නැඟුහ. වම් පස කුඩා උද්‍යානයකි. මල්වලින් පිරුණු මෙය ඉතා ප්‍රියමනාප පරිසරයක් විය. කලකට ඉහත දී පුණ්ණා සමග ගත කළ සන්ධ්‍යාවන් සිරිනාග ගේ මතකයට නැඟිණි. ඒ මිහිරි අතීතයට සමු දුන්නේ කෙතරම් අවාසනාවන්ත ලෙස ද?

පුණ්ණා මගෙන් ඈත් වුවා නොව තමන් පුණ්ණාගෙන් ඈත් වීම වඩා සත්‍ය බව ඔහුට හැඟිණි. ඇය ගේ මැණියන් මේ සූදානම් වෙන්නේ ඒ ගැන විමසන්නට දැයි ඔහුට සැකයක් මතුවිය. කිරිගරුඬ අසුනක හිඳගත් ඇය ඒ ඉදිරිපස වූ වේවැල් පුටුවක හිඳගන්නා ලෙස ඔහුට පැවසුවා ය.

"පුතා, යුද පුහුණු කඳවුරට යන්නට පෙර මෙහි බොහෝ කාලයක් නැවතී සිටියා. මිත්‍ර, තමන්ගේ ම දරුවකුට වගේ සිරිනාගට ආදරය කළා. පුණ්ණා දුවත් පුතාට කැමැත්තෙන් හිටියා. නමුත් අද ඒ සියල්ල වෙනස් වෙලා."

"නැහැ මැණියනි, මිත්‍ර මහා සෙනෙවිතුමා නිසා මම යුද ශිල්පය හොඳින් ඉගෙන ගත්තා. මට සෙනවියකු ලෙස උසස්වීමක් ලැබුණේත් එතුමා නිසා. මට හොඳ නිල නිවාසයක් ලැබුණා. නමුත් එහි පදිංචියට නොගිය නිසා සෙනෙවිතුමා අමනාපයෙන් පසුවෙන්නේ. ඉක්මනින් එහි පදිංචියට යනවා."

"එපා පුතා, එහි යන්න එපා. මිත්‍ර සෙනෙවිතුමා දැන් ඉන්නේ ඔබ සමඟ බලවත් අමනාපයකින්. සිරිනාග දැන් ඔබ ඉන්නා තැන ආරක්ෂා සහිතයි."

"මැණියනි, එතුමාට දක්වන ගෞරවයේ අඩුවක් වෙලා නැහැ. එතුමා මට පවරන වගකීම් පැහැර හැරීමක්වත් මගෙන් සිදුවෙලා නැහැ.

"නැහැ පුතා, මිත්‍ර ගේ බලාපොරොත්තුව ඔබව යොදාගෙන ඔහු ගේ වරප්‍රසාද දිනා ගැනීමයි. එය වරදින විට ඔහු කාගෙන් වුවත් පළිගන්නේ දරුණු විදියටයි. ඔබ දීඝාභයටත්, දීඝජන්තුටත් හිතවත් ව කටයුතු කිරීම ඔහුට ඉවසන්නට බැරි වෙලා"

"මැණියනි, දීඝාභය මෙහි එන්නට පෙර අනුරාධපුරයේ පැවැත්වූ චරපුරුෂ සේවය ගැන මිත්‍ර මහා සෙනෙවි තුමාට කියන්න හිතාගෙන සිටියා. නමුත් ඊට කලින් මහ රජතුමා ගේ නියෝගයකට අනුව දීඝජන්තු සෙනවිතුමා පැමිණ කලින් තොරතුරු දැනගෙන ගියා."

"ඒ කොහොම වුණත් පුතා ඔබ පරිස්සම් වෙන්න. මිත්‍ර මොනවා හෝ දන්නා දෙයක් සඟවන බව පෙනෙනවා. ඔබ ගේ මව ගේ මරණය පිළිබඳ කුමක් හෝ රහසක් දන්නා බව හැඟෙනවා."

**අයන්ති විතාන**

පිටු සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ
**කාශ්‍යප බණ්ඩාර**



## ජීවාගේ ලෝකය

බටුවන්ගල රාහුල හිමි ලියන යොවුන් නවකතාව

2 කොටස

# ජීවා ඔයා හරි අපිරිසුදුයි

**(මෙම ලිපියේ පළමු කොටස තිකිණි පුර පසළොස්වක පෝදා පත්‍රයේ පළ විය)**

**ඔයා පිරිසුදුව උපන් ළමයෙක්. ඔයා අපිරිසුදු වෙලා හොඳට ම. කවුද ඔයා අපිරිසුදු කළේ...? ඔයා ම යි ඔයා ව අපිරිසුදු කරගෙන...**

ජීවාට අම්මත් එක්ක ටිකක් කේන්ති ගියා.

"අම්මාගෙන් ලැබිච්ච නරක ආදර්ශ තමයි ඉතිං ඒවා..." ජීවා අම්මාට ඇනුම් පදයක් කියන්න ලැබෙන තැන ඒක මූණට දමලා ගැහුවෙ හරි සතුටින්.

"ඔයා කොහොමද එහෙම කියන්නෙ.........? මට පිළිවෙළකට ගේ තියාගන්න බැරි ඔයාලා හින්දා. මගෙ කාමරේ සම්පූර්ණයෙන් විනාශ කරන්නෙ තාත්තා. තාත්තා ගෙ ඔෆිස් ඇඳුම්, බඩු මට හැමදාම හදන්නැකි ද?' අම්මා වැරැද්ද අනිත් අයට පැවරුවා. ජීවාට හිතුණා නිශ්ශබ්ද වෙන එක හොඳයි කියලා.

රාත්‍රියේ ජීවාට තිබ්බිච්ච ඊ-මේල් ලිපිය පටන් අරගෙන තිබුණේ ජීවගෙන් ප්‍රශ්න වගයක් අහලා.

නැඟිටින මන්තරේ

'ජීවා ඔයා උදේ නැඟිටින්න කැමති කීයට ද?'

'ඔයා නැඟිටින්නෙ කීයට ද?'

'හරි සරල ප්‍රශ්න දෙකක්. උදේ පහ වෙනකොට නැඟිටින්න කැමතියි. ඒත් නැඟිටින්නෙ හයහමාරට. ඉස්කෝලෙ යද්දි නම් පහමාරට ඇහැරුණා. ඒක මට හරිම වදයක්...' ජීවා ඉක්මනින් උත්තරයක් ඇරියා.

ජීවාට පිළිතුරක් ලැබුණේ පැයකට පස්සෙ. ජීවාට කාමරේ පුරා හරි නැවුම් ගතියක් දැනෙන්න පටන් අරගෙන. මුළු කාමරේ පුරා පෙරළි පෙරළි ඉන්න හිතෙනවා. කාමරේ ලොකු ඉඩක්, හරි පිළිවෙළක්, නැවුම් බවක්. ජීවාට කියවන්න එපා වෙලා තිබ්බිච්ච සටහන් කියවන්න ආසාවක් ඇති වෙලා... ඒත් ඒවා මතක තියාගන්න ගියා ම එපා වෙනවා. විද්‍යා විෂයයන් ඉගෙන ගනිද්දී ට වඩා කලා විෂයයන් ඉගෙන ගන්න එක ලේසියි කියලා හිතුණොට ඒවාත් ඒ වගේ ම යි. අර මගේ පණ්ඩිත යාළුවාගෙන් අහන්න ඕන ක්‍රමයක්. ඇත්තට ම මං ආස අවවාද අනුශාසනාවලට වැඩිය ක්‍රම කියා දෙනවාට. ප්‍රතිඵලය ලබා ගන්න හැටි පෙන්නලා දෙනවාට.

ජීවා තම අභ්‍යන්තරය දෙසට එබී බලයි.

'ජීවා ... ඔයාට ලියන මේ ලිපිය ටිකක් දිග එකක්. ඒත් මං හිතනවා ඔයා කැමැත්තෙන් කියවාවි කියලා. ඉස්සෙල්ලම කියන්න ඕන මං ඔයා ගැන හොඳින් දන්නා බව. ඔයා ඉගෙන ගන්න ළමයෙක්. මෙතෙක් ඉගෙන ගත්ත දේවල් කුමක් සඳහා ද? කියලා මං ඇසුවොත් ජීවා ඔයාට දෙන්න පිළිතුරක් තියෙනවා ද? හිතන්න ඒ ඔයා වෙනුවෙන් තියෙන දේවල් ද? කියලා. ඔයාගෙ මුළු අධ්‍යාපනයෙ ම තිබුණේ අනුන් සතුටු කරවන දේවල් කියලා ඔයාට හිතිලා නැද්ද? ඔයා කැමති



දේවල් ලබා ගන්න, ඔයා කැමති විදියට ජීවත් වෙන්න ඔයාට ලැබිච්ච දැනුම අඩුයි කියල ඔයාට දැනෙනව ද?. මං ඔයා ගෙ මොළේ හෝදන්න හදනවා නෙවෙයි. ඒ කතාව අපි පැත්තකින් තියමු. පිරිසුදුකම ගැනනේ අපේ කතාව. මං කියා දෙන්නම් ජීවා පිරිසුදුකමේ කොටස් දෙකක්. පළමු එක කායික පිරිසුදුකම. දෙවැනි එක ආධ්‍යාත්මික නැත්නම් අභ්‍යන්තරික පිරිසුදුකම. ඉස්සෙල්ලා කතා කරමු කායික පිරිසුදුකම. ඔයාගෙ දෙපාවල ඇඟිලි දිහා බලන්න. මීට මාසෙකට ඉස්සෙල්ලා ගාපු කියුටෙක්ස් පතුරු ගැලවිලා. ඔයාගෙ නියපොතු ටිකක් දික් වෙලා.."

ජීවා ලියුම කියවීම පැත්තකින් තියලා කකුලෙ නියපොතු දිහා බැලුවා. දෙයියනේ මේ භූතයා කවුද....? මගේ ළඟ ඉන්නවා වගේ මේවා කියන්නෙ භූතයෙක් ද? ජීවාගේ ඇඟ හිරි වැටිලා. ජීවාගෙ ඇස් ඉබේට ම නැවත වතාවක් ස්ක්‍රීන් එක දිහාවට එල්ල වුණා. කළු පාට පැහැදිලි සිංහල අකුරු... මවුස් එකෙන් ලිපිය ඉහළ යවමින් ජීවා ලිපිය කියෙව්වා.

"...ඔයාට ඔය නියපොතු කපන්න, කියුටෙක්ස් සුද්ද කරන්න යන්නෙ හරි පුංචි වෙලාවක්. මං කියන්නෙ කය පිරිසිදු කරන්න ලේසි බව. ඒක ඔයාටත් තේරෙනවා. මිනිස්සු භෞතික ක්‍රම ඕන තරම් කය පිරිසුදු කර ගන්න නිර්මාණය කරගෙන තිබුණේ අතීතෙ ඉඳලා. ඒත් කය පිරිසුදු නො කර හිත පිරිසුදු කරන්න අමාරුයි. කය පිරිසුදු කරනවා කියන්නෙ කය සතපවන තැන. කය ඇවිද්දවන තැන. කය වාඩි කරවන තැන. කය නිදි කරවන තැන... මේවා තමයි ඉතා ම වැදගත්. එහෙම නම් මේ භෞතික පිරිසුදුකම ඇතුළෙ තව ගොඩක් ජාති තියෙනවා. කය පිරිසුදු කිරීම කියන වචනෙ මං දැන් වෙනස් කරනවා. මං ඒකට මෙතන ඉඳන් පාවිච්චි කරනවා භෞතික පිරිසුදු බව කියලා. ජීවා.... එතෙන්දි කය සැරිසරවන, සතපවන, වාඩි කරවන හැම තැන ම පරිසරය කියලා මං හඳුන්වල දෙන්නම්. ඔයා අද උදේ ම නැවා නේද...? 'ඔව්' ජීවා ලිපිය කියවන ගමන් ඒ ප්‍රශ්නෙට කටින් උත්තර දුන්නා. ජීවා ඔයා ඒ නාවපු කය තියලා තියෙන පුටුව දිහා බලන්න. ඒකෙ යටි පැත්තෙ මකුළු දැල්, ඇඳිවල දූවිලි. ඔයා හෝදපු වස්තුව ඔයා හොඳ තැනක නෙවෙයි නේද? තියල තියෙන්නෙ. "ෂි, ඇත්ත නේන්නම්' ජීවා තමාට ම කියා ගනිමින් ලියුම දිගට ම කියෙව්වා... ඔයාට කිරි වීදුරුවක් දුන්නොත් ඒක වැසිකිළිය ඇතුළෙ ඉඳගෙන බොනව ද? 'චී' කවදාවත් නෑ ඊයා' ජීවාට ඉබේ ම කියවුණා. ජීවා ඔයාට ඊයේ රෑ සලා ද අතරෙ තිබ්ල කෙස් ගහක් හම්බ වුණා නේද...? 'ඔව්' ජීවා ලියුමෙ තියෙන ප්‍රශ්නවලට ළඟ ඉන්න කෙනෙකුට උත්තර දෙනව වගේ උත්තර දෙනවා. 'ජීවා ඔයා කැම නතර කළා... ඒකෙන් කියන්නේ ඔයා පිරිසුදු ව ඉන්න ආසයි. ඒත් ඔයා ඒක කරන්නෙ නෑ. කරන්නෙ නැත්තෙ ඇයි? ඔයා හිතුවෙ නෑ. ඔයාට උවමනාවක් තිබුණේ නෑ. ජීවා ඔයා ඉස්සෙල්ලා ම ඔයාගෙ කාමරේ ලස්සනට තියා ගන්න කැමති වෙන්න. ඒකට ඔයා අමතර කාලයක් ගන්න එපා. අනිත් වැඩ කරන අතරතුර වැඩේ පටන් ගනිමු.....

'අනේ මේක මං කොච්චර අස් කරලා තියෙනවා ද? ඒත් දවස් තුනක් විතර යන කොට ඒක හැඩි වෙනවා. ඒක මගේ වරදක් ද?.

'....ජීවා මං ඔයාට කියා දෙන්නෙ ආයි කවදාවත් ඔයාට කාමරේ අස් කරන්න නො වෙන විදියක්. කැමති නේද...?

" ජීවිතේට ම එක පාරක්.... නෑ... නෑ... ඒක වෙන්න බෑ. එක පාරක් මේ කාමරේ සුද්ද කරල හැමදාමට ම තියා ගන්න... ඒක කවදාවත් කරන්න බෑ".

'ජීවා ඔයාට බුදු සරණයි... ඔයා මට පිළිතුරක් ලියන්න. මං ඉක්මනින් උත්තර ලියන්නම්..'

**ජීවාගේ පිළිතුරු ලිපිය මීළඟ කොටසින්**

# දේවි කුමරිය ගේ උදාර කැපවීම



**කැලණිය රජකම් කළ කැලණිතිස්ස රජු ගේ දියණිය වූයේ 'දේවි' කුමරිය යි. කැලණිතිස්ස රජු විසින්, නිදෙස් වූ මහ රහතන් වහන්සේ නමක් කැකෑරෙන තෙල් කටාරමක් තුළ බහා ජීවිතක්ෂයට පත් කරවන ලදී. මේ පාපකාරී සිදුවීම හේතුවෙන් කෝප වූ දෙවියෝ මහ සයුර කළඹා ගොඩබිමට එවූහ.**

මේ විනාශයෙන් බේරෙන්නට නම්, රජු ගේ දරුවෙක් මුහුදට බිලි දිය යුතු බව නිමිති කියන්නෝ පැවසූහ. කාවන්තිස්ස රජතුමාට සිටියේ එක ම දියණියකි. ඒ 'දේවි' කුමරිය යි. ඇය යොවුන් වියෙහි පසුවන්නී ය.

"මා ගේ එකම දියණිය කෙසේ නම් මුහුදට බිලි කරන්න ද?

රජතුමා ශෝකයෙන් කල්පනා නරන්නට විය. එහෙත් දේවි කුමරිය නිර්භීත ය. රටට දැයට ඇය බොහෝ සේ ආදරය කළා ය. උපන් බිමට සිදු වී ඇති ව්‍යසනය පිළිබඳ ඇයට හොඳින් වැටහුණි.

"පිය රජතුමා ගේ අනුවණ බව ත්, කෝපය ත් නිසා මගේ රටට සිදු වූ අසාධාරණයට අසරණ රට වැසියන් කුමක් කරන්න ද?"

යි ඇය සිතුවා ය. තම පියා කළ අපරාධයට වග කිවයුත්තේ ත්, වන්දි ගෙවිය යුත්තේ ත් තම රජ පවුල මිස අහිංසක රට වැසියන් හෝ අන් කෙනකු හෝ නොවන බව කුමරියට වැටහුණි. එම වරද නිවැරැදි වන්නේ රජ දරුවෙක් මුහුදට බිලි වීමෙන් නම්, ඒ සඳහා ඉදිරිපත් වී රට වැසියන් විපතින් ගලවා ගත යුත්තේ ත් තමන් විසින් ම නම්, තව තවත් බලා සිටීම පලක් නොවන බව කුමරිය කල්පනා කළා ය.

'දේවි' කුමරිය සිය පියා වෙත ගියා ය.

"පියාණෙනි, රට ජාතිය බේරා ගන්නට රජ පවුලේ දරුවකු මහ සමුදුරට බිලි විය යතු නම්, ඒ සඳහා මම කැමැත්තෙමි. ඒ සඳහා නො පමාව අවසර දුන මැනවි'යි ඉල්ලා සිටියා ය.

රජතුමා මහත් පුදුමයටත්, බියටත් පත් විය.

"මහ රජතුමනි, දේවි කුමරිය පවසන්නේ සත්‍යයකි. වහා ඇයට අවසර දෙනු මැනවි"

රට වැසියෝ ඝෝෂා කළහ.

දැන් දේවි කුමරිය මහ සමුදුරට බිලි දීම සඳහා සියලු කටයුතු සිදු වේ. කුමරිය වෙනුවෙන් ම සැදූ රුවල් නැවකි. එහි 'කැලණිතිස්ස මහ රජ තුමා ගේ දූ කුමරිය 'දේවි' යනුවෙන් ලියා තිබුණි.

දරා ගත නොහැකි ශෝකයෙන් රජ තුමා කඳුළු සලන්නට විය.

මහ ජනතාව සිදු වූ විපතක තරම ගැන කියමින් වැළපෙන්නට වූ හ. දේවි කුමරිය රැගත් රුවල් නැව මහ සමුදුරෙහි පා වී යන්නට විය. මහා පුදුමයකි. සියල්ලෝ සැනසුම් සුසම් හෙළන්නට වූයේ මහ මුහුද සන්සුන් වනු දැකීමෙනි.

දේවි කුමරිය රැගත් රුවල් නෞකාව පාවී ආවේ රුහුණේ මාගම්පුර වෙරළට ය. හිමිදිරි උදෑසන කිරින්ද වෙරළට ආ ධීවරයන් මවිතයට පත් වූයේ අසිරිමත් රුවල් නැවක් වෙරළට ගොඩගසා තිබෙනු දැකීමෙනි. එහි සිටි කුමරිය දුටු ඇතැම් කෙනෙක් බියට පත් වූයේ තමන් බිලි ගන්නට දෙවි දුවක් වන් කුමරියක ගේ වේශයෙන් ආ අ යක්ෂණියක් දැ'යි කියමිනි.

" නැ නැ මේ අප රැක ගන්නට ආ දෙවි දුවක්" තවත් කෙනෙක් එසේ කී අයට දෙස් නගමින් පැවසූහ.

අවසානයේ සියල්ලෝ එක් ව ඇය මිනිස් දුවක් ම වන බවට තීරණය කළහ.පිරිස වහා ම කාවන්තිස්ස මහ රජු වෙත ගොස් මේ පුවත සැල කළහ. (ථූපවංසයට අනුව දේවි කුමරිය සහිත රුවල් නැව දුටු පක්ෂීහු රැනක් රජු වෙත මේ බව මුලින් ම සැලකර සිටි බව ද සඳහන් වෙයි.)

පණිවුඩය ලැබූ විගස රජු ඇමති පිරිස ද සමග කිරින්ද වෙරළට සැපත් විය. 'කැලණිතිස්ස මහ රජතුමා ගේ දූ කුමරිය 'දේවි' කුමරිය යනුවෙන් රුවල් නැවෙහි වූ සටහන දුටු කාවන්තිස්ස රජතුමා ඇය තමන් ගේ ඇවැස්ස නැනා බව හඳුනා ගත්තේ ය.

පෙරහරකින් දේවි කුමරිය රජ මාළිගයට කැඳවාගෙන පැමිණි කාවන්තිස්ස රජු, ඇය ගේ නිර්භීත බව පිළිබඳ බොහෝ සතුටට පත් විය. උපන් බිම වෙනුවෙන් ඇය ගේ කැපවීම අගය කළේ ය. කුමරිය තරුණ වියට පත් වූ විට ඇයව විවාහ කර ගැනීමට තීරණය කළේ ය. පසු කලෙක ජනතාව ගේ සුබපැතුම් මැද ඇය සිය අග මෙහෙසිය බවට පත් කර ගත්තේ ය.

ඉතිහාසයේ සඳහන් වන ලෙස දේවී කුමරිය කිරින්දේ ලංකා විහාරය (වර්තමානයේ විහාර මහා දේවි රජමහා විහාරය නමින් හැඳින්වේ.) ආසන්නයේ දී කාවන්තිස්ස රජුට මුණ ගැසුණු නිසා ඇය 'විහාර දේවි' යනුවෙන් හැඳින්වී ඇත. ඇය ශ්‍රේෂ්ඨත්වයට පත්වීමෙන් අනතුරුව 'මහා' යන්න ද එකතු වී 'විහාර මහා දේවි' නම් වූවා ය.

මෙකල ද්‍රවිඩ ජනයාගෙන් සිංහල රට වැසියන්ටත්, වෙහෙර විහාරවලටත් බලවත් ලෙස හිරිහැර කරදර සිදු වූ කාල වකවානුවකි. ක්‍රි. පූ. 205 දී පමණ එළාර රජු දකුණු ඉන්දියාවේ චෝළ දේශයේ සිට මෙහි පැමිණ, අසේල රජු මරා බලහත්කාරයෙන් පිහිටි රට අල්ලා ගත්තේ ය.

දෙමළ වැසියන්ගෙන් අනුරාධපුරය වැනි ප්‍රදේශවල ජීවත් වූ සිංහල වැසියන්ට නිතර ම තාඩන පීඩන විඳින්නට සිදු වුණි. එහෙත් දුර දකින නුවණින් කටයුතු කළ කාවන්තිස්ස රජු ඒ තාඩන පීඩන ඉවසීය. එහෙත් විහාර මහා දේවිය එම තාඩන පීඩන නො ඉවසුවා ය. මේ කාලය වන විටත් විහාර මහා දේවියට පුත් කුමරකු සිටියේ නැත.

"අහෝ මට පුත් කුමරකු සිටියා නම් ද්‍රවිඩයන්ගෙන් මේ රට බේරා ගන්නා ආකාරය මම දන්නවා"



විහාර මහා දේවිය

02 කොටස

ඇය නිතර ම පැවසුවා ය. නිරතුරුව ම ඒ ගැන ම සිතුවා ය. කාවන්තිස්ස මහ රජුත්, විහාර මහා දේවියත් නිරතුරුව ම භික්ෂූන් වහන්සේ බැහැ දැකීමට තිස්සමහාරාමයට ගියහ. බොහෝ පින්කම් කළහ. දවසක් මහ රහතන් වහන්සේ නමකගෙන් විහාරමහා දේවියට දහම් අසන්නට ලැබුණි. එම ධර්ම දේශනාවේ දී, මේ බවයේ සැප සම්පත් ලබන්නේ පෙර කළ පින් ඇති නිසා බවත්, මතු බවයේ දීත් එවැනි සම්පත් ලබන්නට තව තවත් පින්කම් කළ යුතු බවටත් උන්වහන්සේ අනුශාසනා කළහ. ඒ අවස්ථාවේ දී විහාර මහා දේවිය, කුමන සැප සම්පත් ලැබුවත් තමන්ට පුත් කුමරුකු නැතිකමේ පාඩුව ගැන මහත් දුකින් කීවා ය.

"දේවියනි, උසස් ගුණධර්ම රකින සාමණේරයන් වහන්සේ නමක් විහාරයෙහි වැඩ සිටිනවා. උන්වහන්සේ අපවත් වන්නට ආසන්නයි. උන්වහන්සේ සමීපයට ගොස් උපස්ථාන කරන්න. අපවත් වූ පසු ඔබතුමිය ගේ කුසෙහි දරුවකු වී පිළිසිඳ ගන්නැයි ආරාධනා කරන්න" රහතන් වහන්සේ දේවියට පැවසූහ.

ඉතා සතුටට පත් විහාර මහා දේවිය සාමණේරයන් වහන්සේ සමීපයට ගොස් ඉතා ගෞරවයෙන්, මව් සෙනෙහසින් උන්වහන්සේට උපස්ථාන කළා ය. "ස්වාමීන් වහන්ස! අපේ රට ,ජාතිය සහ ආගම දැන් වැටී තිබෙන්නේ බලවත් විපත්තිකර අවස්ථාවකට යි. සොළීන්ගෙන් අපේ රට ජාතිය සහ ආගම බේරා ගැනීම සඳහා විර පුත්‍රයෙක් පහළ විය යුතු අවස්ථාව දැන් පැමිණ තිබෙනවා. ඔබ වහන්සේ ,දරුවන් නැති දුකින් පෙළෙන මගේ පුතකු වී ඉපද මේ මහා විපතින් රට, ජාතිය, ආගම බේරාගනු මැනවි යි' අයැද සිටියා ය. සාමණේරයන් වහන්සේ ගේ බලාපොරොත්තුව වූයේ දිව්‍ය ලෝකයේ උපත ලබන්නට ය. ඒ නිසා මුල දී විහාර මහා දේවිය ගේ ඉල්ලීම පිළිගැනීමට මැළිකමක් දැක්වී ය. විහාර මහා දේවිය, තමා ගේ පුතු ලෙස ඉපිද සම්බුද්ධ ශාසනයට, රටා, ජාතියට විශාල මෙහෙවරක් සිදු කළ හැකි බව සාමණේරයන් වහ්නසේට වටහා දුන්නා ය. මේ ලෙස තුන්වන වරටත් විහාර මහා දේවිය ඉතා බැගෑපත් ලෙස කළ ඉල්ලීම නිසා සාමණේරයන් වහන්සේට එය ඉවත දැමිය නොහැකි විය.

සාමණේරයන් වහන්සේට උපස්ථාන කළ විහාර මහා දේවිය නැවත මාලිගාව බලා පිටත් වූවා ය. ඊට නොබෝ වේලාවකින් සාමණේරයන් වහන්සේ අපවත් විය. ඒ මොහොතේ දේවිය ගමන් කළ රියේ රෝද එක්වරම මහ පොළොවේ එරුණි. විහාර මහා දේවියට අමුත්තක් දැනුණි. වහා ආපසු හැරී විහාරයට ගියා ය.

දීපා පෙරේරා

# යහපත් සතහට සෙත දෙන සුමන සමන් දෙව් මහ රදු



**හෙළ බොදු දනන් ගේ වන්දනීයත්වයටත්, පූජනීයත්වයටත් පාත්‍ර වන දෙව් දේවතාවුන් වහන්සේ අතර සුමන සමන් දෙවිඳුන් සුවිශේෂී ය.**

බුදුරජාණන් වහන්සේ වෙතින් ධර්මය ශ්‍රවණය කොට සෝවාන් බව ලැබූ, මහියංගන චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකිරීමට මුල් වූ, තථාගතයන් වහන්සේට ශ්‍රීපාද ලාංඡනය පිහිටුවන ලෙස ආරාධනා කළ සුමන සමන් දෙවිඳුන් ගේ පිහිට ආරක්ෂාව ප්‍රාර්ථනා කිරීම ඈත අතීතයේ සිට ම සිංහල බෞද්ධයන් ගේ සිරිතකි. විශේෂ ගමනක් පිටත්වීමේ දී විශේෂයෙන් සබරගමු පළාත් වැසියෝ තම දරුවන්ට සෙත් ප්‍රාර්ථනා කරන්නේ "සමන් දෙවියන් ගේ ම පිහිටයි" යනුවෙනි. නින්දට යෑමේ දී ශ්‍රීපාදස්ථානය පිහිටි දිශාවට හිස තබා නිදා ගැනීමටත්, විශේෂයෙන් ම කුඩා කාලයේ සිට ම දරුවන්ට කට පරිස්සම් කර ගැනීමටත් හුරු කරවති.

පළමුවරට ශ්‍රීපාද වන්දනාවේ යන කෝඩුකාරයින්ට ද එම උපදෙස ලබා දීමට වැඩිහිටියන් අමතක නොකරන්නේ දේව උදහසට ලක්වීමට ඉඩ ඇතැයි සිතමිනි.

මැණික්වලට ප්‍රසිද්ධ රුවන් පුරයේ ජනතාව පතල් කර්මාන්තය අරඹන්නට පෙර සමන් දෙවියන්ට බාරහාර වෙති. ඒ අතීතයේ එසේ බාරහාර වීමෙන් බලාපොරොත්තු ඉටු වූ බවට පවතින විශ්වාසය නිසා ය. සබරගමු මහා සමන් දේවාලය නිර්මාණය වූයේ ද සමන් දෙවියන්ට බාර වීමෙන් පසු බොහෝ මැණික් ලැබුණු නිසා යැයි පැවසේ.

දඹදෙණි යුගයේ රාජ්‍ය කරවූ දෙවැනි පරාක්‍රමබාහු රජතුමා ගේ මහා භාණ්ඩාගාරය භාරව කටයුතු කළ අමැතිවරයා රජු ගේ නියමයෙන් රත්නපුරයට පැමිණ පතල් හාරා භාණ්ඩාගාරයට මැණික් සැපයූ බවත්, ඒවා හමුවීමට සමන් දෙවියන්ට බාර වුණ බවත්, තම අභිමතයන් ඉටු වූ බැවින් සබරගමු මහ සමන් දේවාලය කරවූ බවත් ජනප්‍රවාදයේ එයි.

දරුවන් නොමැති කාන්තාවෝ ද සමන් දෙවියන්ට බාරහාරවී දරු සම්පත් අපේක්ෂා කරති. ශාන්ත ගතිවලින් යුක්ත, ධාර්මික දෙවිකෙනකු වන සමන් දෙවියන් බොරු කීම, රැවටීම වැනි වාචික වැරැදිවලට පවා දැඩි දඬුවම් පැමිණවීමට පසුබට නොවන බවට විශ්වාසයක් ද පවතියි. ගැමි ජනයා අධික භක්තියකින් සහ විශ්වාසයකින් දෙවියන් අදහන්නේ කිසියම් ශ්‍රද්ධාව මුසු වූ බියකිනි. ඔවුහු වැරැද්දක් නොවීමට නිතර ම වගබලා ගනිති.


සුමන සමන් දෙවියන් බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රීපාද ලාංඡනය පිහිටි සමනොළ ගිරි හිස වාසස්ථානය කර ගනිමින් දිවි ගෙවන බැවින් සමන්තකූටය, සුමනකූඨය වැනි පර්යාය නම් ද සමනල කන්දට ව්‍යවහාර වේ.

සමන් දෙවියන් ගේ ප්‍රධානම දෙවොල රත්නපුරයේ මහා සමන් දේවාලය යි. දෙවැනියට ප්‍රධානත්වය ගන්නේ මහියංගනයේ සමන් දේවාලය යි. බුදුරජාණන් වහන්සේ ගේ පළමු ලංකාගමනයේ දී සමන් දෙවියන් මහියංගනයට ගිය බව පැවසේ. තමන් ගේ වාසස්ථානය සමනල පර්වතය වුව ත් බුදුරජාණන් වහන්සේ ගේ කේශ ධාතුන් වහන්සේ තැන්පත් කර පුද පූජා පැවැත්වූ හෙයින් මහියංගනයෙහි වාසය කර ඇත.

තෙවැනි වර බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩම කළ අවස්ථාවේ දී තමන් වහන්සේ ගේ වාසභවනට ද වැඩම කරවන ලෙස ආරාධනා කර තිබේ. එම ගමනේ දී ද පළමු අවස්ථාවේ දී මෙන් තමන්ට වන්දනා කිරීමට ශ්‍රීපාද ලාංඡනය පිහිටුවා දෙන ලෙස අයැද තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙසින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ පන්සියයක් මහ රහතන් වහන්සේ සමග වැඩම කර දිව්‍ය–මනුෂ්‍ය ප්‍රජාව ගේ යහපත පිණිස කරුණාවෙන් වම් සිරිපා සලකුණ සුමනකූටය මුදුණේ මැණික් පාෂාණයක් මත තැබූ බව පැවසේ. මහාවංසය සහ සමන්තකූට වණ්ණනාව මෙම පුවත් වාර්තා කරයි. එදින සිට සුමන සමන් දෙවිඳුන් උතුම් ශ්‍රීපාද ලාංඡනය ආරක්ෂා කරමින්, පුදපූජා පවත්වමින් තමන් ගේ ප්‍රධාන වාසස්ථානය බවට සමන්ත කූටය පත්කර ගනියි. මෙවැනි හේතු නිසා සමන් දෙවියන් ස්වදේශීය බෞද්ධ දෙවි කෙනකු වශයෙන් පිළිගැනේ. ප්‍රාදේශීය දෙවියකු ලෙස නොව රටේ සෑම ස්ථානයක ම වෙසෙන බෞද්ධයෝ සුමන සමන් දෙවියන් කෙරේ විශ්වාසය තබමින් පුද පූජා පැවැත්වීමට ත්, බාරහාර වීමට ත් පුරුදු වී සිටිති.

හෙළදිව මනුෂ්‍යයකු ලෙස උපත ලබා ප්‍රාදේශීය රාජ්‍යත්වයක් හිමි කර ගෙන සිටි අයෙකි. බුදුරජාණන් වහන්සේ මහියංගණයට වැඩම කළ අවස්ථාවේ ලබා ගත් කේශධාතු තැන්පත් කර භෞතික ව දාගැබක් ඉදිකරන්නේ ද මනුෂ්‍ය ආත්මයක් ලබා සිටි අයකු ලෙසිනි. ඔහුගේ උතුම් කටයුතු නිසා ම මහජනයා ඔහු ගේ මරණයෙන් පසු දේවත්වයෙන් සලකා කටයුතු කළ බව පෙනේ. සෝවාන් ඵලයට පත්, කරුණාබරිත හදවතකින් යුක්ත නිසා ම සතුරන්ට මෙන් ම, මිතුරන්ට ද සම කරුණාව පතුරවන බව විශ්වාසය යි. ශ්‍රීපාද වන්දනාවේ දී නඩයක් පර්වතය ඉහළටත්, තවත් නඩයක් පර්වතයෙන් පහළටත් ගමන් කරන විට ආශිර්වාද සලසා ගන්නේ "වැඳල බහින මේ නඩේට සුමන සමන් දෙවි පිහිටයි" "වඳින්ඩ යන මේ නඩේට සුමන සමන් දෙවි පිහිටයි" "කරුණාවයි කරුණාවයි සුමන සමන් කරුණාවයි" වැනි ගැමිවදන් පිටවන්නේ දෙවියන් කෙරෙහි ඇති පැහැදීම නිසා ය. දෙවියන් ගේ කරුණාවේ වෙනසක් නොමැති නිසා ය. සතුරකු මුහුණට මුහුණ හමුවුවත් එම ආශිර්වාදය එක් කරන්නේ එබැවිනි.

සමන් දෙවියන් ගේ කරුණාව සහ හාස්කම් නිසාම රජවරුන් ද නිතර පූජා පවත්වා තිබේ. දෙවැනි පරාක්‍රමබාහු රජතුමා සබරගමු දේවාලය ඉදිකරමින් අනුග්‍රහය දක්වා ඇත. පළමුවැනි විජයබාහු රජතුමා ගිලීමලය ග්‍රාමය ශ්‍රීපාදස්ථානයට පූජා කර බැතිමතුන්ට පහසුකම් සලසා දී තිබේ. නිශ්ශංකමල්ල රජතුමා ශ්‍රීපාදස්ථානය වන්දනා කිරීමට යන පිරිස ගේ පහසුව පිණිස මාර්ගය සකස් කරදී ඇත. තව ද පළමුවැනි රාජසිංහ, දෙවැනි විමලධර්මසූරිය, නරේන්ද්‍රසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ වැනි රජවරුන් ශ්‍රීපාදස්ථානය වන්දනා කර එහි නඩත්තුවට ගම්වර පූජා කර තිබේ. රජවරුන් ගේ අනුග්‍රහයෙන් සමන් දෙවියන්ට උපහාර පිණිස සබරගමු මහ සමන් දේවාලයේ පෙරහර මංගල්‍ය වාර්ෂික ව පැවැත්වීම ද සිරිතකි. මහියංගණ මහ සමන් දේවාලයේ පෙරහර මංගල්‍යයෙන් ද සමන් දෙවියන්ට උපහාර දක්වයි. නිතර පින් ලබන සමන් දෙවියන් ජනයාට සේවය කිරීමට සූදානම් ව සිටින බැවින් බාරහාරවීම් ද නිතර සිදු වේ. සබරගමු හෝ මහියංගණ දේවාලවලට බාරවීම බහුල ව සිදු වේ. ඇතැම්හු ශ්‍රීපාදස්ථානයට ද බාර වෙති. එම බාර ඉටු කිරීමට ලැබෙන්නේ වන්දනාවාරය ආරම්භ වූ පසුව යි. ශ්‍රීපාදස්ථානය වන්දනා කිරීමට බෞද්ධ ජනතාවට අවස්ථාව ලැබෙන්නේ වර්ෂයේ මාස දෙළසෙන් හයක් පමණි. උඳුවප් පුර පසළොස්වක පොහොය දිනයේ සිට වෙසක් පුර පසළොස්වක පොහොය දිනය දක්වා කාලය මෙයට අයත් ය. සැදැහැවතුන් නොයන මාස හයක කාලයේ දී සමන් දෙවියන් විසින් ශ්‍රීපාදය පුදනු ලබන බව පැවසේ. වන්දනාවාරය ආරම්භයට පෙරදින සමන් දෙවියන් ගේ දේව ආභරණ පෙරහරකින් ශ්‍රීපාද මළුවට වැඩම කරවීම සාම්ප්‍රදායික චාරිත්‍රයකි. පසුදින ආගමික වතාවත් සිදු කර සමන් දෙවියන් උදෙසා පින් පමුණුවා වන්දනා වාරය ආරම්භ කරයි. මෙය සෑම වර්ෂ යක ම නොකඩවා පවත්වන්වන සිරිතකි.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**




# සමන් දෙවිඳුන්ට උපහාර පිදෙන සපරගමු මහසමන් දේවාල පුදබිමේ ඇසළ පෙරහර මංගල්‍යය

**තථාගතයන් වහන්සේ සමනල ගිරි හිස ශ්‍රී පාද පද්මය පිහිටුවා වදාළේ සුමන සමන් දෙවිඳුන් ගේ ආරාධනයෙනි. සිරිපා අඩවිය සමන් දෙවිඳුන් ගේ අඩවිය ලෙස සලකන ලක්වැසි බොදු ජනතාව සිරිපා කරුණාවේ දී රැකවරණය ප්‍රාර්ථනා කරන්නේ සුමන සමන් දෙවිඳුන්ගෙනි.**

තුන් සරණේ කවි කියමින් ,තිසරණ ගුණ සිහි කරමින් ඔවුහු සමන් දෙවිඳුන්ට ගෞරවාදරය දක්වන්නේ සිරිපා කරුණාවේ දී කිසි විටෙක කට වරද්දා නො ගනිමිනි. එසේ සුවිශේෂී වන සුමන සමන් දෙවිඳුන් වෙනුවෙන් ඉදිවූ රත්නපුර මහ සමන් දේවාලය සබරගමු පළාත් වැසියන් ගේ සංස්කෘතිය හා බැඳුණු ප්‍රධානත ම සිද්ධස්ථානයකි. ජීවිතයේ සුවිශේෂී වූ කවර කටයුත්තක දී වුවද සමන් දෙවිඳුන් ගේ ආශිර්වාදය ලබා ගැනීම ඔවුන් ගේ සිරිත ය.

**කන්ද උඩින් බැස්ස කලට පෙනේ ය
උළු මාලිගාව
බිම්බරකින්සෙනඟ ඇවිත් රුවට
සැදෙව් මාලිගාව
රූ දාවල් අඳුර නැති ව රන් කොත්
බබළන සොබාව
ලංකාවට තිලකය ව ද
සබරගමුව මාලිගාව**

සබරගමුවේ මහ සමන් දේවාලය ඈත අතීතයේ සිට ම ජන හදවත් හා සමීප වී ඇති අයුරු ය ගැමියන් ගේ මුවග නිතර රැඳෙන මේ කාව්‍ය නිර්මාණයන්ගෙන් ද කියැවෙන්නේ.

සබරගමුව මහ සමන් දේවාලයේ ඉතිහාසය දෙවැනි පරාක්‍රමබාහු රජ දවස දක්වා දිව යයි. ඉතිහාසයට අනුව දෙවැනි පරාක්‍රමබාහු රජතුමා දඹදෙණි යුගයේ විසූ ශ්‍රේෂ්ඨ නරපතියෙකි. රජු ගේ මහ ඇමැති ධූරය දැරුවේ ආර්යකාමදේව නම් පුද්ගලයෙකි. එවක සබරගමු ප්‍රෙද්ශයේ මැණික් ගරා , රාජ භාණ්ඩාගාරය තර කිරීමේ භාරදූර කාර්යය පැවරුණේ ඔහුට ය. ඒ අනුව සබරගමුවට පැමිණි ඇමැතිවරයා රජතුමා වෙනුවෙන් පළමු ව බාරයක් විය. ඒ සමන් දෙවිඳුන් උදෙසා ය. රට වෙනුවෙන් තමන්ට පැවරුණු කාර්යය අතුරුඅන්තරාවකින් තොර ව සාර්ථක ව ඉටු කර ගැනීම එහි අරමුණ විය. ඔහු ගේ බාරය වූයේ වටිනා මැණික් ලැබුණේ නම්, සමන් දෙවිඳුන් වෙනුවෙන් තෙමහල් ප්‍රාසාදයක් කරවන බව ය. ඇමැතිවරයා ගේ ප්‍රාර්ථනාව එලෙස ම ඉටු විය. රාජ භාණ්ඩාගාරයට වටිනා මැණික් ලැබුණි. මේ ගැන බෙහෙවින් සතුටට පත් වූ රජතුමා සමන් දෙවිඳුන් වෙනුවෙන් වූ බාරය ඔප්පු කළේ ය. සබරගමු මහ සමන් දේවාලය ඉදිවන්නේ ඒ අනුව ය.

අතීතයේ සිට ම සමන් දෙවිඳුන් උදෙසා සබරගමුව මහ සමන් දේවාලයෙහි සිදු කෙරෙන පුද පූජාවන් අතර ඇසළ පෙරහර සුවිශේෂී ය. ඉපැරැණි රාජ සම්මත නීතීන්ට අනුව පැවැත්වෙන පෙරහරෙහි අරමුණ සමන් දෙවිඳුන්ට උපහාර දැක්වීම ය. සබරගමු පළාත් වැසි බොහෝ දෙනෙක් මෙම පෙරහර නැරඹීමට හුරු පුරුදු වී සිටින්නේ එය තමන් විසින් කළ යුතු ම චාරිත්‍රයක් කොට සලකමිනි. තමන් ගේ ජීවිතයේ කුදු මහත් ඕනෑම කටයුත්තක දී සමන් දෙවිඳුන් ගේ පිහිට ආරක්ෂාව ලැබෙන බව ඔවුහු විශ්වාස කරති.

රත්නපුර සමන් දේවාලයේ ඇසළ මහ පෙරහර දෙවැනි වන්නේ මහනුවර ශ්‍රී දළදා පෙරහරට පමණක් බව පැවසේ. අතීතයේ සමන් දේවාලයේ පැවැත් වූ දළදා පෙරහර පිළිබඳ කියැවෙන දළදා පූජා කවි එහි අලංකාරයත්, ගාම්භීර බවත් ප්‍රකාශ කරයි.



සමන් දේවාලයේ ඇසළ පෙරහර මංගල්‍යය සිදු කෙරෙන්නේ දේවාලයේ බස්නායක නිලමේ තුමා ගේ ප්‍රධානත්වයෙනි. ඔහු විසින් නැකැත් රාළ, ඇතුළු කට්ටලේ සහ පිට කට්ටලේ නිලධාරීන් කැඳවා පෙරහරට අදාළ කාර්යයන් පවරනු ලබයි.

පෙරහර ඇරඹෙන්නේ කප් සිටුවීමෙනි. වර්තමාන චාරිත්‍ර අනුව කප් සිටුවීමට පෙර දින සර්ව රාත්‍රික පිරිත් දේශනයක් පවත්වා පසුදින මහා සංඝගත දක්ෂිණාවක් පිරිනැමෙයි. එහි දී සමන් දෙවිඳුන්ට පින් අනුමෝදන් කිරීම සිදු කෙරේ.

කප් සිටුවන්නේ සුබ නැකතිනි. එය බාරව සිටින්නේ කප් සිටුවන රාළ ය. ඔහු විසින් පෙරදින රාත්‍රියේ තනිව ම ගොස් කපා ගත් කප් ගස සුදු පිරුවටයකින් ඔතා ශබ්ද පූජා මධ්‍යයේ , උඩුවියන් මැදින් කප් සිටුවන ස්ථානයට රැගෙන යනු ලබයි. සුබ නැකතින් කප් සිටුවන්නේ ළිඳ මලුවේ දී ය. සමන් දෙවියන් ගේ අඩවියෙහි සශ්‍රීකත්වය අපේක්ෂා කිරීම කප් සිටුවීමේ චාරිත්‍රෙයහි ප්‍රධාන අරමුණ ය.





කප් සිටවූ දා සිට කුඹල් පෙරහර පහක් පැවැත්වේ. ඒ, උඩ මලුව වටා ය. අනතුරු ව එළඹෙන්නේ වීදි පෙරහර යි. උදේ සහ සවස වශයෙන් දෙවතාවක් පවත්වන හෙයින් වීදි පෙරහර දෙවේල් පෙරහර යනුවෙන් ද හැඳින්වෙයි. හේවිසි, කොඩි සේසත් සහ සබරගමු නැටුම් ආදියෙන් සමන්විත මෙම පෙරහරෙහි සියලු දෙනා සැරසී සිටින්නේ සුදුවතිනි.

23 පිටුවට...



මිගාර ජයසුන්දර බස්නායක නිලමේතුමා

ඡායාරූප - **විමල් කරුණාතිලක**

**රත්නපුර විශේෂ - රාජා දෙරේ**

22 පිටුවෙන්...

## සමන් දෙවිඳුන්ට උපහාර...

වීදි පෙරහරෙහි සමන් දේවාභරණ අලියකු පිට වැඩම කරවන අතර, පත්තිනි දේවාලයේ දෝලාව ද එහි වැඩම කරවයි. උඩ මලුවෙන් ඇරඹෙන මෙම පෙරහර සමන් දේවාලයේ ඇසළ පෙරහරේ ප්‍රථම වීදි සංචාර පෙරහර යි.

වීදි පෙරහර පහක් පැවැත්වීමෙන් පසු ඇරඹෙන්නේ මහ පෙරහරයි. දින පහක් පැවැත්වෙන මෙම පෙරහරේ සුවිශේෂත්වය වන්නේ දළදා පෙරහර පෙරටු කොට ගෙන දේවාල පෙරහර සතරක් ගමන් කිරීම ය. මෙම පෙරහරෙහි පළ මුව පිටත් වන්නේ දළදා පෙරහරයි. අනතුරුව පිළිවෙළින් පත්තිනි, බිසෝ දෙවි, කුමාර දෙවි හා සමන් දෙවි පෙරහර ගමන් කරයි.

මහ පෙරහරේ මුලින් ම ගමන් කරන්නේ මහබඹා ය. දළ දා පෙරහර ආරම්භ වීමෙන් පසු බස්නායක නිලමේ වෙත විශේෂ කාර්යයක් පැවරේ. නිල රාජකාරිකරුවන් සමඟ දේවාලය වෙත පැමිණෙන බස්නායක නිලමේ දේව පෙරහර අරඹන්නේ සිරිත් 24ක් පවත්වමිනි.

රත්නපුර මහ සමන් දේවාලයේ ඇසළ පෙරහර මංගල්ලයේ දළදා පෙරහරෙන් අගමික ව සෙත් ප්‍රාර්ථනා කිරීමත්, දේව පෙරහරෙන් දෙවියන් ගේ ආශිර්වාදයත් බලාපොරොත්තු වේ. පෙරහර හොඳින් සිදු කිරීමෙන් පසු නව වසරක් සඳහා ආරක්ෂාව සැලසෙන බව විශ්වාස කෙරේ.

මහ පෙරහර අවසන් වීමෙන් පසු දින දිය කැපීමේ පෙරහර පැවැත්වේ. දියකැපීමේ පෙරහර අවසන් වීමෙන් පසු ගරායකුම ශාන්තිකර්මය සිදු කෙරේ. එය සිදු කෙරෙන්නේ දෙවියන් වැඩම වූ ඇතාට සෙත් ප්‍රාර්ථනා කිරීමට බව පැවසේ.

මෙවර රත්නපුර මහ සමන් දේවාලයේ ඇසළ පෙරහර මංගල්‍යය කොරෝනා වසංගත රෝග තත්වය නිසා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව ජන සහභාගිත්වයෙන් තොරව පැවැත්වෙන බවත්, එහෙත් සියලු චාරිත්‍ර එලෙස ම සිදු කරන බවත් රත්නපුර මහ සමන් දේවාලයේ බස්නායක නිලමේ මිගාර ජයසුන්දර නිලමේ තුමා පැවසී ය.

06 පිටුවෙන්...

## අශ්වයා පැන යන්නට පෙර...

### මාරයා ගේ වැඩක්

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ මදයට හා ප්‍රමාදයට හේතුවන යමක්

වේ නම්, එය මත්ද්‍රව්‍ය ගණයට ගැනෙන බවයි. පංචසීල ප්‍රතිපදාවේ පස් වැනි ශික්ෂා පදයෙන් විස්තර කරන්නේ ද එයයි. 'මජ්ජ' යනු මත් වීමයි. උමතු වීමයි. ප්‍රකෘති සිහියෙන් තොර ව හොඳ – නරක, පින් – පව් තෝරා බේරා ගැනීමට නොහැකි ව උම්මත්තකයකු සේ ක්‍රියා කිරීම යි. සුරා මදයට ඇබ්බැහි වූවකු උවමනාවෙන් ම සිත උමතු භාවයට පත් කර ගන්නා අතර, බොහෝ පාපී සිතිවිලි ඇතිවී සාංසාරික ගමන දුක් සහිත තැනක් බවට පත් කර ගන්නා බව

බුදුසමයේ පෙන්වා දෙනවා.

පමාද' කියන්නේ ප්‍රමාදය යි. කුසලය හෙවත් සසර දුකින් මිඳීමේ මඟ ප්‍රමාද කරමින් දස අකුසලයන්ට පුද්ගලයා යොමු කරවන්නේ ප්‍රමාදය නිස යි. 'පමාදෙ මච්චුනො පදං' ප්‍රමාදය මාරයා ගේ කාර්යයක් බව බුදුසමයේ ඉගැන්වෙනවා. ඒ අනුව ප්‍රකෘතිගත සිත මත්වීමට හා ප්‍රමාද කරවීමට සමත් සුරාපානය නො කළ යුතු බව බුදුසමය අවධාරණය කරනවා.

මේ දෙරටුවෙන් ගියොත් විනාශය ම යි ගිහි විනය ලෙස ප්‍රකට සිඟාලෝවාද සූත්‍රයේ සුරාව හෙවත් මත්ද්‍රව්‍ය සම්පත් විනාශ වන ප්‍රධාන දෙරටුවක් ලෙස දක්වා තිබෙනවා. ඒ විතරත් නොවෙයි, එහි මතට ඇබ්බැහි වූවන්ට අත්විඳින්නට වන ආදීනව පහක් ද පෙන්වා දී තිබෙනවා. එනම්, ධනය විනාශවීම, අරගලවලට පැටලීම, අපකීර්තියට පත්වීම, රෝගියකු වීම හා නුවණ දුර්වල වීම යි.

### ඊර්ෂ්‍යා කළ දෙවිවරුන්ට සිදු වුණ දෙය

සුරා පානය සම්බන්ධයෙන් ත්‍රිපිටක පෙළ දහමේ මෙන් ම අට්ඨකථාවල ද තොරතුරු සුලභ යි. සංයුත්ත නිකාය අට්ඨකථාවට අනුව මඝ මානවක ඇතුළු යහළුවන් තිස්තුන් දෙනා පින්කම් කොට මරණින් පසු තාවතිංස දිව්‍ය ලෝකයේ ඉපදුණා. එවිට එහි සිටි අල්පේශාක්‍ය දෙවිවරු ඔවුන් සුරාවෙන් මත්කොට තාවතිංසයෙන් නෙරපා දැමීම සඳහා සුරා පානයක් සැකසූවා.

ඒ බව දැනගත් ශක්‍ර දේවේන්ද්‍රයා යහළු දෙවිවරු තිස් දෙදෙනාට ඒ බව පවසා සුරාව සැකසූ අල්පේශාක්‍ය දෙවිවරුන්ට ම පොවා සිනේරු පර්වතයෙන් පහළට ඇද දැමූවා. පසුව ඔවුන් අසුරයන් වූ බවත්, සුරා පානය නොකළ ශක්‍ර දේවේන්ද්‍රයා ඇතුළු තිස් තුන් දෙදෙනා සුරයන් වී තෙත්තිංස හෙවත් තාවතිංස දිව්‍ය ලෝකය නිර්මාණය වූ බවත් එහි වැඩිදුරටත් සඳහන් වෙනවා.

### නුවරක් ම වැනසෙයි

මත්ද්‍රව්‍යයන් හි මූලාරම්භය ගැන කියැවෙන ජාතක දේශනාවක් ජාතක පාලියේ දක්නට ලැබෙනවා.

ඒ 504 වැනි ජාතක කථාව වූ කුම්භ ජාතකයේ යි. විශාඛා මහෝපාසිකාව ගේ යෙහෙළියන් පිරිසක් බුදුන් වහන්සේ ඉදිරියේ දී සුරාවෙන් මත් වී අශෝභන ලෙස හැසිරුණ අවස්ථාවේ දී යි මෙම ජාතක කථාව දේශනා කොට තිබෙන්නේ. අතීත කථාවට අනුව, පෙර කසී රට සුර නම් වැද්දෙක් සිටියා. ඔහු වනයේ දඩයම් පිණිස යන විට ගසක් මුල සිහිසුන් ව වැටී සිටි ළිහිණි, කොබෙයි ආදී පක්ෂීන් රාශියක් දුටුවා. මැරුණ සේ සිහිසුන් ව සිටි එම පක්ෂීන් මඳ වෙලාවකින් සිහිය ලැබ පියාඹා යන අයුරු වැද්දා දුටුවා. එසේ වන්නට හේතු සොයන්නට වුණා. එක් ගස් බෙනයක ඇති පානයක් නිසා එසේ වන බව දැන ඔහු ද එයින් මඳක් පානය කළා. වැද්දාට ද ආශ්වාදජනක මත් ගතියක් දැනෙන්නට වුණා. අවට වටපිටාව සෝදිසි කරනවිට ඔහුට පෙනෙන්නට වූයේ ගස් බෙනය මතට වැටුණු සතුන් කා දමන ලද ධාන්‍ය වර්ග, පලතුරු හා සත්ව කොටස් කාලයක් ජලයේ පල්වී පැසීමෙන් මෙසේ මත් වූ පානයක් නිර්මාණය වී ඇති බවයි.

වැද්දා සුරාව බඳුනකට පුරවා ගෙන ගොස් බරණැස් රජුට ද පිළිගැන්වූ වා. රජු ද ඒ ආකර්ෂණීය පානයට ලොල් වී රට වැසියන්ට ද පුරුදු කළා. ටික කලකින් මුළු බරණැස් නුවර ම සුරාව නිසා විනාශ වුණා. සාකේත නුවරත් විනාශ වුණා.

අවසානයේ දී සැවැත්නුවර සබ්බමිත්ත කියන රජු මධුපානෝත්සවයක් සූදානම් කරනවිට ශක්‍ර දේවේන්ද්‍රයා ගේ මැදිහත්වීමෙන් එය නතර වුණා. සුරාවෙහි ලොල් වී තමන් ගේ ම පුතු මරණයට පත් කරයි

සුරාවට ලොල් වී සිටි ඡත්තපාණී නම් කපුවා තම පුතු මරා මාංශ අනුභව කළ පුවතක් 219 වැනි ධර්මද්වජ ජාතකයේ සඳහන් වෙනවා. 382 වැනි තුණ්ඩිල ජාතකයේ සඳහන් වන්නේ එක්තරා මැහැල්ලක් සුරාවෙන් මත් වී පුත්‍ර ප්‍රේමයෙන් හදා වඩා ගත් ඌරු පැටවකු සුරා සොඬුන්ට මස් පිණිස විකුණූ පුවතක්.

එසේ ම මත්ද්‍රව්‍ය භාවිතයෙන් මත් වූ මිනිසා තිරිසනකු ගේ ස්වභාවයට පත්වන බව 81 වැනි සුරාපාන ජාතකයේ දැක්වෙනවා.එම ජාතක කථාවට අනුව තාපසවරු පන්සියයක් හිමාලයේ සිට බරණැස් නුවරට පැමිණියා. ඒ ලුණු

ඇඹුල් සපයා ගැනීම සඳහා යි. බරණැස් රජු තාපසවරුන්ට නවාතැන් ගැනීමට රාජ

උද්‍යානය පිළියෙල කරවූ වා. නගරයේ එදින පැවති මධුපානෝත්සවයක තිබූ සුරාව

උද්‍යානයේ සිටි තාපසවරුන්ට ද පිළිගැන්වුණා. තාපසවරු සුරා පානය කොට සිහිවිකල් ව නොයෙක් විකාර බස් කියන්නට වුණා. කරන්නට වුණා. පසුව පියවි සිහිය ලැබ තමන් තවුස්දිවියට අනර්ථයක් කර ගත්තේ යැයි තැවී හිමාලයට ගොස් ආචාර්යවරයා සමීපයේ මෙසේ කියා සිටියා.

"අපි සුරාව පානය කළෙමු. ගායනා කළෙමු. නැටුවෙමු. හැඬුවෙමු. සිහිවිකල් කරන්නා වූ මත්ද්‍රව්‍ය පානය කොට වඳුරන් බවට පත් නොවුණා පමණයි." මෙම ප්‍රකාශයෙන් තහවුරු වන්නේ මත්ද්‍රව්‍ය පුද්ගලයා ගේ ප්‍රකෘතිය කොතරම් දුරට විකෘති ස්වභාවයකට පත් කරන්නේ ද යන බවයි.

### නිරයට පාරක්

එසේ ම ජාතක පාලියේ සඳහන් 533 වැනි නිමි ජාතකයට අනුව මත්ද්‍රව්‍ය භාවිතය අපායගාමී අකුසලයක්. වරක් නිරයේ සංචාරය කරන නිමි රජතුමා මත්ද්‍රව්‍ය භාවිත කරමින් සතුන් ගේ මස් අනුභව කළවුන් ලෝ කුඹු නිරයේ දුක් විඳින ආකාරය දුටු බව නිමි ජාතකයේ සඳහන් වනවා. මෙම සියලු තොරතුරු මඟින් සනාථ වන්නේ බුදුසමය මත්ද්‍රව්‍ය භාවිතය මඟින් පුද්ගල අධ්‍යාත්මයේ පරිහානිය හා භෞතික කයේ අනාරක්ෂිත බව ඇති වන බව තහවුරු කරන බවයි. එසේ ම දිගු සසර ගමනේ බියකරු ප්‍රතිඵලවලට මුහුණ දෙන්නට එය සාධකයක් වන බවයි.

### දත්ත භයානක යි

අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ දත්තවලට අනුව වර්තමානය වන විට මෙම මාරාන්තික සමාජ පිළිලයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවයක් පවතින්නේ අවුරුදු 21 ට අඩු දරුවන් වීම බරපතල සමාජ ගැටලුවක්.

නගරයේ සුපිරි පන්තියේ නිවෙස්වල දරුවන් පමණක් නොව ඈත පිටිසර ගම්දනව්වල දුප්පත් දරුවන් ද ශීඝ්‍රයෙන් මේ පිළිලයට ගොදුරු වෙමින් පවතිනවා. හෙරොයින්, ගංජා, කංසා, මදන මෝදක පමණක් නොව මාවා ,බීඩා, පන්පරාග්, බාබුල්, ස්ප්‍රේකෝලා, ට්‍රැමඩොල්, ක්‍රිස්මල්, කෙටමින් හෙවත් කැට් ,එල්එස්ඩී හෙවත් ස්ටැම්ප්, හශීස්, කේරළ ගංජා, කොකේන්, එක්ස්පසී හෙවත් එම්ඩීඑම්ඒ ආදී මත්ද්‍රව්‍ය වර්ග විශාල ප්‍රමාණයක් මේ වන විට ගම නගරය ආක්‍රමණය කරමින් සිටිනවා.

බොහෝවිට එහි වෙළඳපොළ පවතින්නේ පාසල් සමීපයේ යි. ඒ වර්තමාන තරුණ පිරිස් ඉලක්කගත කිරීම ඔවුන් ගේ වෙළෙඳ උපක්‍රමය වන නිස යි. එය බරපතළ සමාජ ඛේදවාචකයක්.

### ජීවනාලියට ප්‍රාණය දෙන්නට නම්

රටක ජීවනාලිය ඒ රටේ තාරුණ්‍ය ය යි. ඔවුන් මේ ව්‍යසනයට ගොදුරුවීමෙන් මතක ශක්තිය හීනවීම, නිසි තීරණ ගැනීමට නොහැකියාව, සංවේදීතාවයෙන් තොරවීම, ආක්‍රමණශීලී ස්වභාවයක් ගැනීම,තදින් කලබලවීම,නොරිස්සුම් ස්වභාවයට

පත්වීම, නින්ද නොයෑම,ඉලක්කගත අරමුණුවල හිත තබා ගැනීමට නොහැකිවීම, ඉච්ඡාභංගත්වයට පත්වීම, මානසික පීඩනය, හුදකලා වීමට ඇති කැමැත්ත වැනි කායික මානසික ගැටලු රැසකට ලක් වෙනවා.

මෙම සමාජ ව්‍යසනය නිවාරණය කිරීම සම්බන්ධ ව වත්මන් ජනාධිපති තුමා ගෙන යන වැඩපිළිවෙළට සියල්ලන් ගේ සහයෝගය ලැබෙන්නේ නම් අපේ අනාගත පරපුර සිහි කල්පනාවෙන් යුතු පිරිසක් බවට පත් කිරීම අපහසු වන්නේ නැ.

එසේ ම මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පාසල් අධ්‍යාපනයේ සිටම තරුණ මනසට කා වැද්දීම ද කළ යුතු වනවා. ආගමික ස්ථාන තුළින් තරුණ මනස සුවපත් කරන වැඩසටහන් ක්‍රියාවට නැංවීම ද අත්‍යවශ්‍ය යි. සමාජය වෙළා පැතිරී ඇති මේ මාරාන්තික පිළිලය විනාශ වී යන්නේ එවිටයි.

# අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍ර සම්භාවනා සම්භාෂණය



ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ප්‍රථම උත්තරීතර මහානායක ධූරීන, විද්‍යාවිශාරද, අග්ගමහාපණ්ඩිත, අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ දහ අටවන ගුණසමරුව වෙනුවෙන් සංවිධානය කරන ලද අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍ර සම්භාවනා සම්භාෂණය සැප්තැම්බර් මස 12 වන දින රාත්‍රී කාලයේ මාර්ගගත සම්මන්ත්‍රණයක් ලෙස පැවැත්වුණි.

රටේ ජාතික, ආගමික හා සාමාජයීය ගැටලුවල දී පෙරට පැමිණි මහ නාහිමිපාණන් වහන්සේ ත්‍රෛනිකායික මහා නාහිමිපාණන් වහන්සේ සමඟ එම ගැටලු විසඳීමට නායකත්වය ගත්හ. බුද්ධජයන්ති ත්‍රිපිටක පරිවර්තනය, බුරුමයේ ඡට්ඨ සංගායනාව වැනි කටයුතු සඳහා සම්බන්ධ වූ මහ නාහිමිපාණන් වහන්සේ අතින් රචිත පොත් සහ ලිපි ලේඛන ප්‍රමාණය සුවිශාල වෙයි. මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය පිහිටුවා භික්ෂු අධ්‍යාපනය විධිමත් කරමින් බම්බලපිටියේ වජිරාරාමය ඇතුළු විහාරස්ථානයන් හි ආධිපත්‍යය දරමින් අම්පිටියේ රාහුල මාහිමියන් ගේ ද දායකත්වයෙන් ශතාධික ශිෂ්‍ය සමූහයක් දායාද කළහ. ජාත්‍යාන්තර ධර්ම ප්‍රචාරක මෙහෙවරෙහි ද මඩිහේ මහනාහිමිපාණන් වහන්සේ සුවිශේෂී මෙහෙවරක් සිදු කළ අනතිමානී සංඝශෝභන ගුණයන්ගෙන් පිරිපුන් ව වැඩ විසූ සේක.

අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහානායක පදවිය හොබවා වදාළ මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පාර්ශ්ව විසි දෙකකට බෙදී තිබුණු අමරපුර මහා නිකාය එක්සත් කොට ශ්‍රී ලංකා අමරපුර මහා සංඝසභාව පිහිටුවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කළහ. එකී මහා මෙහෙවරට උපහාර පිණිස 1992 වර්ෂයේ දී එම සංඝ සභාවෙහි ඒකමතිකත්වයෙන් ව්‍යවස්ථාව සංශෝධනය කොට උත්තරීතර මහානායක පදවිය පිහිටුවා මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන් වෙත පුද දෙන ලදි.

අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍ර සම්භාවනා සම්භාෂණයෙහි ගුණසමරු දෙසුම් අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානාහිමි, කොටපිටියේ රාහුල අනුනාහිමි, ඕමල්පේ සෝභිත නාහිමි සහ මහාචාර්ය අසංග තිලකරත්න මැතිතුමා විසින් සිදු කළ අතර, තිරිකුණාමලේ ආනන්ද මහානාහිමියන් විසින් සමෝධායන දෙසුම සිදු කරන ලදි. දෙඩම්පහළ චන්දසිරි මහනාහිමිපාණන් වහන්සේ සහ ආණමඩුවේ ධම්මදස්සි අනුනාහිමිපාණන් වහන්සේ ශුභාශිර්වාද එක් කළහ.

කිතලගම හේමසාර නාහිමි, මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි, ආචාර්ය තවලම ධම්මික හිමි, ආචාර්ය කුඹල්ගොඩ ධම්මාලෝක හිමි, මහාචාර්ය යමුනා හේරත් මැතිනිය ඇතුළු වියතුන් අදහස් දැක්වීය.

දිඹුල්කුඹුරේ විමලධම්ම අනුනාහිමි, බලංගොඩ සෝභිත නාහිමි, අමරපුර නිකායේ එක් එක් පාර්ශ්වවල මහානායක, අනුනායක, ලේඛකාධිකාරි හිමිවරුන්, මඩිහේ මහනාහිමියන් ගේ ශිෂ්‍ය හිමිවරුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සම්බන්ධ වූ හ.

අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහනාහිමියන් ගේ අනුශාසනා පරිදි ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ අධ්‍යාපන, ප්‍රකාශන සහ ධර්මදූත අංශය සංවිධානය කළ මෙම ගුණසමරු සම්භාෂණය මෙහෙයවන ලද්දේ බලපිටියේ සිරි සීවලී නාහිමියන් විසිනි.

**දිමුතු පුන්සර කොළඹගේ**

# කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක නායක ස්වාමින්ද්‍රාභිනන්දන ප්‍රභාෂණය සාර්ථක ව නිමාවට පත් වූ වගයි

විසිවන සියවසේ මෙරට වැඩ සිටි අග්‍රගණ්‍ය පඬිරුවනක වූ අහංගම විද්‍යාචන්ද්‍ර පරිවේණාධිපති, අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨාධිපති, බුද්ධජයන්ති ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ සභාපති, දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, උපාධ්‍යාය ධූරන්ධර, සාහිත්‍ය චක්‍රවර්ති, රාජකීය පණ්ඩිත, අතිපූජ්‍ය කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ ගේ මහාර්ඝ ජාතික, ආගමික, භාෂා සාහිත්‍යයික මෙහෙවර අගය කරමින් කෘතෝපහාර දැක්වීම පිණිස සංවිධානය කරන ලද කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක නායක ස්වාමින්ද්‍රාභිනන්දන ප්‍රභාෂණය මාර්ගගත සම්මන්ත්‍රණයක් ලෙස සැප්තැම්බර් මස තුන් වන සිකුරාදා සන්ධ්‍යාවේ දී 'දදප තාක්ෂණය ඔස්සේ අති සාර්ථක ව පවත්වන ලදි.


බුද්ධ ජයන්ති ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ විසිපස් වසරකට අධික කාලයක් සභාපති පදවිය හොබවන ලද කෝදාගොඩ ඤාණාලෝක නාහිමිපාණන් වහන්සේ අතින් පරුපනපාළි, පාරුපනසිඛ, ප්‍රාකෘතමඤ්ජරී, අමාවතුර සංස්කරණය, පයෝගසිද්ධි සංස්කරණය, සිද්ධාන්ත ප්‍රදීපය වැනි මහානීය ග්‍රන්ථ සමුදායක් රචනා වී ඇති අතර විසිවන සියවසේ ඇති වූ පාරුපන වාදය වැනි ධර්මශාස්ත්‍රීය වාද විවාද සඳහා ද මූලිකත්වය ගත්හ. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය ආරම්භක අවස්ථාවේ දී ම එහි කථිකාචාර්ය පදවියකට පත් නාහිමිපාණන් වහන්සේ දක්ෂිණ ලංකාවේ ශාසනික ගැටලුවල දී පෙරට පැමිණෙමින් ඉතා දූරදර්ශී ව සංඝ සාමග්‍රිය උදෙසා ඇප කැප වූ මහා යතීන්ද්‍රයන් වහන්සේ නමකි.



තිස් තුන් වසරකට පෙර අපවත් වී වදාළ කෝදාගොඩ නාහිමිපාණන් වහන්සේ ගේ මෙහෙවර සිහි කරමින් මේ දක්වා කිසිදු ඇගයීමක් සිදු කොට නොතිබූ හෙයින් කථිකාචාර්ය දිමුතු පුන්සර කොළඹගේ මැතිතුමා ගේ අදහසකට අනුව දක්ෂිණ ලංකාවේ සමථබල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝ නායක අතපත්තුකන්දේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ මූලගිරි සංඝ සභාවේ ආරාධනයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමියන් ගේ මෙහෙයවීමෙන් මෙම ප්‍රභාෂණය සංවිධානය විය.

ආචාර්ය මොරකත්දේගොඩ අරියවංස හිමි, ආචාර්ය කුඹල්ගොඩ ධම්මාලෝක හිමි සහ කථිකාචාර්ය ගනුෂ්ක රත්දූල මහතා විසින් ශාස්ත්‍රීය දේශන පවත්වන ලද අතර, අතිපූජ්‍ය තියංගොඩ විජිතසිරි අනුනාහිමිපාණන් වහන්සේ මුලසුන් දෙසුම සිදු කළහ. අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහා නාහිමි, ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නාහිමි, බඩබද්දේ චන්දරතන හිමි, මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි, මහාචාර්ය සඳගෝමි කෝපරහේවා මැතිතුමා ඇතුළු විද්වතුන් ද අදහස් දක්වන ලදි.

මල්වතු අස්ගිරි උභය මහාවිහාරයීය අනුනායක ස්වාමින්ද්‍රයන් වහන්සේ, අතිපූජ්‍ය දෙඩම්පහළ චන්දසිරි උත්තරීතර මහ නාහිමි, අතිපූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර මහා නාහිමි, වැලමිටියාවේ ඤාණරතන නාහිමි ඇතුළු සම්භාවනීය මහා සංඝරත්නය, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් ඇතුළු දෙසියයකට අධික ශාස්ත්‍රෝන්නතිකාමීන් ගේ සහභාගීත්වයෙන් මෙම ප්‍රභාෂණය පැවැත්විණි.



**ප්‍රංශයේ පැරිස් බෞද්ධ විහාරාධිපති ශාස්ත්‍රශූරී පූජ්‍ය කෝන්ගස්දෙනියේ ආනන්ද මාහිමිපාණන් වහන්සේ විසින් රචිත කොරෝනා කාලේ කවි නැමති ග්‍රන්ථය , පූජ්‍ය පරවාහැර චන්ද්‍රරතන නාහිමිපාණන් වහන්සේට පිරිනැමීම පසුගියදා ප්‍රංශයේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ පැවති විශේෂ උත්සවයක දී සිදු කෙරිණි. මෙම අවස්ථාවට ප්‍රංශයේ ජේතවන බෞද්ධ විහාරාධිපති පූජ්‍ය මුරුංගාගස්යායේ ඤාණිස්සර නාහිමිපාණන් වහන්සේ සහ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානවාසී කැන්දවින්නේ රාහුල ස්වාමින් වහන්සේ, කහත්තේවෙල සුගතසිරි සවාමීන් වහන්සේ සමඟ ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපතිනි මහාචාර්ය ක්ෂණිකා හිරුඹුරේගම මැතිනිය ඇතුලු විශාල පිරිසක් සහභාගී වූ හ**



**බිබිල-වෑගම සද්ධර්මාලංකාර පිරිවෙනේ ඉදිකළ පිරිවෙන් ශාලාව විවෘතකිරීම පසුගියද සිදුකෙරිණි. පිරිවෙන් කෘත්‍යාධිකාරී වෙල්ලස්ස,බින්තැන්න සහ මඩකලපුව තෙපළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක බදුල්ලගම්මන ගුණරතන නායක ස්වාමීන් වහන්සේ ගේ මඟපෙන්වීම මත ඉදිකරන ලද මෙම පිරිවෙන් ශාලාව විවෘත කළ අයුරු ඡායාරූපයෙන් දැක්වේ.**

**ඩී.එස් ගුණතිලක**
*ඌව වෙල්ලස්ස විශේෂ*

11 පිටුවෙන්...

## එකතු කරනවා වැඩි කරනවා වගේ ම...

මිනිස් බව ලත් අමනුෂ්‍ය පෙනුම ඇති දරුවා කුල උරුමයෙන් උරුම වූ සිඟමන සඳහා මව විසින් යොදවන ලද්දී ය. යන යන තන්හි දුටු දුටුවන් බියපත් ව පළවාහැරී ය. දිනක් පෙර තමා ගේ සිටු මැදුරට ගියේ ය. මූලසිරි සිටුතුමා ගේ දරුවන් ඔහු දැක බියපත් ව හඬන්නට විය. සිටුවරයා ද එදා තම පියා දුන් අවවාද අනුව කිසිවක් සැඩොල් දරුවා අසල කසළ ගොකට ඇද දැමී ය. මෙම සිදුවීම සිදු වන මොහොතේ මේ අසලින් පිඬු සිඟා වැඩමවා ලූ සර්වඥයන් වහන්සේ මෙම සිදුවීම දුටුවහ. මූලසිරි සිටු කැඳවා "මේ තලා පෙළා දමා ඇත්තේ ඔබේ පියාණන්ට"

යැයි කියා සඟවා තිබූ පස් මහා නිධානයන් ද පෙන්වා දෙමින් දම් දෙසා ලූ හ. එහි දී අනුවණයා තමාට දරුවන් ඇතැයි, ධනය ඇතැයි සිතමින් වෙහෙසෙන්නේ ය. පෙළෙන්නේ ය. කිසිදු කුසල ධර්මයක නොයෙදෙන්නේ ය. තමාට තමාවත් නැති බව නොසිතා ක්‍රියා කිරීමෙන් මෙබඳු දුක්ඛදායක තත්වයන්ට පත්වන්නේ යැයි පැහැදිලි කර දුන්හ. බුදුරදුන් දේශිත දහමින් ප්‍රමුදිත මූලසිරි සිටු බොහෝ පින්කම් හි යෙදී ජීවිතය සරු කර ගත් අතර බොහෝ දෙනකු ධර්මාවබෝධය සඳහා උපයෝගී කර ගත් අයුරු ද අපේ ධර්ම සාහිත්‍ය මඟින් මැනවින් විස්තර කොට ඇත.

බිනර පුර පොහෝ දිනය බෞද්ධ කුල කාන්තාවන් ගේ පොහෝ දිනය ලෙස හැඳින්වීමෙහි ද වරදක් නැත. බුදුරජාණන් වහන්සේ අතිශය පීඩාකාරී ව විසූ කාන්තා සමාජය විවිධ අංශයන්ගෙන් ඇගයීමට ලක් කළහ. කාන්තාව වැඳුම් පිදුම් ලැබීමට සුදුසු වූ පූජනීයත්වයට පත් කළහ. භික්ෂුණියක් ව සසරින් එතෙර වීමේ අවස්ථාව ලබා දුන් ඒ උතුම් දිනය අද දිනය වන්නේ ය. මහා ප්‍රජාපති ගෝතමිය අෂ්ඨ ගරු ධර්ම පිළිගැනීමත් සමඟ පැවැදි උපසම්පදාව ලැබීමෙන් කාන්තා සමාජයට ලබාදී ඇති මෙම පූජනීයත්වය වෙනත් කිසිදු දහමකින් ලබා දී නැත. බෞද්ධ කාන්තා පරපුර එදා තමන් ලද එම මහනීය අවස්ථාවට කෘතවේදී වෙමින් සියලු ආගමික ක්‍රියාවන් ගේ මූලික ව ක්‍රියා කිරීම දක්නට ලැබේ. එ දවස එබඳු සුවිශේෂී කාර්යයකට අවතීර්ණ වූ අද දිනයෙහි දරුවන් හා ධනය පිළිබඳ ව ඇති කර ගන්නා මතින් තොරව කුසල් වඩමින් සසරින් එතෙර වීමට උත්සුක විය යුතුව ඇත.

04 පිටුවෙන්...

## නිහඬ බව...

ඒ නිසා මහත් සැලකිල්ලකින්, සිහියකින් යුක්ත ව අප කට හසුරුවා ගත්තේ නැති නම් එතැන බොහෝ අඬදබර රණ්ඩුසරුවල් පමණක් නොව දරුණු මිනිස් ඝාතන පවා සිදු වන ආකාරය සම්බන්ධයෙන් ඕනෑම තරම් නිදසුන් අප ජීවත් වන සමාජයෙන් ම එදිනෙදා අපට සොයා ගන්නට හැකියාව තිබෙනවා. මේ නිසා හැමවිට ම නිශ්ශබ්දතාව වැදගත් වෙනවා. යහපත් ඵලදායක දෙයක් නො වේ නම් අපට වඩාත් වැදගත් වන්නේ නිශ්ශබ්දතාව ආරක්ෂා කර ගෙන ක්‍රියා කිරීම යි. මේ කියන නිශ්ශබ්දතාව ආර්ය උතුමන්ට පවත්නා ආර්ය නිශ්ශබ්දතාව මෙන් ම පුහුදුන් මිනිසාට ඔහු ගේ පැවැත්මේ

සාර්ථකත්වය පිණිස අතිශයින් ප්‍රයෝජනවත් නිසා බුදුරජාණන් වහන්සේ ගිහි පැවිදි අප දෙපක්ෂයට ම

එහි අගය පෙන්වා දීමට ක්‍රියා කර තිබෙනවා. වරක් බුදුරජාණන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වාසය කරන කාලයක සන්දක නම් පිරිවැජියා පළොල් ගස්වලින් ගැවසුණු පුලිල නම් ගුහාවෙයි වාසය කළා. ඉතින් දවසක් ආනන්ද හාමුදුරුවෝ ඇතුළු භික්ෂූන් වහන්සේලා පිරිසක් මේ ගුහාව දිසාවට වැඩියා. එහි විශේෂ යක් වූයේ යට ජලය සහිත ගුහාව තුළ ජලය මතුපිට ලැලි අතුරා ඒ මත වාසය කිරීම යි.

ඉතින් මේ පිරිස ඌෂ්ණ කාලයෙහි මෙහි වාසය කරනවා. මේ හාමුදුරුවරු පිරිස වැඩියේ මෙම අසිරිමත් ගුහාව නැරඹීමට යි. ඒ ස්ථානයට ළඟා වූ මේ භික්ෂු පිරිසට අසන්නට ලැබුණේ මහත් ඝෝෂා සහිත කටහඬවල්. ඉතින් මේ සන්දක පිරිවැජියා තම පිරිස සමඟ කතාබස් කරමින් සිටියේ මහත් වූ පිළිකුල් සහගත තිරිසන් කතාබස්. මුළු පරිසරය ම මේ කතාබස් නිසා දූෂණය වෙලා. මේවාට කියනවා දෙතිස්තිර්යක් කථා කියලා. සවස් කාලයෙහි හැමදාම ත් කතාබස් කරනවිට ඔවුන් තෙපළන්නේ මේ අදැහැමි කතා. මේවා රාජකථා, චෝර කථා, මහාමත්ත කථා, සේනා කථා, හාස කථා, යුද්ධ කථා, අන්න කථා ආදි වශයෙන් 32 ක් වෙනවා. ඇත්තෙන් ම අද වුවත් නිකරුණේ කාලය ගත කරන බොහෝ අනුවණ උදවිය කල් යවන්නේ මෙවැනි කතාබස් කරමින් තමා. ඒ වා වර්ග කරලා බැලුවොත් මේ 32 ට අයත් වෙනවා. ඉතින් මෙවැනි අමනෝඥ තිරිසන් කතාබස් කරමින් සිටිය මේ පිරිවැජියා ඇතුළු පන්සියයක් පිරිස ආනන්ද හාමුදුරුවෝ ඇතුළු මේ ආගන්තුක භික්ෂු පිරිස දුටු විගස ම සන්දක පිරිවැජියා වහා ම තම ඝෝෂාකාරි ව සිටි පිරිස සන්සුන් කරවා, මෙසේ ප්‍රකාශ කළා.

"ඇවැත්නි, වහා සන්සුන් වෙව්. අර එන්නේ ශ්‍රමණ භවත් ගෞතම ගේ ශ්‍රාවකයන් අතර එක් කෙනෙක් වන ආනන්ද නම් භික්ෂුව ඇතුළු ගෝල පිරිසක්. මේ පිරිස නිශ්ශබ්ද බව අගය කරනවා. ඒ පුරුදු ඇති කරලා තිබෙන්නේ ශ්‍රමණභවත් ගෞතම විසින්.

එතුමා නිහඬ බව අගය කරන ශාස්තෘවරයෙක්". ඉතින් මේ නියමයෙන් පසු සියලු දෙනා ම සන්සුන් වී නිහඬ පරිසරයක් එහි ඇති කළා. මේ කරුණින් ප්‍රකට වන්නේ එදා බුදුරජාණන් වහන්සේට ප්‍රතිපක්ෂ දහමක් ලොවට ප්‍රකාශ කරමින්, බුදුරජාණන් වහන්සේ ගේ දහමට නිගා දෙමින්, එය යටපත් කරන්නට ක්‍රියා කළ නොයෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන් පවා උන්වහන්සේ ගේ වගේ ම උන්වහන්සේ ගේ අනුගාමික ශ්‍රාවක පිරිස විසින් ද අනුගමනය කරන මේ නිශ්ශබ්දතාව අතිශයින් අගය කළ බව නේ ද? මේ අනුව සමාජයේ උද්ගත වන බොහෝ ආරවුල් නිරාකරණයට නිශ්ශබ්දතාව අතිශය උපකාරී වෙනවා.

10 පිටුවෙන්...

## පෙර බවයේ මතකය...

එබඳු පෙර භවයක් පිළිබඳ අතීත ස්මරණය නැතිවීමට හේතුව නම්, අප බොහෝ දෙනා ගේ සිත අඳුරු පටලයන්ගෙන් වැසී තිබීම යි. ප්‍රභාෂ්වර හෙවත් සුපිරිසුදු සිත එම අඳුරු පටල මඟින් ආවරණ ව පවත්නා තාක් කල් අතීත පමණක් නොව බොහෝ විට වර්තමානයට අදාළ තොරතුරු පවා ස්මරණය කිරීම අපහසු වී තිබෙන බව අප කාගේත් අත්දැකීම් අනුව ඉතාම පැහැදිලි ලෙස පෙනී යන සත්‍යයකි. එම අඳුරු පටල ස්ථර පහකින් යුතු බවට බුදු දහම විසින් හඳුනා ගනු ලැබ තිබේ. එනම්,

කාමච්ඡන්ද (කාමරාගය, තෘෂ්ණාව), ව්‍යාපාද (ක්‍රෝධය, තරහ) ,ථීනමිද්ධ (අලසකම, අනුද්‍යෝගය),විචිකිච්ඡා (සැකය, අවිශ්වාසය), හා උද්ධච්ච කුක්කුච්ඡ (විපිළිසර බව, අසහනය) යි.

ඇතැම් දිනෙක අහසේ තරු අපට නො පෙනී පවත්නේ තරු නැති වූ නිසා නොව අහස වළාවලින් ආවරණ ව පවත්නා නිසා ය. අප ඉදිරියේ පවත්නා කණ්නාඩියක් දූවිලිවලින් ආවරණ ව, අපිරිසුදු ව පවත්නා තාක් කල් අපේ පිළිබිඹුව ඒ තුළින් දැක්ම උගහට ය. ඒ ආකාරයෙන් ම අපේ සිත ද ඉහත කී කිළිටි කෙලෙස් මඟින් ආවරණය වී පවත්නා බැවින් අපේ අතීත පැවැත්ම පිළිබඳ මතකය ගිලිහී ගොස් තිබේ.

අප ජීවත්වන මේ ලෝකයේ භෞතික පරිසරය සෑහෙන දුරකට අවබෝධ කර ගැනීමට විද්‍යාත්මක ගවේෂණ මහත් පිටුබලයක් ව පැවතුණ ද, ඉතිරි කොටස තේරුම් ගැනීමට එමඟින් ලැබෙන ආධාරය ප්‍රමාණවත් වී නැත. එනිසා ම මේ විෂයයෙහි ලා තීන්දු තීරණ ගැනීමේ දී ආගමික හා සාම්ප්‍රදායික අන්තගාමීත්වයෙන් මිදී ප්‍රඥානුයාත නිරීක්ෂණයට ම ප්‍රමුඛත්වය දිය යුතු ව ඇත.



පහතරට නායක හිමියන් වැඩසිටි පැල්මඩුල්ල රජමහ විහාරය

# ප්‍රාදේශීය නායක පදවි පත් කිරීම

**ප්‍රාදේශීය වශයෙන් විපුලත්වයට පත් සංඝයා වහන්සේලා වෙත රජතුමා විසින් ඒ ඒ පළාත්වල පිහිටි සුවිශේෂී විහාරස්ථානවල අධිපති පදවිය පිරිනැමීම, ගෞරව නාම සම්මුති පිරිනැමීම සහ පළාත් නායක පදවි පිරිනැමීම ද මෙම වකවානුවෙහි සිදු වූ බවට නිදසුන් හමු වෙයි.**

සංඝරාජ හිමියන් ගේ තෘතීය ශිෂ්‍ය වූ ගිනිගත්පිටියේ සංඝරක්ෂිත හිමියෝ සත් කෝරළයේ ප්‍රධාන සංඝ නායක පදවිය පුද ලදහ. සංඝරාජයන් වහන්සේගෙන් පහළ වූ ධර්ම ශාස්ත්‍රාලෝකය සපරගමු, දකුණු සහ බස්නාහිර පළාත්වල ව්‍යාප්ත කරවීමට ප්‍රමුඛතම දායකත්වයක් සැලසූ වේහැල්ලේ ධම්මදින්න හිමියන්ට සාමණේර අවධියේ දී ම ශ්‍රීපාදස්ථානයෙහි නායක පදවියත්, උපසම්පදාවෙන් පසු දකුණු සපරගමු දෙදිසාව ඇතුළුවන සේ පහතරට ප්‍රධාන සංඝ නායක පදවියත්, කතරගම කිරිවෙහෙර නායක පදවියත් පිරිනමා ඇත. වේහැල්ලේ ධම්මදින්න හිමියන් ගේ ශිෂ්‍ය වූ කඹුරුපිටියේ ගුණරතන හිමියන් උපසම්පදාවට පැමිණ රාජ රාජ මහාමාත්‍යාදී ප්‍රභූන් ඉදිරියේ මල්වතු මහා විහාරයීය සංඝ සභාවෙහි දී සඟි ධර්මය ව්‍යක්ත ව දේශනා කළ බැවින්, රජතුමා විසින් සඟිධර යන ගෞරව නාමය පිරිනැමූ බවත්, ඉන් පසු කඹුරුපිටියේ සඟිධර ගුණරතන නමින් ප්‍රකට වූ බවත් සඳහන් වෙයි. වේහැල්ලේ ධම්මදින්න හිමියන්ගෙන් පසු උන්වහන්සේ දැරූ දකුණු සපරගමු පළාත් සහිත පහතරට සංඝ නායක පදවිය ද කඹුරුපිටියේ සඟිධර ගුණරතන හිමියන් වෙත පුද දෙන ලදී. රන්සෑගොඩ ධම්මදස්සි හිමියන් වෙත කීර්ති ශ්‍රී තේජෝවර යන ගෞරව නාමය පිරිනැමූ බව ද සඳහන් වෙයි.

පහතරට ප්‍රකට පඬිවරයකු වූ කරතොට ධර්මාරාම හිමියන් බාරස කාව්‍යය නම් දුෂ්කර කාව්‍ය නිර්මාණය සිදු කිරීම වෙනුවෙන් පල්ලේබැද්ද සංඛපාල විහාරයේ අධිපති පදවිය සහිත ව අක්කර දහතුන් දහසක් නින්දගම් වශයෙන් රජතුමා වෙතින් පුද ලැබ ඇත. ශ්‍රී පාදස්ථානාධිපති පදවියත්, පහතරට නායක පදවියත් හෙබ වූ ධර්මාරාම හිමිපාණෝ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ ලන්දේසි සහ ඉංග්‍රීසි පාලකයන්ගෙන් ද සම්භාවනාවට පත් වූ හ. රාජාධි රාජසිංහ රජතුමා පිරිනැමූ නායක පදවියේ සියලු බලතල තමන් යටතෙහි වූ මුහුදුබඩ ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමට

පහතරට ප්‍රකට පඬිවරයකු වූ කරතොට ධර්මාරාම හිමියන් බාරස කාව්‍යය නම් දුෂ්කර කාව්‍ය නිර්මාණය සිදු කිරීම වෙනුවෙන් පල්ලේබැද්ද සංඛපාල විහාරයේ අධිපති පදවිය සහිත ව අක්කර දහතුන් දහසක් නින්දගම් වශයෙන් රජතුමා වෙතින් පුද ලැබ ඇත.

හැකිවන ලෙසින් අක්තපත්‍රයක් නිකුත් කළ විල් හෙලම් ජේකොබ් වැන්දගාෆ් ඕලන්ද ආණ්ඩුකාරවරයා පදවියට වැටුප් වශයෙන් මාස්පතා පතාග 37 ක වැටුපක් ගෙවීමට කටයුතු කළේ ය. ඉංග්‍රීසි ආණ්ඩුකාර පදවිය දැරී රොබට් බ්‍රවුන්රිග් විසින් ජෝන් ඩොයිලි මාතර දිසාපති ධූරය දැරූ සමයෙහි කරතොට ධම්මාරාම නාහිමියන් කොළඹට කැඳවා නායක පදවි පිළිබඳ තොරතුරු අසා, ඒ වෙනුවෙන් උන්වහන්සේ වෙත අක්තපත්‍රයක් සහ මාසික ව පතාග 37 බැගින් පිරිනැමීමට කටයුතු යෙදී ය.

නායක පදවි ලද හිමිවරුන් වෙත භික්ෂූන් වහන්සේ ගේ නායකත්වය, තීන්දු තීරණ ගැනීමේ බලය, ශාසනික විනයකර්මවල දී නායකත්වය, ප්‍රාදේශීය සංඝයා වහන්සේ ගේ අවශ්‍යතාවල දී ස්වකීය සංඝ මූලස්ථාන සහ රජය අතර සම්බන්ධතා පැවැත්වීමේ අතරමැදියා ලෙසින් ක්‍රියා කිරීම වැනි කටයුතු පැවරුණු බව සිතීමට පුළුවන.

රජයෙන් නායක පදවි පත් කළ වකවානුවේ නායක පදවිය හොබවන නාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ධර්මධර, විනයධර සංඝ සභාවකින් විහාරස්ථාන ආශ්‍රිත නඩු විසඳු තීන්දුව දී එය ක්‍රියාත්මක කරවීමට ප්‍රදේශය භාර මුදලිවරයා හෝ නිළමේවරයාට නියම කර යැවූ සාධක හමු වෙයි. වර්ෂ 1799දී ඕගස්ජේ විහාරය, වර්ෂ 1800 දික්වැල්ලේ තැනුම්පොත විහාරය, වර්ෂ 1800 ගොඩකන්දේ විහාරය, වර්ෂ 1818 කුරුඹුරේ විහාරය සහ නැවත 1821 ගොඩකන්දේ විහාරය පිළිබඳ පැන නැඟි ගැටලු මෙහි දැක්වූ අන්දමට විසඳ ඇත.

සංඝාධිකරණ තීන්දු නොපිළිගත් අවස්ථාවල දී මල්වතු විහාරයට අභියාචනා කිරීමට හැකියාව පැවතුණි. පහතරට ප්‍රධාන සංඝනායක පදවිය හෙබවූ අගලකඩ ධම්මරක්ඛිත හිමියන් මුල් වී විසඳූ ආරවුල් දෙකක් වූ හකුරුවෙල විහාරය පිළිබඳ නඩුව වෙනුවෙන් කිරිනැලියේ රතනජෝති හිමියන් ද, උනන විහාරයේ නඩුව ඕවිලානේ සුවණ්ණජෝති හිමියන් ද, මල්වතු විහාරය වෙත අභියාචනා කොට තිබේ. මූලස්ථානය වූ මල්වතු විහාරයේ තීරණය අවසාන තීරණය වශයෙන් සැලකිණි.

නායකකම් පිරිනැමීම කට වචනයෙන් සිදු වූවක්



කරතොට ධම්මාරාම නාහිමි



වේහැල්ලේ ධම්මදින්න නාහිමි

විනා සන්නසක් හෝ ඔප්පු පිරිනැමීමක් නොවූ බව කරතොට ධර්මාරාම හිමියන් විසින් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාට පැවසූ බව සඳහන් වෙයි. පළාතේ නායකකම් වාචෝද්ගත ව පිරිනැමූව ද, විහාර නායකකම් පිරිනැමීම සඳහා සන්නස් පත්‍ර පිරිනැමූ බවට සාධක හමු වෙයි. රජතුමා විසින් මෙලෙස සම්භාවනාවට ලක් කළ හිමිවරුන් වෙත ඇත් දළ මිට සහිත විජිනිපත්, ලෝහ සහ ඇත් දළවලින් කළ බුදු පිළිම, ධාතු කරඬු, දහම් පොත්, වටිනා සළු පිළි සහ සිවුරු, ඇත් දළ යුවළ ඇතුළු පූජා භාණ්ඩ පුද කොට ඇත.

වර්තමානයේ භාවිත වන බෞද්ධ කොඩිය සම්මත කොට නොතිබුණු සිංහල රජ යුගයේ කරතොට ධම්මාරාම නාහිමියන්ට රජතුමා පිරිනැමූ මාතර වටගෙදර රජමහා විහාරයේ දක්නට ලැබුණු ලියවැලක් අතින් ගත් සිංහයකු සිටින කොඩිය නායක පදවියට සංකේතයක් වශයෙන් පිරිනැමූවක් ලෙස වියතුන් අනුමාන කරයි. නායක පදවියකින් පුද ලද හිමි නමක් ගමට වඩින විට එම ගමෙහි නායකත්වය හෙබවූ මුලාදෑනියන් කොඩි, සිංගාරම් සහිත ව පෙරහරින් ගොස් නාහිමියන් පිළිගෙන ගමට වැඩමවීම එවක භාවිතා වූ සම්ප්‍රදාය විය.

ඒ පළාතෙහි නායක පදවි ලද හිමිවරුන් වෙත තත් පළාත්වල භික්ෂූන් වහන්සේලා ගේ නායකත්වය, තීන්දු තීරණ ගැනීමේ බලය, ශාසනික විනයකර්මවල දී නායකත්වය, ප්‍රාදේශීය සංඝයා වහන්සේලා ගේ අවශ්‍යතාවල දී ස්වකීය සංඝ මූලස්ථාන සහ රජය අතර සම්බන්ධතා පැවැත්වීමේ අතරමැදියා ලෙසින් ක්‍රියා කිරීම වැනි කටයුතු පැවරුණු බව සිතීමට පුළුවන. වර්තමානය වන විට සාමණේර සහතික, උපසම්පදා නිර්දේශ ලිපි, විහාරාධිපති ධුර සහ නායක පදවි සඳහා නිර්දේශ කිරීම්, භික්ෂූන් වහන්සේ විදේශගත වීමේ කටයුතු වැනි කටයුතු සඳහා නිර්දේශ කිරීම ඇතුළු වගකීම් සමුදායක් ප්‍රාදේශීය නායක හිමිවරුන් වෙත පැවරී ඇත.

දිමුතු පුන්සර කොළඹගේ

වර්ෂ 2021 ක් වු සැප්තැම්බර් 20 සඳුද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ප්‍රසිද්ධ කරන ලදී.